# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයවුම් වලට අදාළ 1992 ප්‍රධාන නීති අණපනත්


පිටුව

1. 1992 අංක 10 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත — I

2. 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත — IX

3. 1992 අංක 14 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත — XXI

4. 1992 අංක 16 දරන බ්‍රෙට්න්වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත — XXIII

5. 1992 අංක 22 දරන මුදල් (සංශෝධන) පනත — XXIV

6. 1992 අංක 30 දරන බදු සමා (නිවාස සහ වාණිජ ගොඩනැගිලි) පනත — XXV

7. 1992 අංක 31 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත — XXXII

8. 1992 අංක 32 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත — XXXIV

9. 1992 අංක 35 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත — XXXVII

10. 1992 අංක 36 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත — XXXVIII

11. 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත — XLI

12. 1992 අංක 49 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත — XLVI

13. 1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීම් (සංශෝධන) පනත — XLIX

14. 1992 අංක 63 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත — L

15. 1992 අංක 66 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත — LXXV

16. 1992 අංක 67 දරන විසර්ජන පනත — LXXVI

නියෝග

1. මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා මහජන ආරක්ෂක පනත යටතේ පනවන ලද නියෝග. — LXXIX

2. 1992 අංක 1 දරන හදිසි අවස්ථා (මුදල් නීති) නියෝග. — LXXXI

# 1992 අංක 10 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 06 වන දින)

**1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත සංශෝධනය කිරීම සඳහා පනතකි.**

**1.** මේ පනත 1992 අංක 10 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනතේ 5 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "මධ්‍යම කාල හා දීර්ඝ කාල ණය" යන වචන වෙනුවට "ණය" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ-

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "කවර වූ හෝ ව්‍යවසායකට ණය සහ අත්තිකාරම් දීම" යන වචන වෙනුවට, "කවර වූ හෝ ව්‍යවසායකට ඇපයක් ඇතිව හෝ නැතිව ණය සහ අත්තිකාරම් දීම" යන වචන ආදේශ කිරීමෙන්:

(2) ඒ වගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්-

"(ඔඔ) භාරගැනීම යෝග්‍ය සේ පෙනෙන යම් භාරයක් භාරගෙන ක්‍රියාත්මක කිරීම,"

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි (ඇ) ඡේදයේ "අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම" යන වචන වෙනුවට, "අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම හා එහි නිලධරයන්ගේ සහ සේවක යන්ගේ ප්‍රතිලාභය පිණිස විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ ඒ අරමුදලට හෝ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීම" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"අධ්‍යක්ෂ මණ්ඩලය"

8. (1) නම් කරනු ලැබූ සහ තෝරා පත්කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයන්ගෙන් සමන්විත සාමාජිකයන් පස් දෙනෙකුට නොඅඩු වූද සාමාජිකයන් දහදෙනෙකු නොඉක්මවන්නා වූ ද අධ්‍යක්ෂ මණ්ඩලයක් බැංකුවෙහි විය යුතුය. එම අධ්‍යක්ෂවරයන් අවස්ථාවෝචිත පරිදි 8අ හෝ 8ආ වගන්ති යටතේ නම් කරන ලද හෝ තෝරා පත්කර ගන්නා ලද තැනැත්තන් විය යුතුය.

(2) සාමාන්‍යධිකාරිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දය දීමේ අයිතිවාසිකම නොමැතිව, නිල බලයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු විය යුතුය."

**6.** 8 වන වගන්තියට ඉක්බිතිවම, මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර ඒ වගින්ති, ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ, 8ආ සහ 8ඇ වගන්ති ලෙස බලපැවැත්විය යුතුය:-

"නම් කළ අධ්‍යක්ෂවරු"

8අ. (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් අමාත්‍යවරයා විසින් පහත සඳහන් තැනැත්තන් නම් කළ යුතුය:-

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ මහ බැංකුව හෝ දෙපාර්ශ්වයම එක්ව හෝ බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට විසිපහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරන්නාවූ අවස්ථාවක, එක් තැනැත්තකු ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු වන පරිදි තැනැත්තන් තුන්දෙනෙක්,

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ මහ බැංකුව හෝ දෙපාර්ශවයම එක්ව හෝ බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට විසි පහකට අඩු ප්‍රමාණයක් දරන්නා වූ අවස්ථාවක, එක් තැනැත්තකු ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු වන පරිදි තැනැත්තන් දෙදෙනෙක්.

මේ උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තකු, මෙහි මින්මතු "නම් කළ අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) නම් කළ අධ්‍යක්ෂවරයකු අවුරුදු හතරක කාල සීමාවක් ධූරය දැරිය යුතුය:

එසේ වුවද (1) වන උපවගන්තිය යටතේ එම තැනැත්තන් අධ්‍යක්ෂවරයන් ලෙස නම් කරනු ලැබීමෙන් පසු ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ මහ බැංකුව හෝ දෙපාර්ශවයම එක්ව හෝ දරන ලද කොටස්වල ප්‍රතිශතය, තෝරා පත් කළ අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව වැඩි කිරීමක් අවශ්‍ය වන ප්‍රමාණයකට අඩු වුවහොත් අවස්ථාවෝචිත පරිදි නම් කළ අධ්‍යක්ෂ වරයන් එක් කෙනෙකුගෙන් හෝ දෙදෙනකුගෙන් ධූරයෙන් ඉල්ලා අස් වන ලෙස අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිය යුතුය. තවද, අවස්ථාවෝචිත පරිදි ඒ අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයන් ධූරයෙන් ඉල්ලා අස්වීම පැහැර හැරියහොත් අමාත්‍යවරයා විසින් ඒ අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයන් ධූරයෙන් ඉවත් කළ යුතුය.

(3) නම් කළ අධ්‍යක්ෂවරයකු, අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) නම් කළ අධ්‍යක්ෂවරයකු විසින් තත් කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(5) නම් කළ අධ්‍යක්ෂවරයකුට, රෝගාතුර වීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ හේතුවෙන්, තම ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහුගේ විකල්ප අධ්‍යක්ෂරයා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් වලදී ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් නම් කළ හැකි අතර එසේ නම් කරනු ලැබූ තැනැත්තාට ඒ රැස්වීම්වලදී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

(6) නම් කළ අධ්‍යක්ෂවරයකු (2) වන උප වගන්තියේ අතුරු වගන්තිය යටතේ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හැර මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධූරය හිස් කල විට, ඒ පුරප්පාඩුව සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු නම් කළ යුතුය. එසේ නම් කරන ලද තැනැත්තා අනුප්‍රාප්ත වන්නේ යම් අධ්‍යක්ෂවරයකු වෙනුවෙන්ද ඒ අධ්‍යක්ෂවරයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ඔහු ධූරය දැරිය යුතු ය.

8ආ. (1) මණ්ඩලයේ තෝරා පත්කර ගන්නා අධ්‍යක්ෂවරයන් බැංකුවේ කොටස්කරුවන් (ශ්‍රී ලංකා ආණ්ඩුවේ සහ මහ බැංකුව හැර) විසින් බැංකුවේ කොටස්කරුවන්ගේ සෑම වාර්ෂික මහ සභා රැස්වීමකදීම. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ මහ බැංකුව හැර අනෙකුත් තැනැත්තන් විසින් දරනු ලබන බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සෑම සියයට දහයකටම එක් සාමාජිකයකු බැගින් වන පදනම මත තෝරා පත් කර ගත යුතු අතර කෙසේ වුව ද, එසේ තෝරා පත්කර ගන්නා අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව, 8 වන වගන්තිය යටතේ සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව සහ 8අ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නම් කළ හැකි අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව අතර වෙනස නොඉක්මවිය යුතුය.

නිදර්ශනය

(ආණ්ඩුව සහ මහ බැංකුව හැර) කොටස්කරුවන්ට අයත්, බැංකුවේ නිකුත් කල මුළු කොටස් ප්‍රාග්ධනයෙන් ප්‍රතිශතය සියයට හතළිහක් නම්, ඒ කොටස්කරුවන්ට සාමාජිකයන් හතර දෙනෙකු තෝරා පත්කර ගැනීමට හිමිකම් ඇත්තේ ය.

(2) (ශ්‍රී ලංකා ආණ්ඩුව හා මහ බැංකුව හැර) බැංකුවේ කොටස්කරුවන් විසින් කොටස්කරුවන් පස් දෙනකුගේ හෝ ඊට වැඩි සංඛ්‍යාවකගේ ඉල්ලීම පිට සභාපතිවරයා විසින් කැඳවනු ලබන ඒ කොටස්කරුවන්ගේ රැස්වීමක දී තෝරාපත් කර ගත් අධ්‍යක්ෂවරයකු ධූරයෙන් ඉවත් කොට ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් අධ්‍යක්ෂවරයකු තෝරා පත්කර ගනු ලැබිය හැකිය.

(3) තෝරාපත් කරගත් අධ්‍යක්ෂවරයකු විසින් තත් කාර්යය සඳහා සභාපතිවරයා අමතා යවන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(4) තෝරාපත්කර ගත් අධ්‍යක්ෂවරයකු රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ හේතුවෙන් ඔහුගේ ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහුගේ විකල්ප අධ්‍යක්ෂවරයා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලදී ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු, අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ඒ අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ තනැත්තාට, ඒ රැස්වීම්වලදී ඡන්දය දීමේ අයිතිවාසිකම තිබිය යුතුය.

(5) තෝරා පත්කර ගත් අධ්‍යක්ෂවරයකු මියයාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ධූරය හිස් වුවහොත් එවිට ද, තෝරාපත්කර ගන්නා අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ මහ බැංකුව හැර) කොටස්කරුවන් දරන කොටස් ප්‍රමාණයෙහි වැඩිවීමක ප්‍රතිඵලයක් වශයෙන් වැඩි කරනු ලැබුවහොත් එවිටද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඒ පුරප්පාඩුව සඳහා වෙනත් තැනැත්තකු පත් කළ හැකි අතර එසේ පත් කරනු ලැබූ තැනැත්තා, ඒ පුරප්පාඩුව ඇතිවීමෙන් පසුව පැවැත්වෙන බැංකුවේ පළමු වාර්ෂික මහ සභා රැස්වීම තෙක් ධූරය දැරිය යුතුය. ඒ තැනැත්තා ඒ රැස්වීමේ දී අධ්‍යක්ෂවරයකු ලෙස නැවත තෝරපත් කර ගනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතුය.

(6) තෝරා පත් ගත් අධ්‍යක්ෂවරයන් ගෙන් තුනෙන් එකක් හෝ තෝරාපත් කර ගත් අධ්‍යක්ෂවරයන්ග් සංඛ්‍යාව තුනක් හෝ තුනෙහි ගුණිතයක් හෝ නොවේ නම් ඒ සංඛ්‍යාවෙන් තුනෙන් එකකට ආසන්නතම සංඛ්‍යාව හෝ බැංකුවේ කොටස්කරුවන්ග් සෑම වාර්ෂික මහ සභා රැස්වීමක දීම, ධූරයෙන් ඉවත් විය යුතු අතර. අවස්ථාවෝචිත පරිදි ඒ පුරප්පාඩුව හෝ පරප්පාඩු නොපිරවීමට, (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ මහ බැංකුව හැර) කොටස්කරුවන් විසින් ප්‍රකාශිතව යෝජනා සම්මතයක් කර ඇත්නම් හෝ අවස්ථාවෝචිත පරිදි, ධූරයෙන් ඉවත් වන ඒ තෝරාපත් කර ගත් අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයන් නැවත තෝර පත්කර ගැනීම සඳහා වූ යෝජනාවක් ඒ අනෙකුත් කොටස්කරුවන්ට ඒ රැස්වීමේ දී ඉදිරිපත් කරනු ලැබ පරාජයට පත්වී ඇත්නම් හෝ ඒ පුරප්පාඩුව පිරවීම අවශ්‍ය වීමට තරම් ඒ රැස්වීමට පෙරාතුවම දිනයේ දී (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ මහ බැංකුව හැර) කොටස්කරුවන් දරන කොටස් ප්‍රමාණය ප්‍රමාණවත් නොවේ නම් මිස, අවස්ථාවෝචිත පරිදි ඒ පුරප්පාඩුව හෝ, පුරප්පාඩු පිරවීම සඳහා අලුත් සාමාජිකයන් තෝරා පත් කර ගත යුතුය.

(7) (6) වන උපවගන්තිය යටතේ ධූරයෙන් ඉවත් විය යුත්තේ ඒ වගන්තියේ සඳහන් වාර්ෂික මහ සභා රැස්වීමේ දිනය වන විට, වඩාම දීර්ඝ කාලයක් ධූරය දරා තිබෙන අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයන් වන නමුත් ඒ දිනය වන විට සමාන කාලසීමාවක් සේවය කර තිබෙන අධ්‍යක්ෂවරයන් අතරෙහි එසේ ධූරයෙන් ඉවත් වීමක් සිදුවිය යුතු අවස්ථාවක ධූරයෙන් ඉවත් විය යුතු අධ්‍යක්ෂවරයා නිශ්චය කිරීම රැස්වීමේ සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් කළ යුතුය.

(8) ධූරයෙන් ඉවත්වන තෝරාපත් කර ගත් අධ්‍යක්ෂවරයකු නැවත තෝරපත් කර ගැනීම සඳහා සුදුසු විය යුතුය.

8ඇ. (1) මේ වගන්තිය බලාත්මක වන දිනයෙන් පසුව පැවැත්වෙන බැංකුවේ කොටස්කරුවන්ගේ පළමුවන වාර්ෂික මහා සභා රැස්වීමේ දී, (මේ වගන්තියේ

ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය

"ප්‍රථම මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක්, 8අ වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 8ආ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන ආකාරයට සංස්ථාපනය කරනු ලැබිය යුතුය.

(2) ප්‍රථම මණ්ඩලයේ තෝරා පත් කර ගත් සාමාජිකයන්, (1) වන උපවගන්තියේ සඳහන් බැංකුවේ කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසුව ඊළඟට පැවැත්වෙන බැංකුවේ කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමේ දිනය තෙක් ධූර දැරිය යුතුය.

(3) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධූර හිස් කිරීම සහ මණ්ඩලයේ සාමාජිකයකු තාවකාලිකව නොපැමිණ සිටීම සම්බන්ධයෙන් 8අ සහ 8ආ වගන්තිවල විධිවිධාන, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ප්‍රථම මණ්ඩලයේ සාමාජිකයන් කෙරෙහි හා ඔවුන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය."

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ "අමාත්‍යාවරයා විසින් තීරණය කරනු ලබන පරිදි" යන වචන වෙනුවට "වරින් වර, බැංකුවේ කොටස් හිමියන්ගේ යම් වාර්ෂික මහා සභා රැස්වීමකදී, ඒ කොටස් හිමියන් විසින් තීරණය කරනු ලබන පරිදි" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තමන් අතුරෙන් සභාපතිවරයෙකු තෝරාපත් කර ගත යුතුය."

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "පත් කිරීමේ දිනයෙන්" යන වචන වෙනුවට "තෝරා පත් කර ගත් දිනයෙන්" යන වචන ආදේශ කිරීමෙන්,

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "වෙනත් තැනැත්තකු පත් කළ යුතුය" යන වචන වෙනුවට "වෙනනත් තැනැත්තකු තෝරා පත්කර ගත යුතුය." යන වචන ආදේශ කිරීමෙන්,

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතුය." යන වචන වෙනුවට "නැවත තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සකු විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්,

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "සාමාන්‍යාධිකාරිවරයා හෝ වැඩබලන සාමාන්‍යාධිකාරිවරයා සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට අත්සන් නොතැබිය යුතු අතර, තමන් සිටි බවට ලකුණක් වශයෙන් ඒ සියලුදෙනාම" යන වචන වෙනුවට "සාමාන්‍යාධිකාරි වරයා හෝ වැඩබලන සාමාන්‍යාධිකාරිවරයා සහ එක් අධ්‍යෂක්වරයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට අත්සන් නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ දෙදෙනාම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"බැංකුවේ ප්‍රාග්ධනය

21. (1) බැංකුවේ බලයලත් ප්‍රාග්ධනය රුපියල් මිලියන දෙදහසක් විය යුතු අතර එය රුපියල් දහය බැගින් වූ කොටස් මිලියන දෙසියයකට බෙදනු ලැබිය යුතුය.

(2) 22 වන වගන්තිය යටතේ වෙන් කරනු නොලැබ ඇත්තා වූ (1) වන උපවගන්තියේ සඳහන් කොටස්වලින් යම් කොටස් ප්‍රමාණයක් මණ්ඩලය විසින් තීරනය කරනු ලබන යම් අවස්ථාවකදී හෝ අවස්ථාවලදී යම්

මුදලකට හෝ මුදල් වලට සහ යම් ආකාරයකින් දායකවීම සඳහා බැංකුව විසින් මහජනයා වෙත ඉදිරිපත් කළ හැකිය. තවද, ඒ කොටස් වෙනුවෙන් ගෙවීම කරනු ලැබූ විට 22 වන වගන්තියේ 2(ආ) උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ කොටස් පිළිවෙලින් වූ ගැනුම්කරුවන් වෙත වෙන් කර දිය යුතුය.'

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

'(2) (අ) බැංකුවෙහි ඇති තමන්ගේ සියලු කොටස් හෝ ඉන් කිසිවක් විකිණීමට,

(ආ) බැංකුවෙහි ඇති තමන්ගේ සියලු කොටස් හෝ ඉන් කිසිවක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, බැංකුව විසින් නිකුත් කරන ලද බැඳුම්කරවලට, ණය පත්‍ර වලට හෝ 'වරණීය කොටස්වලට අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව පරිවර්තනය කිරීමට

(1) වන උපවගන්තියෙහි සඳහන් කොටස්කරුන්ට බලය ඇත්තේ ය.'

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත් දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

'(2අ) (1) වන උපවගන්තියේ (ආ). (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් කොටස්කරුවන්ගෙන් යම් කොටස් කරුවකු විසින් බැංකුව වෙත නිකුත් කරන ලද යම් පොරොන්දු නෝට්ටුවක්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවලංගු කළහැකිය. තවද එසේ අවලංගු කරනු ලැබූ විට. අවලංගු කරනු ලැබූ පොරොන්දු. නෝට්ටුවල වටිනාකමෙහි ප්‍රමාණයට බැංකු වෙහි නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය අඩු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(2ආ) (අ) බැංකුවේ මුළු නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩි ප්‍රමාණයක් යම් සමාගමක්, සංස්ථාගත මණ්ඩලයක් හෝ පුද්ගලයකුට අයත්වීම යම් වෙන්කර දීමක හෝ ලියාපදිංචි කිරීමක හා ප්‍රතිඵලය වන්නේ නම්, ඒ සමාගමෙහි, සංස්ථාගත මණ්ඩලයෙහි හෝ පුද්ගලයාගේ නාමයෙන්,

(ආ) ඒ වෙන්කර දීමෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ඒ සමාගම සහ (i) වන, (ii) වන (iii) සහ (iv) වන අනුඡේදවල සඳහන් තැනැත්තන්ගෙන් එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි දෙනකු එකතුව බැංකුවේ මුළු නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩියෙන් අයත් කර ගැනීම ප්‍රතිඵලය වන්නේ නම්, සමාගමක සහ පහත දැක්වෙන ඒවායින් යම් එකක හෝ වැඩි ගණනක-

(i) එහි යම් පාලිත සමාගමක,

(ii) එහි පාලක සමාගමක,

(iii) එහි පාලක සමාගමක පාලිත සමාගමක, හෝ

(iv) ඒ සමාගම හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගමක හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති සමාගමක නාමයෙන්,

(ඇ) ඒ වෙන්කර දීමෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ඒ පුද්ගලයා සහ (i) වන, (ii) වන, (iii) වන, (iv) වන, (v) වන, (vi) වන සහ (vii) වන අනුඡේදවල සඳහන් තැනැත්තන්ගෙන් එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩිදෙනකු බැංකුවේ මුළු නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩියෙන් අත්කර ගැනීම ප්‍රතිඵලය වන්නේ නම් පුද්ගලයකුගේ සහ පහත දැක්වෙන ඒවායින් යම් එකක හෝ වැඩි ගණනක එනම්:-

(i) තමාගේ කිට්ටු ඥාතීන්ගේ නාමයෙන්,

(ii) තමාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තාවූ හෝ තමාගේ කිට්ටු ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක නාමයෙන්,

(iii) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක පාලිත සමාගමක නාමයෙන්,

(iv) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක පාලක සමාගමක නාමයෙන්,

(v) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක පාලක සමාගමක පාලිත සමාගමක නාමයෙන්,

(vi) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක හෝ එහි පාලිත සමාගමක හෝ එහි පාලක සමාගමක හෝ පාලක සමාගමේ පාලිත සමාගමක සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක නාමයෙන්, හෝ

(vii) ඒ පුද්ගලයාට හෝ ඒ පුද්ගලයාගේ කිට්ටු ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක් නොවන සංස්ථාගත මණ්ඩලයක නාමයෙන්,

බැංකුව විසින්, 21 වන වගන්තියේ (2) උපවගන්තිය යටතේ කොටස් කිසිවක් වෙන්කර දීම හෝ කොටස් කිසිවක් ලියාපදිංචි කිරීම හෝ නොකළ යුතුය.

මේ උපවගන්තියේ අර්ථානුකූලව සමාගමකට හෝ පුද්ගලයකුට යම් සමාගමක හෝ සමාගමක් නොවන සංස්ථාගත මණ්ඩලයක සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තේ යයි සලකනු ලැබිය යුත්තේ, අවස්ථාවෝචිත පරිදි එම සමාගමේ හෝ සංස්ථාගත මණ්ඩලයේ කොටස්වලින් පනස් එකකට වැඩි කොටස් ප්‍රමාණයක් ඉහත සඳහන් සමාගමට හෝ පුද්ගලයාට අයත් අවස්ථාවක දීය.

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "මේ වගන්තියේ හෝ 57 වන වගන්තියේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "21 වන වගන්තියේ හෝ මේ වගන්තියේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්, සහ

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

(5) (2ආ) උපවගන්තියේ කාර්ය සඳහා-

"කිට්ටු ඥාතියා" යන්නෙන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට ඒ තැනැත්තාගේ දෙමාපියකු අඹු/සැමි හෝ දරුවකු හෝ ඒ තැනැත්තාගේ දරුවකුගේ අඹු/සැමි අදහස් වේ,

"පාලිත සමාගම" යන්නෙහි 1988 අංක 30 දරන බැංකු පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය."

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් ව තිබුණද බැංකුව සහ යම් බලපත්‍ර ලත් වාණිජ බැංකුවක් අතර අන්‍යොන්‍ය වශයෙන් එකඟ වන යම් නියමයන් සහ කොන්දේසි මත බැංකුව විසින් ඒ බලපත්‍රලත් වාණිජ බැංකුවෙන් කලින් කල මුදල් ප්‍රමාණයන් ණයට ගනු ලැබිය හැකිය"

(2) මේ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:-

"මේ වගන්තියේ කාර්ය සඳහා "බලපත්‍රලත් වාණිජ බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍ර ලත් වාණිජ බැංකුවක් අදහස් වේ.", සහ

(3) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"මහ බැංකුවෙන් සහ බලපත්‍ර ලත් වාණිජ බැංකුවලින් තාවකාලික ලෙස ණය ගැනීම."

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 66අ සහ 66ආ වගන්ති වශයෙන් බලසහිත විය යුතුයː-

බැංකුව සාක්ෂි ආඥාපණතේ අර්ථානුකූලව බැංකුවක් ලෙස සැලකිය යුතු බව

66අ. බැංකුව විසින්, ඉල්ලුවිට තැන්පතු භාරගනු නොලැබුවද බැංකුව සාක්ෂි ආඥාපනතේ VI වන පරිච්ඡේදයේ අර්ථානුකූලව බැංකුවක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ පරිච්ඡේදයේ විධි විධාන බැංකුවට සහ බැංකුව සම්බන්ධයෙන් අදාළ විය යුතුය

වාර්ෂික මහා සභා රැස්වීම

66ආ. එක් එක් මුදල් වර්ෂයේ අවසානයට පසු මාස නවයක් ඇතුළත බැංකුවේ කොටස්කරුවන්ගේ මහා සභා රැස්වීමක් පවත්වනු ලැබිය යුතු අතර, එම රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාව සහ ගිණුම් සැලකිල්ලට භාජනය කොට ලාභාංශ ප්‍රකාශ කිරීම් සම්බන්ධයෙන් තීරණ ගත යුතුය. වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ ආකාරය සහ ඒ රැස්වීමේ දී කටයුතු කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය නියම කරනු ලැබූ පරිදි විය යුතුය. වාර්ෂික මහා සභා රැස්වීමේ දිනයට ඉහතින් ම වූ දිනයෙහි බැංකුවේ කොටස් හිමිකම් අනුව සෑම වාර්ෂික මහා සභා රැස්වීමකදීම අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයන් තෝරා පත්කර ගැනීම කරනු ලැබිය යුතුය."

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය මෙයන් ඉවත් කරනු ලැබේ.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේː-

(1) ඒ උපලේඛනයේ "අ" ආකෘතියේ "................ ක්‍රි.ව...........මස.........වන දින" යන වචන සිට "කොළඹ දී දෙන ලදී." යන වචන තෙක් වූ සියලු වචන අත්හැරීමෙන්, සහ

(2) ඒ උපලේඛනයේ "ආ" ආකෘතියේ "..........ක්‍රි.ව.........මස..............වන දින", යන වචන සිට "කොළඹ දී දෙන ලදී." යන වචන තෙක් වූ සියලු වචන අත් හැරීමෙන්.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණද මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුව වූ දිනයෙහි ධූර දරන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් මේ පනත ආරම්භ වීමේ දිනයට පසුව පවත්වනු ලබන බැංකුවේ කොටස්කරුවන්ගේ පළමු වන වාර්ෂික මහ සභා රැස්වීමේ දින සිට ධූර දැරීම අවසන් විය යුතුය.

19. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

# 1992 අංක 11 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 6 වන දින)

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූකාර සමිති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1992 අංක 11 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු ප්‍රධාන පඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු පනතේ දීර්ඝ නාමයේ "පිහිටුවීමට හා පාලනයට අදාළ" යන වචන වෙනුවට "පිහිටුවීමට සහ පරිපාලනය කිරීමට අදාළ" යන වචන ආදේශ කිරීමෙන් එකී දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ:-

3. මෙහි මින්මතු ඇතුළත් කරනු ලබන විධි විධානවලට යටත්ව-

(අ) ස්වකීය සාමාජිකයන්ගේ ආර්ථික, අධ්‍යාපනික සමාජයීය සහ සංස්කෘතික සුභ සාධනයට හේතුවන නිශ්චිත සේවාවන් සමූපකාර ප්‍රතිපත්තිවලට අනුකූලව සැලසීම ස්වකීය අරමුණ වශයෙන් ඇත්තා වූ සමිතියක්,

(ආ) (අ) වන ඡේදයෙහි සඳහන් සමිතිවල ක්‍රියාකාරීත්වය පහසු කිරීමේ අරමුණ ඇතිව පිහිටුවන ලද ස්වකීය සාමාජිකයන් වශයෙන් ලියාපදිංචි සමිතිවලින් සමන්විත සමිතියක්

සීමාසහිත වගකීමක් සහිතව හෝ රහිතව පනත යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකිය,

එසේ වුවද ලියාපදිංචි සමිතියක සාමාජිකයකු වන්නාවූ සමිතියක වගකීම සීමාසහිත වන්නේය"

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

(අ) සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත අවස්ථාවක සාමාජිකත්වය වයස අවුරුදු දහඅටට වැඩි වූද, සමිතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටින්නා වූ හෝ සේවයෙහි නියුක්තව සිටින්නා වූ හෝ නිශ්චල දේපළ අයත්ව සිටින්නා වූ ද සමිතිය විසින් ඉටු කරනු ලබන සේවාවන් උපයෝගි කිරීමේ ශක්තතාවය ඇත්තා වූ ද සාමාජිකයන් යටත් පිරිසෙයින් දස දෙනෙකු ගෙන්වත් සමන්විත නොවන්නේ නම්, හෝ

(ආ) ලියාපදිංචි සමිතිවලින් පමණක් එය සමන්විත වන්න් නම් සහ යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනෙක්වත් ඊට නොමැති නම්,

(ඇ) (i) සමිතිය විසින් නිරතවීමට යෝජනා කරනු ලබන කටයුතු ආර්ථික වශයෙන් යෝග්‍ය බවට,

(ii) සමිතිය විසින් යෝජිත අතුරු ව්‍යවස්ථාව මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් රීතිවල විධිවිධානවලට අනුකූල නොවන බවට

නියම කර ඇත්තා වූ යම් තැනැත්තෙකුගෙන් හෝ ආයතනයකින් වාර්තාවක් හෝ නිර්දේශයක් සමිතිය විසින් ලබාගෙන නොමැති නම්,

(ඇ) යෝජිත අතුරු ව්‍යවස්ථා, තත් කාර්ය සඳහා යථා පරිදි කැඳවන ලද මහා සභා රැස්වීමක දී සම්මත කරනු ලැබ නොමැති නම්,

(ඉ) සමිතියේ කාරක සභාවේ සාමාජිකයන් අතුරෙන් යටත් පිරිසෙයින් දෙදෙනකුවත් වයස අවුරුදු දහ අටටත් තිස් පහටත් අතර විය යුතු තැනැත්තන් වන බවට විධානයක් සමිතියේ යෝජිත අතරු ව්‍යවස්ථාවල ඇතුළත් නොවන්නේ නම්,

(ඊ) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය අත්සන් කරන සියලු සාමාජිකයන් විසින්, තම සාමාජිකත්වය සම්බන්ධයෙන් වූ ගෙවීම් සම්පූර්ණ කොට නොමැති නම්, හෝ

(උ) ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන සියලු තොරතුරු සැපයීමට ඒ සමිතිය විසින් පැහැර හැර ඇත්නම් කිසිම සමිතියක් මේ පනත යටතේ ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(2) එහි (2) වන උපවගන්තියේ "යම් තැනැත්තකුගේ වයස පදිංචිය, රක්ෂාව හෝ දේපළ සුදුසුකම් සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් පැන නගින අවස්ථාවක" යන වචන වෙනුවට "ඉහතින් වූ විධිවිධානවල සඳහන් කොන්දේසි සැකීමට පත්කර ඇති බවට යම් ප්‍රශ්නයක් පැන නගින අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන්.

**5**. ප්‍රධාන පඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "ඉල්ලුම් පත්‍රයක් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය." යන වචන වෙනුවට "නියම කරනු ලබන යම් ආකාරයක් අනුව වූ ඉල්ලුම් පත්‍රයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය."

(2) එහි (2) වන උපවගන්තියේ-

(i) (අ)ඡේදයේ "4(1) වන වගන්තියේ නියමයන් අනුව" යන ඉලක්කම් සහ වචන වෙනුවට "4(1) (අ) වන වගන්තියේ නියමයන් අනුව" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්, සහ

(ii) (අ) ඡේදයේ "ලියාපදිංචි කළ එවැනි සෑම සමිතියක් වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු විසින්" යන වචන සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "අත්සන් කරනු ලැබිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්,

(3) එහි (3) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) ඉල්ලුම් පත්‍රය සමග-

(අ) යෝජිත අතුරු ව්‍යවස්ථාවල පිටපත් දෙකක්,

(ආ) සමිතිය නිරත වීමට යෝජනා කරනු ලබන ආර්ථික කටයුතුවලට අදාළ යෝග්‍යතා වාර්තාවක්,

(ඇ) සමිතිය ලියාපදිංචි කිරීම පිණිස යෝජනාව සම්මත කරගනු ලැබූ මහා සභා රැස්වීමේ වාර්තාවේ සහ පැමිණීම සම්බන්ධයෙන් විස්තර සහ අතුරු ව්‍යවස්ථාව සම්මත කර ගනු ලැබූ වාර්තාවේ සහතික පිටපත්,

(ඇ) ඉල්ලුම් පත්‍රය අත්සන් කරන සාමාජිකයන් විසින් සාමාජික ගාස්තු ගෙවනු ලැබීම ස්ථිර කෙරෙන සහ ඒ මුදල් එම කාරක සභාවේ භාරකාරත්වයෙහි පවතින බවට සමිතියේ කාරක සභාව විසින් සහතිකයක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(2) නැවත අංක කරනු ලැබූ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) 6 වන වගන්තිය යටතේ සමිතියක් ලියාපදිංචි කරනු ලැබූ විට රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය."

7. ප්‍රධාන පඥප්තියේ 8 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්තිබිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2අ) ලියාපදිංචි සමිතියක අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වූ කිසිම සංශෝධනයක් 4(1) (ඇ) (ii) වගන්තියේ සඳහන් වාර්තාවක් සමඟ ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස ඒ සංශෝධනය ලියාපදිංචි කරනු නොලැබිය යුතුය."

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "ඒ සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන්" යන වචන වෙනුවට "ඒ සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන්" යන වචන ආදේශ කිරීමෙන්,

(2) එහි (2) වන උපවගන්තියේ "එක් එක් සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන්" යන වචන වෙනුවට "එක් එක් සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන්" යන වචන ආදේශ කිරීමෙන්,

(3) එහි (3) වන උපවගන්තියේ:-

(අ) ඒ උපවගන්තිය එහි (අ) ඡේදය වශයෙන් නැවත අංක කිරීමෙන්: සහ

(ආ) නැවත කරන ලද (අ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ආ) (i) යෝජිත පැවරීමේ, බෙදීමේ හෝ ඒකාබද්ධ වීමේ ආර්ථික යෝග්‍යතාව සම්බන්ධයෙන් නියම කරනු ලබන තැනැත්තකුගෙන් හෝ ආයතනයකින් නිර්දේශ කිරීමේ වාර්තාවක් ලබාගෙන නොමැති නම්:

(ii) ලියාපදිංචි සමිතිය අවස්ථාවෝචිත පරිදි බෙදා ඇත්තේ යම් සමිතිවලට ද නැතහොත් ඒකාබද්ධ වී ඇත්තේ යම් සමිති සමග ද, ඒ සමිතිවල අතුරු ව්‍යවස්ථා පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක විධිවිධාන වලට අනුකූල නොවන බව පළකෙරෙන වාර්තාවක් 4 වන වගන්තියේ කාර්ය සඳහා වූ ආයතනයකින් හෝ නාමෝද්දිෂ්ට තැනැත්තකුගෙන් ලබාගෙන නොමැතිනම්

ස්වකීය වත්කම් සහ බැරකම් වෙනත් යම් ලියාපදිංචි සමිතියකට පැවරීමට හෝ එම සමිතිය, සමිති දෙකකට හෝ වැඩි ගණනකට බෙදීමට හෝ වෙනත් ලියාපදිංචි සමිතියක් සමග ඒකාබද්ධවීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමතය දෙනු නොලැබිය යුතුය."

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

(1අ) සමිතියක සාමාජිකයන්ගේ වගකීම සීමාසහිත වන අවස්ථාවක, ලියාපදිංචි සමිතියක් නොවන කිසිම සාමාජිකයකු විසින් සමිතියේ කොටස් ප්‍රාග්ධනයෙන් දරනු ලබන පංගුව රීති මගින් නියම කරනු ලබන පරිදි පහෙන් එකක උපරිමයකට යටත්ව, තවද

(2) එහි (2) වන උපවගන්තියේ "1961 අංක 33 දරන කෘෂිකාර්මික නිෂ්පාදන (සහතික මිල හා පැහීම හා කෙටීම පාලනය කිරීමේ) පනත යටතේ යම් උපලේඛනගත කෘෂි කාර්මික නිෂ්පාදනයක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "වී අලෙවි මණ්ඩලයේ අනුයෝජිතයකු වශයෙන් යම් උපලේඛනගත කෘෂිකාර්මික නිෂ්පාදනයක්" යන වචන ආදේශ කිරීමෙන්

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 11අ, 11ආ, 11ඇ සහ 11ඈ වගන්ති වශයෙන් බලසහිත විය යුතුය:-

11අ. සාමාජිකයකු විසින් යම් කොටසක් මිලට ගැනීම සඳහා ගෙවීම රුපියල් දහයක මූලික ගෙවීමකින් ආරම්භ කළ හැකි අතර, ඒ මූලික ගෙවීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත ඒ වාරිකය ගෙවීම රුපියල් සියයකට වැඩි කරනු ලැබිය යුතුය. අවම වටිනාකම කැමැත්ත පරිදි වැඩි කරනු ලැබිය හැකිය. කොටසක සම්පූර්ණ වටිනාකම එක් වාරිකයකින් ගෙවනු ලැබිය හැකිය:

එසේ වුවද බඳවා ගැනීමේ දින සිට එක් වර්ෂයක් ඉකුත් වන තෙක් ඡන්දය දීමේ අයිතිය හෝ ධූර දැරීමේ අයිතිය සාමාජිකයකු විසින් භුක්ති විඳිනු නොලැබිය යුතුය:

එතෙකුදු වුවත් මේ පනතේ 4(1) (අ) සහ 4(1) (ආ) සහ 5(1) සහ (2) වගන්තිවලින් අනුදත් පරිපාටිය යටතේ සමිතියක් අලුතින් ලියාපදිංචි කිරීමට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කරන පුද්ගලයන් සඳහා මෙය බලනොපැවැත්විය යුතුය.

11ආ. පූර්ණ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසුව පමණක් ලියාපදිංචි සමිතියක ඕනෑම රැස්වීමකදී ඡන්දය දීමට සහ නිලයකට තෝරාපත් කරනු ලැබීමට සාමාජිකයකුට හිමිකම ඇත්තේය.

11ඇ. පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක, මහ නගර සභාවක, නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයකු වන කිසිම තැනැත්තකු ලියා පදිංචි සමූපකාර සමිතියක කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් තෝරා පත් කරගනු ලැබීමට හෝ තවදුරටත් එලෙස ධූරය දැරීමට සුදුසුසෙක් නොවන්නේ ය.

11ඈ. යම් තැනැත්තෙක්, තෝරා පත්කර ගන්නා දිනයේ දී, සාමාජිකත්වය ලියාපදිංචි සමිති වලින් සමන්විත වන වෙනත් යම් ලියාපදිංචි සමිතියක සභාපතිව සිටින්නේ නම් ඒ තැනැත්තා, සාමාජිකත්වය ලියාපදිංචි සමිතිවලින් සමන්විත වන පළමු සඳහන් සමිතියේ පරමාර්ථවලට සමාන නොවන පරමාර්ථ ඇත්තා වූ ලියාපදිංචි සමිතියක සභාපති ලෙස තෝරා පත්කර ගනු ලැබීමට නුසුදුස්සෙක් වන්නේ ය."

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "කවර පුද්ගලයකු වුවද ආශ්‍රිත සාමාජිකයකු වශයෙන් ඇතුළත් කරගත හැකිය." යන වචන වෙනුවට "සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ගිවිසුමකට එළඹෙන කවර හෝ පුද්ගලයකු ආශ්‍රිත සාමාජිකයකු වශයෙන් ඇතුළත් කරගත හැකිය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ III වන පරිච්ඡේදයේ දැක්වෙන "ලියාපදිංචි කළ සමිතිවල යුතුකම්" යන ශීර්ෂ පාඨය වෙනුවට පහත දැක්වෙන අලුත් ශීර්ෂය මෙයින් ආදේශ කරනු ලැබේ:-

ˈලියාපදිංචි සමිතිවල අයිතිවාසිකම්, බැදීම් සහ වරප්‍රසාද,ˈ

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ ˈජාතික රාජ්‍ය සභාවˈ යන වචන යෙදෙන කවර හෝ විටෙක ඒ වෙනුවට ˈපාර්ලිමේන්තුවˈ යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ ˈ1961 අංක 33 දරන කෘෂිකාර්මික නිෂ්පාදන (සහතික මිල හා පැහීම හා කෙටීම පාලනය කිරීමේ) පනත යටතේ යම් උපලේඛන ගත කෘෂිකාර්මික නිෂ්පාදනයන්ˈ යන ඉලක්කම් සහ වචන වෙනුවට ˈවී අලෙවි මණ්ඩලයේ අනුයෝජිතයකු වශයෙන් යම් උපලේඛනගත කෘෂිකාර්මික නිෂ්පාදනයක්ˈ යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන්:-

ˈඑසේ වුවද ලියාපදිංචි සමිතියක මහා සභාවේ අනුමතය ඇතිව සහ මහ සභාව විසින් නියම කරනු ලබන යම් කොන්දේසි මත, ලියාපදිංචි සමිතියක් විසින් වෙනත් ලියාපදිංචි සමිතියකට ණය ප්‍රදානය කළ හැකිය. නැතහොත් ආශ්‍රිත සාමාජිකයකුට ණයට බඩු සැපයිය හැකිය.ˈ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන්:-

ˈ(2) ස්වකීය මහා සභාවේ අනුමතය ඇතිව හැර ලියා පදිංචි සමිතියක් විසින්, කෘෂිකාර්මික නිෂ්පාදන නොවන යම් චංචල දේපළක ඇපය මත මුදල් ණයට දෙනු නොලැබිය යුතු ය.ˈ

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ ˈරෙජිස්ට්‍රාර් විසින් මේ කාර්යය සඳහා අනුමත කරන ලදˈ යන වචන යෙදෙන කවර හෝ විටෙක ඒ වචන අත් හැරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ VIII වන පරිච්ඡේදයේ ˈවිගණනය, විභාගය, පරීක්ෂණය හෝ විමර්ශනයˈ යන ශීර්ෂය වෙනුවට පහත දැක්වෙන අලුත් ශීර්ෂය මෙයින් ආදේශ කරනු ලැබේ:-

ˈලියාපදිංචි සමිතියක ගිණුම් අයවැය, සහ විගණනය, විභාගය හා පරීක්ෂණයˈ

19 ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය එහි (2) වන උප වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(2) (1) වන උපවගන්තිය යටතේ වූ විගණනයෙහි-

(අ) කාලය ඉකුත් වූ ණය සම්බන්ධයෙන් පරීක්ෂණයක්:

(ආ) ලියාපදිංචි සමිතිවල වත්කම් සහ බැරකම් පිළිබඳ තක්සේරුවක් සහ සත්‍යාක්ෂණයක්,

(ඇ) නිසි මුදල් පාලනය සහ සමිතියේ කටයුතු සම්බන්ධයෙන් අඛණ්ඩ අගැයීමක් කිරීමට හැකි කරනු පිණිස තොරතුරු ඉදිරිපත් කිරීම සහතික කිරීමට සංවිධාන ක්‍රම කාර්ය පටිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලේඛන නිසි ලෙස සහ ප්‍රමාණවත් ලෙස සැලසුම් කරනු ලැබ ඇත්තේ ද සහ ඒ ක්‍රම, කාර්ය පටිපාටි, පොත් වාර්තා සහ වෙනත් ලේඛන ඵලදායක ලෙස ක්‍රියාත්මක වන්නේ ද පිළිබඳ පරීක්ෂණයක්,

(ඇ) සමිතිය පවත්වාගෙන යාම, මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද රීති, නියෝග හෝ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල වන්නේ ද, සමිතියේ කටයුතු පරිපාලනය කිරීම ඒ පනතේ, රීතිවල නියෝගවල හෝ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව කර ඇත්තේ ද යන්න පිළිබඳව පරීක්ෂණයක්,

(ඉ) අරමුදල උපයෝගී කිරීම කාර්යක්ෂම ලෙස සහ පිරි මැසුම් සහිතව ක්‍රියාත්මක කොට ඇත්තේ ද යන්න පිළිබඳව පරීක්ෂණයක්,

(ඊ) ලියාපදිංචි සමිතියට අයත් සහ එහි පාලනය යටතේ ඇති මුදල් සහ දේපළවල ආරක්ෂාව සහතික කරනු පිණිස සතුටුදායක කාර්ය පටිපාටි සකස් කොට ඇත්තේ ද යන්න පිළිබඳ පරීක්ෂණයක්, කරනු ලැබූ ගිණුම් සැලසුම් කොට ඇත්තේ ද යන්න පිළිබඳ පරීක්ෂණයක්,

(උ) ගිණුම්, මුදල් යෙදවීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් වූ සිද්ධාන්ත කෙරෙහි නිසි අවධානය ඇතිව සැලකිල්ලට භාජනය කොට ඇති කාලසීමාව සම්බන්ධයෙන් සමිතියේ කටයුතු පිළිබඳව සත්‍ය වූ සහ නිවැරදි ගිණුමක් ඉදිරිපත් කිරීම පිණිස විගණනය කරනු ලැබූ. ගිණුම් සැලසුම් කොට ඇත්තේ ද යන්න පිළිබඳ පරීක්ෂණයක්, සහ

(ඌ) වෙනත් නියමිත කරුණු

ඇතුළත් විය යුතුය.

**20**. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"විභාගය සහ පරීක්ෂණය"

46. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් තම මෙහෙයවීමෙන් ම, ලියාපදිංචි සමිතියේ සංයුතිය, ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකිය. තවද කාරක සභාවේ බහුතරයක ඉල්ලීම මත හෝ ලියාපදිංචි සමිතියක සාමාජිකයන්ගෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගේ ඉල්ලීම මත ලියාපදිංචි සමිතියක සංයුතිය, ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වනු ලැබිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්ය සඳහා ලිඛිත නියමයක් මගින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට ලියාපදිංචි සමිතියේ සංයුතිය, ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වනු ලැබිය යුතුය. පැවැත්වීමට විධාන කල හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ විභාගයක් පැවැත්වීමේ කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හෝ විභාගයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බල දෙනු ලැබූ යම් තැනැත්තකුට -

(අ) කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ යම් නිලධරයකු නියෝජිතයකු, සේවකයකු හෝ සාමාජිකයකු හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ විභාග කිරීමට හෝ පරීක්ෂා කිරීමට ඔහු විසින් බලය දෙනු ලැබූ තැනැත්තාගේ මතය අනුව, සමිතියේ ගනුදෙනු කිසිවක් සම්බන්ධයෙන් හෝ එහි කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වැදගත් තොරතුරක් දිය හැකි වෙනත් යම් තැනැත්තකු කැඳවීමට;

(ආ) යම් පොතක්, ලේඛනයක්, මුදල්, ඇප හෝ වෙනත් දේපළ සන්තකයෙහි ඇත්තා වූ හෝ භාරව සිටින්නා වූ සමිතියේ කලින් සිටි හෝ දැනට සිටින යම් නිලධරයකු, නියෝජිතයකු, සේවකයකු හෝ සාමාජිකයකු හෝ වෙනත් යම් තැනැත්තකුට සමිතියේ කටයුතුවලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක් හෝ සමිතියට අයත් යම් මුදල්, ඇප හෝ වෙනත් දේපළ ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට,

(ඇ) තමා විසින් යොමු කරනු ලබන යම් කාරණා තීරණය කිරීම පිණිස තමා විසින් සඳහන් කරනු ලබන යම් වේලාවක සහ ස්ථානයක දී සමිතියේ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක් කැඳවීමට, සහ

(ඈ) ඒ විභාගය හෝ පරීක්ෂණය අතරතුර වංචාවක් හෝ අක්‍රමිකතාවක් ඇති බව විශ්වාස කිරීමට තමාට හේතු ඇති අවස්ථාවක සමිතියේ ගිනුම් පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමට බලය ඇත්තේ ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා සහ මේ වගන්තිය යටතේ විභාගයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බලය දෙනු ලැබූ සෑම තැනැත්තකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙයත් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

48. (1) 46 වන වගන්තිය යටතේ විභාගයකින් හෝ පරීක්ෂණයකින් පසුව ලියාපදිංචි සමිතියක කාරක සභාව විසින් ස්වකීය කාර්ය නිසි ආකාරයකින් ඉටු නොකරන බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, එය විසුරුවා හැරීම සම්බන්ධයෙන් කාරක සභාවේ යම් විරෝධතා ඇතොත්, එම විරෝධතා දැක්වීමට ඔහු විසින් ඒ කාරක සභාවට අවස්ථාවක් දීමෙන් පසුව, 46 වන වගන්තිය යටතේ වූ ඒ විභාගය හෝ පරීක්ෂණය ඔහුගේ මෙහෙයීමෙන්ම පවත්වනු ලැබුවේ නම් රීතිවලට අනුකූලව ඔහු විසින් කැඳවනු ලැබූ මහා සභාවට ද, ඒ විභාගය හෝ පරීක්ෂණය කාරක සභාවේ බහුතරයක ඉල්ලීම මත හෝ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඉල්ලීම මත පවත්වනු ලැබුවේ නම්, අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව කැඳවනු ලැබූ මහා සභා රැස්වීමටද ඔහුගේ තීරණ වාර්තා කළ යුතු අතර. මහා සභාව විසින්-

(අ) වරද කරන සාමාජිකයා හෝ සාමජිකයනින් ඉවත් කළ හැකි අතර, එහි ප්‍රතිඵලය වශයෙන් ඇතිවන පුරප්පාඩු අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව පුරවනු ලැබිය හැකිය,

(ආ) කාරක සභාව විසුරුවා හැර, අලුත් කාරක සභාවක් තෝරා පත් කර ගනු ලැබිය හකිය. නැතහොත් සමිතියේ කටයුතු කළමණාකරණය කිරීමට සුදුසු තැනැත්තකු හෝ තැනැත්තන්ගේ මණ්ඩලයක් පත් කරනු ලැබිය හැකිය.

(2) එසේ තෝරාපත් කර ගනු ලැබූ කාරක සභාව හෝ එසේ පත්කර ගනු ලැබූ තැනැත්තා හෝ තැනැත්තන් විසුරුවා හරිනු ලැබූ කාරක සභාවේ ධූර කාලයෙන් ඉතිරිව ඇති කාලය සඳහා ධූරය දැරිය යුතුය,

(3) (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ තැනැත්තා හෝ තැනැත්තන් විසින් සමිතියේ යථා පරිදි පත් කරන ලද කාරක සභාවක සියලු බලතල, අයිතිවාසිකම් සහ වරප්‍රසාද ක්‍රියාත්ක කළ හැකිය.

(4) (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද යම් තැනැත්තකු හෝ තැනැත්තන් පනතට, රීති මාලාවට හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට පටහැනිව ඔවුන් විසින් සිදු කරන ලද යම් ක්‍රියා මගින් ඇති කරන ලද යම් පාඩු සඳහා එක්ව සහ වෙන් වෙන්ව වගකිව යුතුය.

(5) සමිතියේ කටයුතු කළමනාකරණය කිරීමට (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද යම් තැනැත්තකුට ගෙවිය යුතු පාරිශ්‍රමිකය මහා සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. එම පරිශ්‍රමිකයේ මුදල් සහ සමිතියේ කටයුතු කළමනාකරණය කිරීමේ දී දරන්ට සිදු වූ වෙනත් යම් වියදම් වෙතොත් ඒවාද අරමුදලින් ගෙවිය යුතුය.

(6) ලියාපදිංචි සමිතියක කටයුතු කළමනාකරණය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත් කරනු ලැබුවා වූ ද (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ විධාන බල රහිත වීමේ දිනයට පෙරාතුවම වූ දිනයේදී ධූරය හෝ ධූර දරමින් සිටියා වූ ද තැනැත්තා හෝ තැනැත්තන් විසින් එකී දිනයට පෙර සමිතියේ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව අලුත් කාරක සභාවක් තෝරාපත් කිරීම සඳහා කටයුතු සැලැස්වීම ඒ තැනැත්තා හෝ තැනැත්තන්ගේ කාර්ය වන්නේ ය.

(7) 49 වන වගන්තිය යටතේ සමිතියේ ලියා පදිංචිය අවලංගු කිරීමට රෙජිස්ට්‍රාර්වරයාගේ බලය කෙරෙහි මේ වගන්තියේ කිසිවකින් බලපෑමක් ඇති කරවන්නේ යයි සලකනු නොලැබිය යුතුය."

**23**. ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

**24**. ප්‍රධාන ප්‍රඥප්පියේ 49 වන වගන්තියේ (1) වන උපවගන්ති යේ "47 වන වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශනයකින් පසු" යන වචන වෙනුවට "පරීක්ෂණයකින් පසු" යන වචන ආදේශ කිරීමෙන් එ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**25**. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර ඒ ඡේදය (ඒඒ) ඡේදය වශයෙන් බලසහිත විය යුතුයඃ-

"(ඒඒ) ඈවර කිරීම සම්බන්ධයෙන් රැස් කරන ලද සියලු මුදල් රෙජිස්ට්‍රාර්වරයා විසින්, විධාන කරනු ලබන යම් ආකාරයකින් තැන්පත් කිරීම,"

**26**. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේඃ-

(1) ඒ වගන්තිය එහි (1) උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන්, සහ

(2) නැවත අංක කරනු ලැබූ (1) යව උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්ඃ-

"(2)" සමූපකාර අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර, ඈවරකරු විසින් රැස් කරනු ලබන සියලු මුදල් ඒ අරමුදලට බැර කළ යුතුය. තවද, ඒ අරමුදල රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතුය."

**27**. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "අතීත හෝ වර්තමාන සාමාජිකයකුගෙන්," යන වචන සිට "සමිතියේ ව්‍යාපාරයට අදාළ ආරවුලක් ලෙස සලකනු ලැබිය යුතුය." දක්වා වූ වචන ඉවත්කොට ඒ වෙනුවට "අතීත හෝ වර්තමාන සාමාජිකයෙකුගෙන්, නිලධරයකුගෙන් හෝ සේවකයකුගෙන් හෝ මියගිය සාමාජිකයකුගේ නිලධරයකුගේ හෝ සේවකයකුගේ යම් නම් කළ තැනැත්තකුගෙන්, උරුමකරුවකුගෙන් හෝ නිත්‍යානුකූල නියෝජිතයකුගෙන් ලියාපදිංචි සමිතියකට අයවිය යුතු යම් ණයක්, ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා ඒ සමිතිය විසින් ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් පෑමක් හෝ ලියාපදිංචි සමිතියකින් අතීත හෝ වර්තමාන නිලධරයකුගෙන් හෝ සෙවකයකුගෙන් හෝ සාමාජිකයකුගෙන් සාමාජිකයකුට හෝ ලියාපදිංචි සමිතියකින් මියගිය සාමාජිකයකුගේ, නිලධරයකුගේ හෝ සේවකයකුගේ යම් නම් කළ තැනැත්තකුට, උරුමකරුවකුට හෝ නිත්‍යානුකූල නියෝජිතයකුට අයවිය යුතු ණයක්, ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා අයවිය යුතු යම් ණයක්, ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් පෑමක් ඒ ණය හෝ අලාභය පිළිගත යුතු වුව ද නොවුව ද මේ උපවගන්තියේ අර්ථානුකූලව සමිතියේ ව්‍යාපාරයට අදළ ආරාවුල් ලෙස සලකනු ලැබිය යුතුය."

**28**. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක් ඔහු විසින් කළ හැකිය." යන වචන වෙනුවට "මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක් ඔහු විසින් කළ හැකිය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තිය අනුව නියම කරනු ලැබූ දඩය පැහැර හැරීමෙහිලා බන්ධනාගාර ගත කිරීමේ කාලයට දණ්ඩන නියමයන් කරනු ලැබූ

යම් පැහැර හරින්නකු 59(1) (ඇ) වගන්තියේ නිශ්චිත සහතික යෙහි සඳහන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් නිදහස් කරනු නොලැබිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්.

**29**. ප්‍රධාන ප්‍රඥප්තියේ XI වන පරිච්ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ XIඅ පරිච්ඡේදය වශයෙන් බල සහිත විය යුතුය:-

"XI පරිච්ඡේදය

රජයේ අරමුදල්වලින් ක්‍රියාත්මක වන ලියාපදිංචි කළ සමිතිවලට අදාළ විශේෂ විධිවිධාන

60අ. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් ආණ්ඩුවෙන් ණයක්, අත්තිකාරමක් හෝ ප්‍රදානයක් වන මුදලක් ලබා ගන්නා විට එවැනි සෑම ණයක්ම, අත්තිකාරමක්ම හෝ ප්‍රදානයක් වන මුදලක්ම පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතුය:-

(අ) සමිතියේ පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයක් සඳහා යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපළක් මිලට ගැනීමෙන්, බද්දට ගැනීමෙන්, ත්‍යාගයක් වශයෙන් හෝ වෙනත් යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීමෙන්, උකස් කිරීමෙන්, බදුදීමෙන්, හුවමාරු කිරීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් නියාදනය කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතුය:

(ආ) සමිතියේ අරමුදල්, භාර ආඥාපනතේ 20 වන වගන්තිය ප්‍රකාර නිශ්චල දේපළක් පිළිබඳ මුල් උකස හැර යම් සුරැකුම් පත්වල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්ය සඳහා අනුමත කරනු ලැබූ බැංකුවක හෝ බැංකුකරුවකු වශයෙන් ක්‍රියාකරන තැනැත්තකු වෙත හෝ තත්කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරනු ලැබූ වෙනත් යම් ලියාපදිංචි කළ සමිතියක කොටස්වල හෝ සුරැකුම් පත්වල හෝ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති වෙනත් යම් ආකාරයකට තැන්පත් කිරීම හෝ ආයෝජනය කිරීම කරනු ලැබිය යුතුය.

(2) රජයේ අරමුදල්වලින් ක්‍රියාත්මක වන ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව නියමිත ආකාරයට ස්වකීය කාර්ය ඉටු නොකරන බව 46 වන වගන්තිය යටතේ පවත්වනු ලැබූ විභාගයකින් හෝ පොත් පරීක්ෂා කිරීමකින් පසු රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, ඒ කාරක සභාව විසුරුවා හැරීමට විරුද්ධව හේතු කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කිරීමට ඒ කාරක සභාවට අවස්ථාවක් ලබා දීමෙන් පසු රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් කැඳවනු ලබන මහා සභාව වෙත තමා සොයා ගත් කරුණු වාර්තා කළ යුතු අතර රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක් ඇතුලතදී මහා සභාව විසින් ඒ කාරක සභාව ඉවත් කරනු ලැබිය යුතුය. එසේ ඉවත් කිරීම මහා සභාව විසින් පැහැර හරිනු ලැබුවහොත් හෝ නොසලකා හරිනු ලැබුවහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ කාරක සභාව ඉවත් කිරීමෙන් පසු පාලක මණ්ඩලයක් පත් කරන ලෙස මහා සභාවට නියම කරනු ලැබිය යුතුය. මහා සභාව විසින් දින දහහතරක් ඇතුළත් පාලක මණ්ඩලයක් පත් කිරීමට අපොහොසත් වුවහොත් ඒ සමිතියේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසු තැනැත්තකු හෝ තැනැත්තන් පත් කළ හැකිය. එසේ ඉවත් කරනු ලැබූ කාරක සභාවක සාමාජිකයන් එසේ ඔවුන් ඉවත් කරනු ලැබූ දින සිට වර්ෂ පහක් ගතවන තෙක් ලියාපදිංචි කළ කිසිදු සමිතියක නිලයකට පත් කරනු ලැබීමට නුසුදුස්සන් වේ. මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ පාලක මණ්ඩලය 48 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සඳහන් කාලය තුළ ධූර දැරිය යුතු අතර එකී ඡේදය යටතේ පත් කරනු ලැබූ තැනැත්තකුගේ බලතල සහ කර්තව්‍ය ඔවුන් සතු වන්නේ ය.

60ආ. (1) 46 වන වගන්තිය යටතේ පවත්වනු ලැබූ විභාගයකින් හෝ පොත් පරීක්ෂා කිරීමකින් පසුව ලියාපදිංචි කළ සමිතියක යම් නිලධරයකු හෝ සේවකයකු විසින් තම කාර්යය නිසි ආකාරයට ඉටු නොකරනු ලබන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්ය ඉටු කිරීමට නුසුදුසු බව හෝ වෙනත් ආකාරයකින් නොහැකි බව රෙජිස්ට්‍රාර්වරයා විසින් නිගමනය කරනු ලැබුවහොත් මේ නීතියේ හෝ 1972 අංක 12 දරන සමූපකාර සමිති සේවක කොමිෂන් සභා පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද ස්වකීය විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් එකී නිලධරයාට හෝ සේවකයාට ලබාදීමෙන් පසු අවශ්‍ය වන පරිදි පරීක්ෂණයක් පැවැත්වීම පොරොත්තුවෙන් ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සේවය අත් හිටුවීම හෝ ඔහුගේ වැඩ තහනම් කිරීම ලිඛිත නියමයක් මගින් කරනු ලැබිය හැකිය. තවද යටකී පරීක්ෂණයෙන් පසු ඒ නිලධරයා හෝ සේවකයා නිලයෙන් ඉවත් කරනු ලැබිය හැකිය:

එසේ වුවද මේ උපවගන්තිය යටතේ කරන ලද ඉවත් කිරීමේ නියමයකින් අතෘප්තියට පත් යම් සේවා නියුක්තයකු විසින්, දවස් තිහක් ඇතුළත, 1971 අංක 12 දරන පනත යටතේ පිහිටුවා ඇති සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් කලහැකි අතර ඒ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(2) යම් සේවා නියුක්තයකු (1) වන උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබුවා වූ සහ ඒ ඉවත් කිරීමේ නියමය සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් ස්ථිර කර ඇත්තා වූ නැතහොත් ඒ නියමයට විරුද්ධව දවස් තිහක් ඇතුළත අභියාචනයක් කර නොමැත්තාවූ අවස්ථාවක වෙනත් සේවකයකු පත්කිරීම අදාල විධිවිධානවලට අනුකූලව කළ හැකිය.

60ඇ. රජයේ අරමුදල්වලින් ක්‍රියාත්මක වන ලියාපදිංචි සමිතියක කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහතික කර ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ සමිතියකට ආණ්ඩුවෙන් කරන ලද ආයෝජන හෝ මුදලින් නැතහොත් භාණ්ඩවලින් දෙන ලද අත්තිකාරම් හෝ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා ඒ ලියාපදිංචි සමිතියේ කාරක සභාවට සාමාජිකයන් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් නම් කිරීම අවශ්‍ය බව හෝ අවස්ථාවෝචිත බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන අවස්ථාවක, මේ පනතේ හෝ වෙනත් යම් නීතියක හෝ ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල හෝ කුමක් සඳහන්ව තිබුණ ද, ඔහු විසින් ඔහුගේ මතය අනුව අවශ්‍ය හෝ අවස්ථාවෝචිත පරිදි ඒ ලියාපදිංචි සමිතියේ කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් නම් කළ හැකිය:

එසේ වුවද එසේ නම් කරන සමාජික සංඛ්‍යාව ඒ කාරක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් හරි අඩකට වඩා අඩු විය යුතුය."

**30**. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "47 වන වගන්තිය යටතේ සමිතියේ පොත් පරීක්ෂා කර බැලීමේ දී" හෝ කටයුතු විමර්ශනය කර බැලීමේදී" යන වචන වෙනුවට, "ලියාපදිංචි සමිතියක පොත් පරීක්ෂාකර බැලීමේ දී" යන වචන ආදේශ කිරීමෙන්, සහ

(2) එහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන්:-

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් මුදලක් ආපසු ගෙවීම සඳහා හෝ එහි වත්කම්වලට යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවීම සඳහා (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝගයක් අනුව ක්‍රියා කර නොමැති අවස්ථාවක සමිතියේ ලියාපදිංචි කළ ව්‍යාපාරස්ථානය පිහිටි හෝ නියෝගය කරන ලද්දේ යම් තැනැත්තකුට හෝ තැනැත්තන්

කණ්ඩායමකට හෝ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම හෝ නිලධරයා හෝ සේවකයා පදිංචිව සිටින හෝ ව්‍යාපාරය කරගෙන යන ස්ථානය පිහිටි කොට්ඨාසය තුළ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා විසින් ඒ මුදල බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදක් සඳහා ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම හෝ නිලධරයා හෝ සේවකයා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියම කරන ලද දඩයක් වූවාක් මෙන් අයකර ගනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියෙහි (එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ඇ) ඡේද හැර) විධිවිධාන ඉනිබික්තිව අදාළ විය යුතුය. තවද ඒ දණ්ඩනය නියම කරන අවස්ථාවේදී ඒ වගන්තියේ විධි විධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක් ද ඔහු විසින් කළ හැකිය. රෙජිස්ට්‍රාර් විසින් කරනු ලැබූ යම් නියෝගයක නිරවද්‍යතාව මේ වගන්තිය යටතේ කිසිම නිති කෘත්‍යක දී සලකා බැලීමට පරීක්ෂා කිරීමට හෝ තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට මේ වගන්තියේ කිසිවකින් බලය ලැබීම හෝ නියම වීම සිදු නොවිය යුතුය.

**31** ප්‍රධාන ප්‍රඥප්තියේ 66අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

66අ. (1) ලියාපදිංචි සමුපකාර සමිතියක සභාපතිවරයා විසින් සහ කාරක සභාවේ සෑම සාමාජිකයකු විසින්, වාර්ෂිකව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත නියමිත ආකෘතියෙහි වූ වත්කම් හා බැරකම් ප්‍රකාශයක්, ඒ ප්‍රකාශය කරන්නේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනට පැවති පරිදි

(අ) ඔහුගේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳව:

(ආ) ඔහුගේ කලත්‍රයාගේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳව: සහ

(ඇ) ඔහුගේ එක් එක් දරුවාගේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳව කළ යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය ලියාපදිංචි සමිතියක සභාපතිවරයා හෝ කාරක සභාවේ සෑම සාමාජිකයකු විසින්, සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත අවස්ථාවෝචිත පරිදි ඒ සභාපතිවරයා හෝ කාරක සභාවේ සාමාජිකයා තෝරා පත්කර ගනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත ද ඔහු සභාපති ධූරය හෝ කාරක සභා සාමාජික ධූරය දැරීම නතර වුවහොත් මිස ඔහු ප්‍රථම ප්‍රකාශය කළ වර්ෂයෙන් පසුව එළඹෙන එක් එක් අනුක්‍රමික වර්ෂයේ ජූලි මස පළමු වන දිනට පෙර ද කළ යුතු ය.'

**32**. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය, එහි 'පරීක්ෂා කර බැලීම 47 වන වගන්තිය යටතේ කිරීමෙන් පසුව එහි කටයුතු විමර්ශනය කිරීම' යන වචන වෙනුවට 'පරීක්ෂා කර බැලීමෙන් පසු' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**33**. ප්‍රධාන ප්‍රඥප්තියේ 72අ වගන්තියේ '44 වන, 46 වන, 47 වන, 49 වන 52 වන වගන්ති යටතේ' යන ඉලක්කම් සහ වචන වෙනුවට '44 වන, 46 වන, 49 වන, 52 වන වගන්ති යටතේ' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්ති මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**34**. ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 'කාරක සභාව' යන යෙදුමෙහි අර්ථ කථනයෙහි '48 වන වගන්තිය යටතේ' යන ඉලක්කම් සහ වචන වෙනුවට '60අ වගන්තියේ (2) වන

උපවගන්තිය යටතේ' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(2) 'මූලික සමිතිය' යන යෙදුමෙහි අර්ථ කථනයේ '3(1) වන වගන්තියේ (ආ), (ඇ) හෝ (ඈ) ඡේදවල' යන වචන වෙනුවට, '3 වන වගන්තියේ (ආ) ඡේදයේ' යන වචන ආදේශ කිරීමෙන්, සහ

(3) 'රීති' යන යෙදුමෙහි අර්ථ කථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය එකතු කිරීමෙන්:-

'රජයේ අරමුදල් යන්නෙන් ආණ්ඩුව විසින් දෙනු ලබන ණය අත්තිකාරම් සහ ප්‍රදාන අදහස් වන අතර, පනතේ 43 වන සහ 57 වන වගන්තිවල සඳහන් අරමුදල් වලින් දෙනු ලබන ණය ප්‍රදානයක් හො අත්තිකාරමක් ඊට ඇතුළත් වේ'

**35**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1992 අංක 14 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 11 වන දින)

**1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1992 අංක 14 දරන සේවක අර්ථ සාධක අරමුදල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ,

(1) එහි (ඉ) ඡේදයෙහි "සේවා නියුක්තියක් භාරගත් පසු" යන වචන වෙනුවට "සේවා නියුක්තියක් භාරගත් පසු" යන වචන ආදේශ කිරීමෙන්

(2) එහි (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඊ) (i) 1987 අංක 22 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද සංස්ථාගත කිරීමේ නියමයක් මගින්, යම් ව්‍යාපාර ආයතනයක් බාර ගැනීමේ සහ කරගෙන යාමේ කාර්ය සඳහා, රාජ්‍ය සංස්ථාවක් පිහිටුවන ලද විට, ඒ සමාජිකයා එම ව්‍යාපාර ආයතනයේ සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු ඒ සාමාජිකයා එසේ පිහිටු වන ලද රාජ්‍ය සංස්ථාවේ සේවා නියුක්තිය භාර නොගැනීමෙන් පසු,

(ii) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සංස්ථාවක කර්තව්‍ය බාරගැනීම සඳහා හෝ ව්‍යාපාර ආයතනයක් බාර ගැනීම හා කර ගෙන යාම සඳහා පොදු සමාගමක් සංස්ථාගත කරන ලද විට, අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයා එම රාජ්‍ය සංස්ථාවේ හෝ ව්‍යාපාර ආයතනයේ සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු සහ ඒ සාමාජිකයා එසේ සංස්ථාගත කරන ලද පොදු සමාගමේ සේවා නියුක්තිය භාර නොගැනීමෙන් පසු,

(iii) සේවක සංඛ්‍යාව අඩු කිරීම සඳහා ඒ සාමාජිකයා ඉවත් කරන ලද විට. ඒ සාමාජිකයා රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු:

(iv) යම් රාජ්‍ය සංස්ථාවක් විසුරුවා හැරීමෙන් පසු හෝ යම් රාජ්‍ය සංස්ථාවක් ව්‍යාපාර ආයතනය වසා දැමීමෙන් පසු ඒ සාමාජිකයා ඒ රාජ්‍ය සංස්ථාවේ සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු",

(3) එහි අවසාන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"මේ වගන්තියෙහි-

(i) "ව්‍යාපාර ආයතනය" යන්නෙන් 1971 අංක 35 දරන ව්‍යාපාර ආයතන (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්කර ගත් හෝ ආණ්ඩුව වෙත් සතු වූ යම් ව්‍යාපාර ආයතනයක් අදහස් වේ,

(ii) 'රාජ්‍ය සංස්ථා' යන්නෙහි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය,

(iii) 'ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයා' යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද වෛද්‍ය වෘත්තිකයෙක් අදහස් වේ,

(iv) 'සේවක සංඛ්‍යාව අඩු කිරීම' යන්නෙහි කාර්මික ආරාවුල් පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේය,'

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

# 1992 අංක 16 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 19 වන දින)

## බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයකු වන හෙයින් ද, ශ්‍රී ලංකාවට ඒ අරමුදලේ සාමාජිකයකු වීමට හැකි කරනු ලැබූ බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සම්මත කිරීමට පෙරාතුව ඒ අරමුදලේ මුල් ගිවිසුම් කොන්දේසි පාඨය පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබනු ලැබූ හෙයින්ද:

අරමුදලේ පාලක මණ්ඩලය විසින් 1990 ජුනි මස 20 වන දින පවත්වන ලද ඒ පාලක මණ්ඩලයේ රැස්වීමක දී ඒ ගිවිසුම් කොන්දේසිවල XXVIII වන ව්‍යවස්ථාව අනුව කටයුතු කරමින් සම්මත කරන ලද යෝජනා සම්මතයක් මගින්, (මේ පූර්විකාවෙහි "යෝජිත සංශෝධනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගිවිසුමේ ඒ ව්‍යවස්ථාවලට කරන ලද තුන්වන සංශෝධනය සම්මත කරන ලද හෙයින් ද:

යෝජිත සංශෝධනයේ පාඨය 1991 ඔක්තෝබර් මස 11 වන දින පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබන ලද හෙයින් ද:

යෝජිත සංශෝධනය ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පිළිගනු ලැබ ඇති හෙයින් ද:

ඒ තීරණයට පූර්ණ බලය දීම සහ බලගැන්වීම පිණිස බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සංශෝධනය කිරීම අවශ්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 1992 අංක 16 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් වූ ගිවිසුම් කොන්දේසිවලට කරන ලද තුන්වන සංශෝධනය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන දිනය වශයෙන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනතේ 10 වන වගන්තියේ "අරමුදල් ගිවිසුම" යන්නෙහි අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"අරමුදල් ගිවිසුම" යන්නෙන් -

(අ) විශේෂ ගැණුම් හිමිකම් පදනම් කර ගනු ලැබූ පහසුවක් ඇති කරලීම පිණිස (එකී සංශෝධනයේ පාඨය 1968 නොවැම්බර් මස 23 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි තබන ලදී), සහ

(ආ) නව ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයක් සංස්ථාපනය කිරීම පිණිස (එකී සංශෝධනය 1978 අප්‍රේල් මස 4 වන දින ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ අරමුදලේ ගිවිසුම් කොන්දේසිවල පාඨයෙහි ඇතුළත් කරන ලදී) , සහ

(ඇ) ඒ ව්‍යවස්ථා යටතේ වූ ස්වකීය බැඳීම් ඉටු නොකරන සාමාජික රටක ඡන්දය දීමේ හා ඊට සම්බන්ධ අයිතිවාසිකම් අත්හිටුවීම සඳහා විධිවිධාන සැලසීම පිණිස (එකී සංශෝධනයේ පාඨය 1991 ඔක්තෝබර් මස 11 වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී)

මුලින් සම්මත කොට ඉන් අනතුරුව සංශෝධනය කරන ලද පරිදි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම් කොන්දේසි අදහස් වේ.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1992 අංක 22 දරන මුදල් (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 31 වන දින)

**1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1992 අංක 22 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන පඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 11 දරන මුදල් පනතේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

(3) "බද්ද ගෙවීමට යටත් වන තැනැත්තකු, එම ඉඩම පැවරීම සිදු කෙරෙන සාධන පත්‍රය, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කිරීමට පෙර, එම බද්ද එසේ පවරනු ලබන ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවිය යුතු ය."

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ "හෝ කොටස්" යන වචන යෙදෙන කවර තැනක වුව ද එම වචන අත්හැරීමෙන්,

(3) එම වගන්තියේ (4) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "හෝ යම් සමාගමක කොටස්" යන වචන අත්හැරීමෙන්, සහ

(4) එම වගන්තියේ (4) වන උපවගන්තියේ (ඈ) (ඉ) සහ (ඊ) ඡේද ඉවත් කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය එහි "අවස්ථාවෝචිත පරිදි" හා "හෝ සමාගම" යන වචන අත්හැරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන පඥප්තියේ 60 වන වගන්තිය, එම වගන්තියේ (2) සහ (3) වන උපවගන්ති ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන පඥප්තියේ 62 වන වගන්තිය එහි "හෝ සමාගමක්" සහ "හෝ සමාගම" යන වචන යෙදෙන කවර තැනක වුවද එම වචන අත්හැරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන පඥප්තියේ 66 වන වගන්තියේ "දේපළ" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"දේපළ" යන්නෙන් යම් ඉඩමක් අදහස් වේ."

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1992 අංක 30 දරන බදු සමා (නිවාස සහ වාණිජ ගොඩනැගිලි) පනත

(සහතිකය සටහන් කළේ 1992, මැයි මස 27 වන දින)

අනාගතයේදී යම් තැනැත්තන් විසින් බදු නීති සම්පූර්ණයෙන් පිළිපදිනු ලැබීම සහ ශ්‍රී ලංකාවේ නිවාස සංඛ්‍යාව වැඩි කිරීම සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව, නිවාස හෝ වාණිජ ගොඩනැගිලි ඉදිකිරීමෙහිලා හෝ වාණිජ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමෙහිලා හෝ නිවාස මිලට ගැනීමෙහිලා හෝ අදාළ ලාභ සහ ආදායම සම්පූර්ණයෙන් ම හෝ කොටසක් ප්‍රයෝජනයට ගනු ලබන එම තැනැත්තන්ට බදු අනුග්‍රහ සැලසීම සඳහා ද එම ඉදිකිරීමේ, අලුත් වැඩියා කිරීමේ හෝ මිලට ගැනීමේ කාර්ය සඳහා ඒ ලාභ සහ ආදායම ප්‍රයෝජනයට ගනු ලබන තැනැත්තන්ට එම ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ වැරදි සඳහා නඩු පැවරීමට විරුද්ධව මුක්තිදානය කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා අරභයා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1992 අංක 30 දරන බදු සමා (නිවාස සහ වාණිජ ගොඩනැගිලි) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, තම අදාළ ලාභ සහ ආදායම සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් නියෝජනය කෙරෙන මුදල් කිසිවක් ඇත්තා වූ යම් තැනැත්තකුට මේ පනත අදාළ වන්නේ ය.

(2) 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර යම් තැනැත්තකුට උද්ගත වූ හෝ උපචිත වූ හෝ ව්‍යුත්පන්න වූ, අවස්ථාවෝචිත පරිදි, ලාභ සහ ආදායම හෝ පිරිවැටුම සම්බන්ධයෙන් දේශීය ආදායම් පනත හෝ පිරිවැටුම් බදු පනත යටතේ ගෙවිය යුතු යම් බද්දක් සම්බන්ධයෙන් කරනු ලැබුවේ යයි කියනු ලබන හෝ සැක කරනු ලබන වැළැහීමක් සඳහා 1991 ඔක්තෝබර් මස 1 වන දිනයෙහි යම් විමර්ශනයකට භාජනව සිටි යම් තැනැත්තකු සම්බන්ධයෙන් මේ පනත අදාළ නොවිය යුතුය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන තැනැත්තකු නොවන්නා වූ (1) වන උපවගන්තියේ සඳහන් සෑම තැනැත්තකුම මේ පනතෙහි මින් මතු 'මේ පනත අදාළ වන තැනැත්තකු' යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතුය.

3. (1) අවස්ථාවෝචිත පරිදි, (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි හෝ (ඉ) ඡේදයෙහි සඳහන් ඉදිකිරීමක් සඳහා වූ හෝ (ඊ) ඡේදයෙහි සඳහන් අලුත්වැඩියා කිරීමක් සඳහා වූ සැලැස්ම, අවස්ථාවෝචිත පරිදි, උචිත පළාත් පාලන ආයතනය විසින් හෝ නාගරික සංවර්ධන අධිකාරිය විසින් හෝ 1991 සැප්තැම්බර් මස 30 වන දිනට පසුව අනුමත කරනු ලබන අවස්ථාවක, මේ පනත අදළ වන යම් තැනැත්තකු විසින් 1991 සැප්තැම්බර් මස 30 වන දිනයට පසුව පහත දැක්වෙන කාර්යවලින් එකක් හෝ වැඩි ගණනක් සඳහා ඔහුගේ අදාළ ලාභ සහ ආදයම සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ ප්‍රයෝජනයට ගනු ලැබිය හැකිය:-

(අ) ප්‍රමාණයෙන් හෙක්ටයාරයකින් හතලිහෙන් එක් කොටසක් නොඉක්මවන්නා වූ සහ ඒ තැනැත්තාට අයත් වන්නා වූ ඉඩමක එක් එක් නිවාසයේ අභ්‍යන්තර බිම් ප්‍රදේශය (පිටිත බිත්තිවල ඝණකම හැර) වර්ග මීටර එකසිය විසි පහක් නොඉක්මවන්නා වූ එක් නිවාසයක් හෝ වැඩි ගණනක් ඉදිකිරීම:

(ආ) යම් ඉදි කිරීමේ කාර්ය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලබන යම් ප්‍රමාණයක් නොඉක්ම වන්නාවූ සහ ඒ තැනැත්තාට අයත් වන්නා වූ ඉඩමක එක් එක් නිවාස ස්ථානයේ අභ්‍යන්තර බිම් ප්‍රදේශය (පිටත බිත්තිවල ඝණකම හැර) වර්ග මීටර එකසිය විසි පහක් නොඉක්මවන්නා වූ නිවාස ඒකක දෙකක් හෝ වැඩි ගණනකින් සමන්විත වන එක් ගොඩනැගිල්ලක් හෝ වැඩි ගණනක් ඉදිකිරීම:

(ඇ) සුදුසුකම්ලත් තැනැත්තකු විසින් ඉදිකරනු ලැබූ (අ) ඡේදයෙහි සඳහන් වන එවැනි යම් නිවාසයක් තමා වෙනුවෙන් වූ වාසස්ථානයක් වශයෙන් පදිංචිය සඳහා මිලට ගැනීම:

(ඈ) (ආ) ඡේදයෙහි සඳහන් වන්නා වූ සහ සුදුසුකම්ලත් තැනැත්තකු විසින් ඉදිකරනු ලැබූ ගොඩනැගිල්ලක අඩංගු වන්නා වූ යම් නිවාස ඒකකයක් තමා වෙනුවෙන් වූ වාසස්ථානයක් වශයෙන් පදිංචිය සඳහා මිලට ගැනීම:

(ඉ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදි කිරීමේ කාර්ය සඳහා අනුමත ලබන යම් ප්‍රමාණයක් නොඉක්මවන්නා වූ සහ ඒ තැනැත්තාට අයත් වන්නා වූ ඉඩමක වරිපනම් අය කිරීමේ කාර්ය සඳහා වාණිජ ස්ථානයක් වශයෙන් තක්සේරු කරනු ලැබූ ගොඩනැගිල්ලක්වන ඒ එක් එක් ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි වැඩි ගණනක් රුපියල් දස ලක්ෂ පහක් නොඉක්මවන්නා වූ පිරිවැයකට ඉදි කිරීම:

(ඊ) වරිපනම් අයකිරීමේ කාර්ය සඳහා වාණිජ ස්ථානයක් වශයෙන් තක්සේරු කරනු ලබන්නා වූ සහ ඒ තැනැත්තාට අයත්වන්නා වූ ගොඩනැගිල්ලක් වැනි අත්හැර දැමූ ගොඩනැගිල්ලක් රුපියල් දසලක්ෂ පහක් නොඉක්මවන්නා වූ පිරිවැයකට අලුත්වැඩියා කිරීම.

(ඊ) ඡේදයෙහි සඳහන් යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් 'අලුත් වැඩියා කිරීම' යන යෙදුමෙන් යම් ගොඩනැගිල්ලක් නැවත ගොඩනැගීම පුනස්ථාපනයට පත් කිරීම හෝ උත්ශ්‍රේණි කිරීම අදහස් වේ.

(2) මේ පනත අදාළ වන්නා වූ සහ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ සඳහන් වන යම් නිවාසයක් හෝ ගොඩනැගිල්ලක් ඉදිකරන්නා වූ, හෝ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් වන යම් නිවාසයක් හෝ නිවාස ඒකකයක් මිලට ගන්නා වූ හෝ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ සඳහන් වන යම් ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කරන්නා වූ සහ අවස්ථාවෝචිත පරිදි, ඒ නිවාසය හෝ නිවාස ඒකකය ඉදිකිරීම හෝ අලුත්වැඩියා කිරීම හෝ මිලට ගැනීම 1994 ඔක්තෝබර් මස 1 වන දිනට පෙර සම්පූර්ණ කරන්නා වූ තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි ඒ ඉදිකිරීම්, අලුත් වැඩියා කිරීම සම්පූර්ණ කිරීමේ දින සිට හෝ ඒ මිලට ගැනීමේ දින සිට දින අනූවක් ඇතුළත කොමසාරිස් ජනරාල් වරයා වෙත-

(අ) අවස්ථාවෝචිත පරිදි, ඒ ඉදිකිරීම, අලුත් වැඩියා කිරීම හෝ මිලට ගැනීම සඳහා ඔහු විසින් ප්‍රයෝජනයට ගනු ලැබූ ඔහුගේ අදාළ ලාභ සහ ආදායමෙහි මුදල දක්වමින් මේ පනතේ උපවගන්තියෙහි දක්වා ඇති ආකෘතිය අනුව ප්‍රකාශයක්:

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම හෝ මිලට ගැනීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් හෝ නාගරික සංවර්ධන අධිකාරිය විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ රජයේ නිලධරයකු විසින් හෝ 4 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් සැපයිය හැකිය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය සහ සහතිකය ඒ උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත සපයන, මේ පනත අදාළ වන තැනැත්තකු මේ පනතෙහි 'සුදුසුකම්ලත් තැනැත්තකු' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

4. (1) 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ සඳහන් වන යම් නිවාසයක් හෝ ගොඩනැගිල්ලක් ඉදි කරනු ලැබ ඇත්තා වූ, හෝ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් වන යම් නිවාසයක් හෝ නිවාස ඒකකයක් මිලට ගෙන ඇත්තාවූ හෝ 3 වන වගන්තියේ (1)

)න උපවගන්තියේ (ඊ) ඡේදයේ සඳහන් වන යම් ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කොට ඇත්තා ] තැනැත්තකු විසින් තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත-

(අ) නිවාසයක් හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි, ඒ නිවාසය හෝ ගොඩනැගිල්ල 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ නිශ්චිත නියමයන්ට අනුකූල බවට සහ ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් පවත්නා මිල ගණන් කෙරෙහි සැළකිල්ල ඇතිව, ඒ ඉදිකිරීම සඳහා යොදනු ලැබුවේ යයි ප්‍රකාශ කරනු ලැබූ මුදල අධික නොවන බවට:

(ආ) නිවාසයක් හෝ නිවාස ඒකකයක් මිලට ගැනීම සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි ඒ නිවාසය හෝ නිවාස ඒකකය 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ නිශ්චිත නියමයන්ට අනුකූල බවට සහ ඒ මිලට ගැනීම සඳහා යොදනු ලැබුවේ යයි ප්‍රකාශ කරනු ලැබූ මුදල, අවස්ථාවෝචිත පරිදි, ඒ නිවාසය හෝ නිවාස ඒකකය මිලට ගැනීමේ දිනයෙහි පැවති වෙළෙඳ වටිනාකම නොඉක්මවන බවට:

(ඇ) ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් වන විට, ඒ ගොඩනැගිල්ල 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ දක්වා ඇති නියමයන්ට අනුකූල බවට, සහ ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් පවත්නා මිල ගණන් කෙරෙහි සැලකිල්ල ඇතිව ඒ අලුත්වැඩියා කිරීම සඳහා යොදවනු ලැබුව් යයි ප්‍රකාශ කරනු ලැබූ මුදල අධික නොවන බවට

නාගරික සංවර්ධන අධිකාරියේ තත්කාර්ය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් බලය දෙනු ලැබූ යම් රජයේ නිලධරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක නිලධරයකු සෑහීමට පත්වන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි ඒ ඉදිකිරීම, මිලට ගැනීම හෝ අලුත් වැඩියා කිරීම සම්බන්ධයෙන් ඒ අධිකාරිය රජයේ නිලධරයා හෝ පළාත් පාලන ආයතනයක නිලධරයා විසින් සහතිකයක් නිකුත් කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම සහතිකයක ම පහත දැක්වෙන විස්තර ඇතුළත් විය යුතුය:-

(අ) සහතිකය සඳහා ඉල්ලුම් කරන තැනැත්තාගේ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් හෝ ලියාපදිංචි කිරීමේ අංකය:

(ආ) ඉල්ලීම අදාළ වන නිවාසය හෝ ගොඩනැගිල්ල මිලට ගත දිනය හෝ එම නිවාසය හෝ ගොඩනැගිල්ල ඉදිකිරීම හෝ අලුත්වැඩියා කිරීම ආරම්භ කළ සහ අවසන් කළ දිනය:

(ඇ) ඒ නිවාසයේ හෝ ගොඩනැගිල්ලේ (පිටත බිත්තිවල ඝණකම හැර) අභ්‍යන්තර බිම් ප්‍රදේශය, සහ එක් නිවාස ඒකකයකට වැඩි නිවාස ඒකක ගණනක් ඇතුළත් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන විට, ඒ එක් එක් ඒකකයේ (පිටත බිත්තිවල ඝණකම හැර) අභ්‍යන්තර බිම් ප්‍රදේශය:

(ඈ) ඒ නිවාසය හෝ ගොඩනැගිල ඉදි කරනු ලැබ ඇත්තා වූ ඉඩමෙහි ප්‍රමාණය සහ ඒ ප්‍රමාණය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමතය අවශ්‍ය වන අවස්ථාවක ඒ අනුමතය ලබාගෙන ඇති බව:

(ඉ) වරිපණම් අයකිරීමේ කාර්ය සඳහා ඒ නිවාසය හෝ ගොඩනැගිල්ල තක්සේරු කර ඇත්තේ ද යන වග, සහ එසේ තක්සේරු කර ඇත්තේ නම්, ඒ නිවාසය හෝ ගොඩනැගිල්ල වාසස්ථානයක් වශයෙන් හෝ වාණිජ ස්ථානයක් වශයෙන් තක්සේරු කර ඇත්තේ ද යන වග:

(ඊ) ඒ නිවාසය හෝ ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය පනතේ අර්ථානුකූලව, නාගරික සංවර්ධන ප්‍රදේශයක පිහිටා ඇත්තේ ද යන වග:

(උ) නිවාසයක් හෝ නිවාස ඒකකයක් මිලට ගැනීමක් සම්බන්ධයෙන් වන විට, විකුණුම්කරුගේ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් හෝ ලියාපදිංචි කිරීමේ අංකය:

(ඌ) අවස්ථාවෝචිත පරිදි, ඒ ඉදිකිරීම, මිලට ගැනීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් යොදනු ලැබුවේ යයි ප්‍රකාශ කරනු ලැබූ මුදල.

5. සුදුසුකම්ලත් කිසිම තැනැත්තකු-

(අ) (i) 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කාර්යවලින් යම් එක් කාර්යයක් හෝවැඩි ගණනක් සඳහා තමා විසින් යොදනු ලැබුවා වූ මුදලින් සහ 4 වන වගන්තිය යටතේ තත්කාර්යය සම්බන්ධයෙන් නිකුත් කරන ලද සහතිකයක නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන එකී මුදලින් නියෝජනය කෙරෙන ඔහුගේ අදාළ ලාභ සහ ආදායමේ යම් කොටසක් සම්බන්ධයෙන්, පිළිවෙලින් දේශීය ආදායම් පනත යටතේ හෝ ආදායම් බදු අධිභාර පනත යටතේ ගෙවිය යුතු යම් ආදයම් බද්දක් හෝ ආදයම් බදු අධිභාරයක් 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා:

(ii) (i) වන අනුඡේදයේ සඳහන් වන ඔහුගේ අදාළ ලාභවල සහ ආදායමේ යම් කොටසක් ඔහුගේ ශුද්ධ ධනයෙන් යම් කොටසක් අත්කර ගැනීම සඳහා උපයෝගී කරගනු ලැබුවා වූ ශුද්ධ ධනයේ ඒ කොටස සම්බන්ධයෙන් පිළිවෙලින් දේශීය ආදායම් පනත යටතේ හෝ ධන බදු අධිභාර පනත යටතේ හෝ ගෙවිය යුතු යම් ධන බද්දක් හෝ ධන බදු අධිභාරයක් 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා හෝ

(iii) (i) වන අනුඡේදයේ සඳහන් වන ඔහුගේ අදළ ලාභවල සහ ආදයමේ යම් කොටසක් උද්ගත වු හෝ ව්‍යුත්පන්න වූ එ කොටසින් වූ පිරි වැටුමේ ඒ කොටස සම්බන්ධයෙන් පිරිවැටුම් බදු පනත යටතේ ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දක් 1991 මාර්තු මස 31 වන දි හෝ ඉන් පෙර අවසන් යම් කාර්තුවක් සඳහා ගෙවීමට:

(ආ) (i) (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් වන ඔහුගේ අදාළ ලාභවල හෝ ආදායමෙහි කොටස හෝ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් වන ඔහුගේ ශුද්ධ ධනයේ කොටස වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයකට අදාළව දේශීය ආදයම් පනත, ආදයම් බදු අධිභාර පනත හො 'ධන බදු අධිභාර පනත යටතේ: හෝ

(ii) (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ සඳහන් වන ඔහුගේ පිරිවැටුම වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන්පෙර අවසන් වන යම් කාර්තුවකට අදාළව පිරිවැටුම් බදු පනත යටතේ

යම් වරදක් සඳහා යම් නඩු පැවරීමකට හෝ යම් දණ්ඩනයකට යටත් නොවන්නේ ය.

6. (අ) පහත සඳහන් යම් පනතක විධිවිධාන යටතේ එනම්-

(i) දේශීය ආදයම් පනත හෝ දේශීය ආදයම් අධිභාර පනත හෝ ධන බදු අධිභාර පනත, හෝ

(ii) පිරිවැටුම් බදු පනත

යටතේ අවසානාත්මක සහ තීරණාත්මක ලෙස කරනු ලැබූ යම් තක්සේරුවක්, හෝ

(ආ) එක් යම් පනතක් යටතේ අවසානාත්මක සහ තීරණාත්මක ලෙස නිශ්චය කරන ලද වෙනත් යම් කාරණයක්

ප්‍රතිශෝධනය කිරීමට මේ පනතේ ඉහතින් දැක්වූ විධිවිධාන කිසිවකින් බලය දෙනු ලබන්නේ යයි කියවා තේරුම් නොගත යුතුය.

7. වෙනත් යම් නීතියක කුමක් සඳහන් ඇත ද 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කාර්යලින් යම් කාර්යක් සඳහා, සුදුසුකම් ලත් තැනැත්තකු විසින් යොදන ලද යම් මුදලක් සම්බන්ධයෙන් දේශීය ආදායම් පනතේ 30 වන වගන්තියේ කාර්ය සඳහා කිසිම අඩුකිරීමක්, යම් තක්සේරු වර්ෂයක් සඳහා ඔහුට ඉඩ දෙනු නොලැබිය යුතුය.

8. (1) මේ පනත යටතේ වූ තම කාර්ය ඉටුකිරීමෙහිලා ලා හැර දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ හෝ නාගරික සංවර්ධන අධිකාරියේ සෑම නිලධරයකු හෝ සේවානියුක්තකයකු විසින්ම, මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු අතර එලෙස රහස්‍ය භාවය ආරක්ෂා කිරීමට සහාය දිය යුතුය.

(2) (1) වන වගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියා කරන දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ හෝ නාගරික සංවර්ධන අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය.

(3) මේ පනතේ කාර්ය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සඳහා සහ වෙනුවෙන් ක්‍රියා කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් මේ වගන්තියේ කාර්ය සඳහා බලය දෙනු ලැබූ-

(අ) යම් රජයේ නිලධරයකු, හෝ

(ආ) පලාත් පාලන ආයතනයක යම් නිලධරයකු නාගරික සංවර්ධන අධිකාරියේ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතුය.

9. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි

"කොමසාරිස් ජනරාල්වරයා", "පළාත් පාලන ආයතනය" "ලාභ සහ ආදයම" සහ "තක්සේරු වර්ෂය" යන යෙදුම්වල, පිළිවෙළින් ඒවාට දේශීය ආදයම් පනතෙහි දී ඇති අර්ථයන් ම ඇත්තේ ය,

"දේශීය ආදයම් පනත" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදයම් පනත අදහස් වේ,

"තැනැත්තා" යන්නෙන් සමාගමක්, පුද්ගල මණ්ඩලයක් සහ හවුල් ව්‍යාපාරයක් ඇතුළත් වේ,

යම් තැනැත්තකු සම්බන්ධයෙන් "අදාළ ලාභ සහ ආදායම" යන්නෙන්

(අ) 1991 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඒ තැනැත්තාට උද්ගත වූ හෝ උපචිත වූ හා ව්‍යුත්පන්න වූ, සහ

(ආ) දේශීය ආදයම් පනත යටතේ ආදයම් බදු අයකළ යුතු වූ: සහ

(ඇ) ඒ පනත යටතේ ඒ තැනැත්තා විසින් ඒ සම්බන්ධ යම් වාර්තාවක හෙළි කරනු නොලැබුවා වූ හෝ ඒ පනත යටතේ ඒ තැනැත්තා විසින් සපයනු ලැබූ යම් වාර්තාවක හෙළි කරනු නොලැබුවා වූ හෝ ඒ පනත යටතේ ඒ

සම්බන්ධයෙන් කිසිම තක්සේරුවක් කරනු ලැබ නොමැත්තා වූ යම් ලාභ සහ ආදයම අදහස් වේ:

'ආදයම් බදු අධිහාර පනත' යන්නෙන්, 1982 අංක 26 දරන ආදයම් බදු අධිහාර පනත හෝ 1984 අංක 12 දරන ආදයම් බදු අධිහාර පනත, හෝ 1989 අංක 7 දරන ආදයම් බදු අධිහාර පනත, අදහස් වේ,

'ධන බදු අධිහාර පනත' යන්නෙන් 1982 අංක 25 දරන ධන බදු අධිහාර පනත හෝ 1989 අංක 8 දරන ධන බදු අධිහාර පනත අදහස් වේ,

'පිරිවැටුම' යන්නෙන් පිරිවැටුම් බදු පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය,

'පිරිවැටුම් බදු පනත' යන්නෙන් 1981 අංක 09 දරන පිරිවැටුම් බදු පනත අදහස් වේ,

'නාගරික සංවර්ධන අධිකාරිය' යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය අදහස් වේ.

උපලේඛනය (3 (2) (අ) වගන්තිය)

1992 අංක 30 දරන බදු සමා (නිවාස සහ වාණිජ ගොඩනැගිලි) පනත

3(2) (අ) වගන්තිය යටතේ ප්‍රකාශය

ආදායම් ලිපිගොනු අංකය (ඇතොත්):..............................................................................................................

* ජාතික හැඳුනුම්පත් අංකය (පුද්ගලයකු නම්): ..................................................................................................

* ජාතික හැඳුනුම්පත් අංකය (පුද්ගලයකු නොවන්නේ නම්) ......................................................................................

..............................................................................................................

* (පුද්ගලයකු නම්): ..............................................................................................................

..............................................................................................................

ලිපිනය

මහතා/මහත්මිය/මෙනෙවිය* වන මම

* (පුද්ගලයකු නොවන්නේ නම්:..............................................................................................................

(සමාගමේ/හවුල් ව්‍යාපාරයේ/පුද්ගල මණ්ඩලයේ නම)*

..............................................................................................................

සම්පූර්ණ නම

මහතා/මහත්මිය/මෙනෙවිය වන මම.

* (අ) මා ..............................................................................................විසින් ඉදි කරන ලද
සමාගමේ/හවුල් ව්‍යාපාරයේ/පුද්ගල මණ්ඩලයේ නම)
නිවාස ඒකකවලින් සමන්විත නිවාසය/ගොඩනැගිල්ල

* (ආ) මා විසින් මිලට ගන්නා ලද නිවාස/නිවාස ඒකකය

(ඇ) මා/ ..............................................................................................විසින් ඉදිකරන ලද
(සමාගමේ/හවුල් ව්‍යාපාරයේ/පුද්ගල මණ්ඩලයේ නම)

අළුත් වැඩියා කරන ලද වාණිජ ගොඩනැගිල්ල

සම්බන්ධයෙන් 1992 අංක 30 දරන බදු සමා (නිවාස සහ වාණිජ ගොඩනැගිලි) පනතේ 4 වන වගන්තිය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද සහතිකයක් මේ සමග ඉදිරිපත් කරන අතර, එකී පනතේ අදාළ ලාභ සහ ආදායම් යන යෙදුමෙහි අර්ථානුකූලව-

* මගේ අදාළ ලාභවලින් සහ ආදායමෙන්

..............................................................................................

* (සමාගමේ/හවුල් ව්‍යාපාරයේ/පුද්ගල මණ්ඩලයේ) ආදාළ ලාභවලින් සහ ආදායමෙන්

රුපියල්(රු..............................................................................(රු...................................................) ක

(අකුරෙන්) (ඉලක්කම්වලින්)

මුදලක් ඒ ඉදිකිරීම/මිලට ගැනීම/අලුත් වැඩියා කිරීම සඳහා යොදනු ලැබූ බව ද, ඒ නිවාසයේ/නිවාස ඒකකයේ මගේ වාසස්ථානය වශයෙන් පදිංචි වන බවද,

මම/ ..............................................................................................

..............................................................................................

(සමාගමේ/හවුල් ව්‍යාපාරයේ/පුද්ගලයාගේ නම) මෙයින් ප්‍රකාශ කරමි.

මා ..............................................................................................
(සමාගමේ/හවුල් ව්‍යාපාරයේ/පුද්ගල මණ්ඩලයේ නම)

රුපියල් ........................................................ (රු...............................................................) ක මුදල
(අකුරෙන්) (ඉලක්කම්වලින්)

සම්බන්ධයෙන් එකී පනතේ 5 වන වගන්තියෙහි දක්වා ඇති මුක්තිදානයක්

මට/ ..............................................................................................
(සමාගමේ/හවුල් ව්‍යාපාරයේ/පුද්ගල මණ්ඩලයේ නම) ප්‍රදානය කරන ලෙස මම ඉල්ලා සිටිමි.

.................................. ..................................

දිනය අත්සන

## 1992 අංක 31 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 මැයි මස 27 වන දින)

**1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1 මේ පනත 1992 අංක 31 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතෙහි 48 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ඒ පනතේ 48අ වගන්තිය වශයෙන් බලසහිත විය යුතුය:-

"යන්ත්‍ර හෝ උපකරණ වෙනුවෙන් ගෙවන ලද පිරිවැටුම් බද්ද, සාදන්නකු විසින් අඩුකර ගැනීම"

48අ. (1) (මෙහි මින්මතු මේ වගන්තියෙහි "පළමුව සඳහන සාදන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ලියාපදිංචි සාදන්නකු විසින් 1991 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වනයම් කාර්තුවක් තළ, යම් භාණ්ඩයක් සෑදීමේ තම ව්‍යාපාරයෙහි දී පළමුව සඳහන් සාදන්නා විසින් පාවිච්චි කරන ලද යන්ත්‍ර හෝ උපකරණ වෙනුවෙන්-

(i) ඒ කාර්තුව තුළ ඇතුලත් වූ යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් (මෙහි මින්මතු මේ වගන්තියෙහි "දෙවනුව සඳහන් සාදන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් ලියාපදිංචි සාදන්නකුට පිරිවැටුම් බද්ද ඇතුළත් යම් මුදලක්, හෝ

(ii) ඒ කාර්තුව තුළ 12 වන වගන්තිය යටතේ රේගු බදු අධ්‍යක්ෂ ජනරාල්වරයාට යම් පිරිවැටුම් බද්දක්

ගෙවා ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එසේ ඇතුළත් කරන ලද හෝ එසේ ගෙවන ලද පිරිවැටුම් බද්ධ 47 වන වගන්තියේ හෝ 48 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද ඒ භාණ්ඩ විකිණීමෙන් උද්ගත වන ඔහුගේ පිරිවැටුම සම්බන්ධයෙන් පළමුව සඳහන් සාදන්නා විසින් ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දෙන් එසේ අඩු කරනු ලැබිය හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතුය:

එසේ වුවද,-

(අ) අඩු කරනු ලබන මුදල, එසේ ඇතුළත් කරන ලද හෝ එසේ ගෙවන ලද පිරිවැටුමෙන් සියයට පහක් නොඉක්මවිය යුතුය,

(ආ) එකී අඩුකිරීම (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව පළමුකොට, ඒ සෑදීම සඳහා ඒ යන්ත්‍ර සහ උපකරණ පාවිච්චි කිරීම ආරම්භ කරනු ලැබුවේ යම් කාර්තුවකදී ද ඒ කාර්තුවට ඉක්බිතිවම එළඹෙන කාර්තුව සඳහා වූ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ද ඉන්පසුව, ඊළඟට එළඹෙන කාර්තුව සඳහා වූ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ද යනාදි වශයෙන් කරනු ලැබිය යුතුය:

(ඇ) එසේ ඇතුළත් කරන ලද හෝ ගෙවන ලද හෝ ගෙවන ලද පිරිවැටුම් බද්ද අඩු කිරීම-

(i) ඒ පිරිවැටුම් බද්ද, බැහැර කරනු ලැබූ භාණ්ඩ සෑදීමේ යම් ව්‍යාපාරයක හෝ 4 වන වගන්තිය යටතේ පිරිවැටුම් බද්දෙන් නිදහස් යම් ව්‍යාපාරයක පාවිච්චි කරන ලද යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධයෙන් නම්,

(ii) අවස්ථාවෝචිත පරිදි එසේ ගෙවන ලද මුදල හෝ එසේ ගෙවන ලද පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් 46 (2) වන වගන්තියෙන් නියමිත පරිදි දෙවනුව සඳහන් සාදන්නාගෙන් වවුචරයක් හෝ රේගු අධ්‍යක්ෂ

ජනරාල්වරාගෙන් වවුචරයක් පළමුව සඳහන් සාදන්නා විසින් ලබා ගෙන ඇත්නම් මිස, සහ

(iii) යම් ව්‍යාපාරයක යන්ත්‍ර හෝ උපකරණ පාවිච්චි කිරීම යම් කාර්තුවක දී නතර වන්නේ නම්, ඒ කාර්තුව සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් කරනු නොලැබිය යුතුය.

(ඇ) ලියාපදිංචි සාදන්නකු වශයෙන් තම ලියාපදිංචියට පෙරාතුව යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, එසේ ඇතුළත් කරන ලද හෝ එසේ ගෙවන ලද යම් පිරිවැටුම් බදු ගෙවීමට යටත් වන්නේ යම් කාර්තුවක් සඳහා ද ඒ කාර්තුව සඳහා ගෙවිය යුතු ඒ පිරිවැටුම සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්දෙන් පළමුවෙන් ද, පසුව එළඹෙන කාර්තු සඳහා යනාදි වශයෙන් ගෙවිය යුතු පිරිවැටුම සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්දෙන් ඉන් පසුව ද අඩු කරනු ලැබිය යුතුය.

(2) අඩු කිරීම පළමුවෙන් කරනු ලැබුවේ යම් කාර්තුවක් සඳහා ද ඒ කාර්තුවේ සිට ගණන් බලනු ලබන කාර්තු විස්සෙන් එක් එක් කාර්තුව සඳහා (1) වන උපවගන්තියෙහි සඳහන් පිරිවැටුම සම්බන්ධයෙන් පිරිවැටුම් බද්දෙන් අඩු කිරීමෙන් පසුව (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව අඩු කරනු ලැබිය යුතු පිරිවැටුම් බද්දේ අතිරික්තය, 49 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ආපසු ගෙවනු ලැබිය යුතුය:

එසේ වුවද, (1) වන උපවගන්තියෙහි සඳහන් යන්ත්‍ර සහ උපකරණ මේ උපවගන්තියෙහි සඳහන් කාර්තු විස්සෙන් එක් එක් කාර්තුවේ දී (1) වන උපවගන්තියෙහි සඳහන් සැදීමේ ව්‍යාපාරයෙහි, පාවිච්චි කරනු ලැබ ඇත්නම් මිස, කිසිම ආපසු ගෙවීමක් කරනු නොලැබිය යුතුය.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1992 අංක 32 දරන ආදයම් බදු අධිභාර (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 මැයි මස 27 වන දින)

**1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1992 අංක 32 දරන ආදයම් බදු අධිභාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1989 අංක 7 දරන ආදයම් බදු අධිභාර පනතේ දීර්ඝ නාමය "පිළිවෙළින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පිළිවෙලින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ "එහෙත් 1992 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එහෙත් 1993 මාර්ත මස 31 වන දි පසු නොවී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (ii) ඡේදයේ "එහි ශේෂය ද," යන වචන වෙනුවට "එහි ශේෂය ද," යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ වගන්තිය (iii) ඡේදයේ "එහි ශේෂය ද," යන වචන වෙනුවට "එහි ශේෂය ද, සහ" යන වචන ආදේශ කිරීමෙන්,

(3) ඒ වගන්තියේ (iii) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:-

"(iv) 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ මුදලින්-

(අ) සියයට 50 කට නොඅඩු ප්‍රමාණයක් 1992 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර ද,

(ආ) 1992 නොවැම්බර් 15 වන දින හෝ එදිනට පෙර එහි ශේෂයද,

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "සියයට 71/2 ක්, සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සියයට 71/2 ක්, සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "සියයට 71/2 ක්," යන වචන සහ ඉලක්කම් වෙනුවට "සියයට 71/2 ක්, සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:

(3) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදළ වර්ෂය සඳහා ඒ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් ඒ වර්ෂය වෙනුවෙන් අඩු කරනු ලැබිය යුතු සම්පූර්ණ ආදායම් බද්දෙන් -

(i) 1992 ජූලි මාසය සඳහා ඒ සේවානියක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 71/2 ක් සහ

(ii) 1992 ඔක්තෝබර් මාසය සඳහා ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියය 71/2 ක්,'

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (ii) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

'(ii) මේ පනත යටතේ අදාළ වර්ෂයක් සඳහ අධිභාරය ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින්-

(අ) 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1988 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදයම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදයම් බද්දෙන් -

(i) 1989 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 71/2 කට නොඅඩු ප්‍රමාණයක්,

සහ

(ii) 1989 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට $7^1/_2$ කට නොඅඩු ප්‍රමාණයක්,

(ආ) 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්

(i) 1990 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 71/2 කට නොඅඩු ප්‍රමාණයක්,

සහ

(ii) 1990 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 71/2 කට නොඅඩු ප්‍රමාණයක්,

(ඇ) 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන් 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශිය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදයම් බද්දෙන්

(i) 1991 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 71/2 කට නොඅඩු ප්‍රමාණයක්, සහ

(ii) 1991 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 71/2 කට නොඅඩු ප්‍රමාණයක්,

(ඈ) 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන් 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශිය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදයම් බද්දෙන්

(i) 1992 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 71/2 කට නොඅඩු ප්‍රමාණයක්, සහ

(ii) 1992 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 71/2 කට නොඅඩු ප්‍රමාණයක්,

ඒ අධිභාරය වශයෙන් ගෙවනු ලබන අවස්ථාවක

1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1990 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර,

1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1991 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර,

1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1992 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර,

1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1993 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර,

ඔහු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණයට වැඩියෙන් ඒ අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ අතිරික්තය ඔහු විසින් ගෙවනු ලබන්නේ නම්, 3 වන වගන්තිය යටතේ කිරීමට ඔහුට නියම කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ යම් දණ්ඩනයකට ඒ තැනැත්තා යටත් නොවිය යුතුය.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1992 අංක 35 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 07 වන දින)

**දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1 මේ පනත 1992 අංක 35 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු ‘ප්‍රධාන ප්‍රඥප්තිය’ යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ඇති ‘ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ එම බැංකුවේ නිලධරයකු විසින්’ යන වචන වෙනුවට ‘ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා ලිඛිතව බලය පවරනු ලැබූ ශ්‍රී ලංකා මහා බැංකුවේ නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින්’ යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ ඇති ‘මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චය කර නියම කරනු ලැබිය හැකි වේලාවක දී හෝ වේලාවල දී එහෙත් නිකුත් කිරීමේ දින සිට එක් වර්ෂයකට පසුව නොවන කාලයක දී සම මිලට මුදල් ගෙවනු ලැබිය හැකිය’ යන වචන වෙනුවට ‘මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චය කර නියම කරනු ලැබිය හැකි වේලාවකදී හෝ වේලාවලදී සමමිලට මුදල් ගෙවනු ලැබිය හැකිය’ යන වචන වෙනුවට ‘මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චය කර නියම කරනු ලැබිය හැකි වේලාවකදී හෝ වේලාවලදී සම මිලට මුදල් ගෙවනු ලැබිය යුතුය’ යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1992 අංක 36 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 07 වන දින)

**1991 අංක 52 දරන ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1992 අංක 36 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 52 දරන ආරක්ෂක බදු පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "පිරිවැටුම් බදු පනතේ" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක්වූ සියලු වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්:-

"(පිරිවැටුම් බදු පනතේ 5 වන වගන්තියේ අර්ථානුකූලව) ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුම මත, මේ පනතේ උපලේඛනයෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව (මේ පනතෙහි මින් මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ආරක්ෂක බද්දක් අය කරනු ලැබිය යුතුය," තවද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:-

"(ආ) අපනයනය කිරීම සඳහා යම් භාණ්ඩයක් සැදීමෙහිලා ඒ තනැත්තා විසින් පාවිච්චි කිරීම සඳහා පමණක් ඒ තැනැත්තා විසින් ආනයනය කරනු ලැබූ පිරියත, යන්ත්‍රෝපකරණ හෝ තිරවුරු නොවන යම් භාණ්ඩයක වටිනාකම,

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද යම් භාණ්ඩයක් ඒ භාණ්ඩය ආනයනය කරන තැනැත්තා විසින් විකිණීමෙන් ලැබෙන මුදල, සහ

(ඇ) (i) යම් භාණ්ඩයක් ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාවෙන් අපනයනය කර ඇති බවට, ඒ භාණ්ඩය අපනයනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ යම් බැංකුවක විවෘත කරන ලද ණයවර ලිපියක් හෝ වෙනත් ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කිරීම මත කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම් හා

(ii) එකී යම් භාණ්ඩයක් අපනයනය කිරීමෙන් විදේශ විනිමයවලින් මුදල් ලැබීම, ඒ මුදල් ප්‍රේෂණය කොට ඇත්තා වූ ශ්‍රී ලංකාවේ බැංකුවක් විසින් සහතික කරනු ලැබ ඇත්නම්

ඒ භාණ්ඩය යම් අපනයනකරුවකුට විකිණීමෙන් ලැබෙන මුදල".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(අ) 1992 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට එකකට සමාන මුදලක්

(ii) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට එකකට සමාන මුදලක්, සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ

විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව, ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු බදු මුදලෙන් අඩු කරනු ලැබූ මුදල

(ආ) 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට එකකට සමාන මුදලක්

(ii) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට තුනකට සමාන මුදලක්, සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිවම ඊළඟෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව, ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු බදු මුදලෙන් අඩු කරනු ලැබූ මුදල, සහ

(ඇ) 1992 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට තුනකට සමාන මුදලක්

(ii) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට තුනකට සමාන මුදලක්, සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිවම ඊළඟෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව, ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු බදු මුදලෙන් අඩු කරනු ලැබූ මුදල,

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(අ) යම් භාණ්ඩයක ආනයනකරුවකු වන්නා වූ මේ පනත අදාළ වන යම් තැනැත්තකු විසින්, තත් කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, අදාළ කාර්තුවක යම් මාසයකදී බැංකුව විසින් යම් ණයවර ලිපියක් විවෘත කරන අවස්ථාවේදී,-

(i) මේ ඡේදය බලාත්මක වන දිනයට පෙරාතුව ඒ ණය වර ලිපිය විවෘත කොට ඇති අවස්ථාවක. ඒ ණය වර ලිපියෙහි වටිනාකමින් සියයට එකකට, සහ

(ii) මේ ඡේදය බලාත්මක වන දිනයට හෝ ඉන් පසුව ඒ ණයවර ලිපිය විවෘත කරනු ලබන අවස්ථාවක, ඒ ණයවර ලිපියෙහි වටිනාකමින් සියයට තුනකට සමාන මුදලක් ඒ තැනැත්තාගෙන් එකතු කරනු ලැබිය යුතුය, තවද"

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ "යම් තැනැත්තකු විසින් (යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක් හෝ තිරවුරු හැර) යම් භාණ්ඩයක් ආනයනය කිරීම සම්බන්ධයෙන්" යන වචන වෙනුවට, "යම් තැනැත්තකු විසින් ආනයනය කරන ලද්දා වූ හෝ පිරිවැටුම් බදු පනතේ 46 වන වගන්තියේ අර්ථානුකූලව ලියාපදිංචි කළ සාදන්නකුගෙන් මිලදී ගන්නා ලද්දා වූ හෝ යන ඒ එක් එක් අවස්ථාවේ දී එම භාණ්ඩය සැදීමේ ව්‍යාපාරය සඳහා පමණක් තනිකරම

පාවිච්චි කරනු ලබන්නා වූ (යම් පිරියතක් යන්ත්‍රෝපකරණයක් හෝ තිරවුරු නොවන) යම් භාණ්ඩයක් සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තිය අගට පහත දැක්වෙන උපලේඛනය මෙයින් එකතු කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය වශයෙන් බලසහිත විය යුතුය:-

(උපලේඛනය) (3 වන වගන්තිය)

| කාර්තුව | අනුප්‍රමාණය |
|---|---|
| 1992 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන කාර්තුව සඳහා | සියයට 1 |
| 1992 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන කාර්තුව සඳහා | සියයට 2.3 |
| පිළිවෙළින් 1992 ජුලි මස 1 වන දිනෙන් සහ 1992 ඔක්තෝබර් මස 1 වන දිනෙන් ආරම්භ වන කාර්තුව සඳහා | සියයට 3 |

7. මේ පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් සහ 5 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1992 ජුලි මස 01 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

8. 1992 මැයි මස 15 වන දිනයෙන් ආරම්භව, මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලය තුළ භාණ්ඩයක ආනයනකරුවකු විසින් ණයවර ලිපියක් විවෘත කිරීම මත, ඒ ණයවර ලිපියේ වටිනාකමින් සියයට එකක් ඉක්මවන මුදලක් යම් බැංකුවක් විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීම පිණිස ඒ ආනයනකරුගෙන් එකතු කරනු ලබන අවස්ථාවක, ඒ එකතු කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස කරනු ලැබ ඇති බවට සහ වලංගු ලෙස කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු අතර ඒ එකතු කිරීම සම්බන්ධයෙන්, ඒ බැංකුව. සිවිල් වූ හෝ අපරාධ වූ හෝ සියලු නඩුවලට එරෙහිව මෙයින් හානිපූර්ණය කරනු ලැබේ.

9. මේ පනත අදාල වන තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව වූ යම් මාසයක් හෝ කාර්තුවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාගේ ඒ මාසය හෝ කාර්තුව සඳහා වූ පිරිවැටුමෙන් සියයට එකක් ඉක්මවන මුදලක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීමට මේ පනතේ 3 වන වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙන් තියම කරනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මාසය හෝ කාර්තුව සඳහා ගෙවීමට මේ පනතේ 3 වන වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙන් ඔහුට තියම කරන ලද මුදල සහ අවස්ථාවෝචිත පරිදි, ඒ මාසය හෝ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවනු ලැබූ හෝ ගෙවනු ලැබුවේ යයි සලකනු ලබන මුදල අතර වෙනස මේ පනත ආරම්භවීමේ දින සිට දින තිහක් ඇතුළත ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තා ඒ වගන්තියේ තියමයන් අනුව ක්‍රියා කර ඇතැයි සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය. ඒ වෙනස එසේ ගෙවා නොමැති අවස්ථාවක. මේ පනත ආරම්භවීමේ දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසු, ඒ වෙනස ගෙවීම පැහැර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ප්‍රධාන ප්‍රඥප්තියේ අර්ථානුකූලව ඒ තැනැත්තා ඒ දින සිට ගෙවීම පැහැර හරිනු ලැබුවකු ලෙස සලකනු ලැබිය යුතුය.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

# 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත

සහතිකය සටහන් කළේ 1902 සැප්තැම්බර් මස 22 වන දින

අපනයන කෘෂිකර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා ද සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව අපනයන කෘෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යනුවෙන් නැවත පදවිනාමගත කිරීම සඳහාද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

1. මේ පනත 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයන් මගින්, අමාත්‍යවරයා විසින්, මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු අපනයන කෘෂිකාර්මික භෝග ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය. මේ වගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් අපනයන කෘෂි කාර්මික භෝගයක් සම්බන්ධයෙන් ද, ඒ භෝගය මෙහි මින් මතු 'නිවේදිත කෘෂිකාර්මික භෝගයක්' යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. (1) මේ පනතේ කාර්ය සඳහා නමින් හෝ ධුරයෙන් (මෙහි මින්මතු 'අධ්‍යක්ෂවරයා' යනුවෙන් සඳහන් කරනු ලබන) අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයකු ද අවශ්‍ය විය හැකි අපනයන කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් හා වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් ද පත් කරනු ලැබිය හ

(2) යම් අපනයන කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයකුගේ හෝ සහකාර අධ්‍යක්ෂ වරයකුගේ පත්වීම් ලිපියෙහි ඔහු ඒ තත්ත්වයෙන් පත් කරනු ලබන්නේ මුළු ශ්‍රී ලංකාවම සඳහාද නැතහොත් එහි යම් කොටසක් සඳහාද යන වග නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතුය.

(3) මේ පනත පරිපාලනය කිරීමෙහිලා ඉහත කී නිලධරයන්ට සහයවීම පිණිස අවශ්‍ය විය හැකි ලිපිකරු සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයද පත් කරනු ලැබිය හැකිය.

4. (1) සෑම අපනයන කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සහ සහකාර අධ්‍යක්ෂවරයකුම, ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ඔහුගේ කාර්ය කිරීමේ දී හෝ ඔහුගේ කර්තව්‍ය ඉටුකිරීමේ දී අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් විය යුතුය.

(2) සෑම අපනයන කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සහ සහකාර අධ්‍යක්ෂවරයෙකුම විසින්, අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව ඔහු පත් කරනු ලැබූ ප්‍රදේශය ඇතුළත, මේ පනතින් හෝ ඒ යටතේ අධ්‍යක්ෂවරයා වෙත පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද බලතල කාර්ය හෝ කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ කිරීම කළ හැකිය.

5. (1) අපනයන කෘෂිකර්ම භෝගයන් සම්බන්ධයෙන් 2 වන වගන්තිය යටතේ නියමයක් කරන ලද්දේ යම් දිනයකද ඒ දිනයේ සිට මාස තුනක කාලයක් ඉකුත් වූ දින සිට හා එදිනට පසු කිසිම තැනැත්තකු විසින්, ඒ තැන්තතා මේ පනතේ කාර්ය සඳහා අධ්‍යක්ෂවරයා වෙත ලියාපදිංචි වී ඇත්නම් මිස-

(අ) ඒ භෝගය ප්‍රාථමිකව සකස් කිරීමේ ක්‍රියාවලියෙහි නොයෙදිය යුතුය,

(ආ) ඒ භෝගය අමුද්‍රව්‍ය ආකාරයෙන් හෝ සකස් කළ ආකාරයෙන් තමා වෙනුවෙන් ම හෝ බ්‍රෝකර්වරයකු හෝ කොමිස් ඒජන්තවරයකු ලෙස හෝ තොග වශයෙන් මිළට ගැනීමෙහි හෝ විකිණීමෙහි නොයෙදිය යුතුය,

(ඇ) නියමිත ප්‍රමාණයට වැඩියෙන් ඒ භෝගය අමුද්‍රව්‍ය ආකාරයෙන් හෝ සකස් කළ ආකාරයෙන් වූ ප්‍රමාණයක් තමා සන්තකයේ තබාගැනීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතුය,

(ඈ) ඡේදයේ කාර්යය සඳහා ප්‍රමාණය නියම කිරීමේදී ඒ භෝගයේ පාරිභෝගිකයන්ගේ සාධාරණ අවශ්‍යතාවන් කෙරෙහි සැලකිලිමත් විය යුතුය.

(2) (අ) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් නියමිත ආකාරයෙන් හා නියමිත ආකෘතියෙහි අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, නියමිත ගාස්තුව ද ඒ ඉල්ලුම් පත්‍රය සමග එවනු ලැබිය යුතුය.

(ආ) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තකුටම, අධ්‍යක්ෂවරයා විසින් නියමිත ආකෘතියෙහි වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය.

6. නිවේදිත කෘෂිකාර්මික භෝගයක් සකස් කරන්නකු ගැනුම්කරුවකු සන්තකය දරන්නකු හෝ විකුණුම්කරුවකු ලෙස ලියාපදිංචි වී සිටින යම් තැනැත්තකුට -

(අ) ඒ භෝගය සම්බන්ධයෙන් නියමිත ආකෘතියෙහි වූ වාර වාර්තා පවත්වාගෙන යන ලෙස, සහ

(ආ) ඒ භෝගය සම්බන්ධයෙන් නියමිත යම් අන්තර් කාලවලදී හා නියමිත ආකෘතියෙහි වාර වාර්තා අධ්‍යක්ෂවරයා වෙත සපයන ලෙස

අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබිය හැකිය.

7. (1) මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා සලකන යම් තොරතුරක් සපයන ලෙස හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස දැන්වීමක් මගින් අධ්‍යක්ෂවරයා විසින් යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි අතර, ඒ දැන්වීමේ නියම අනුව ක්‍රියා කිරීම, එවැනි යම් දැන්වීමක් ලැබුණු යම් තැනැත්තකු ගේ කාර්ය විය යුතුය:

එසේ වුවද, යම් තැනැත්තකු විසින් යම් තොරතුරු අනාවරණය කිරීම හෝ යම් ලේඛන ඉදිරිපත් කිරීම යම් නීතියක විධිවිධාන මගින් තහනම් කර ඇත්නම්, එවැනි යම් තොරතුරක් අනාවරණය කරන ලෙස හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස එවැනි තැනැත්තකුට දැන්වීමක් මගින් නියම කිරීමට මේ උපවගන්තියේ ඇතුළත් කිසිවකින් බලය ලැබෙන්නේ යයි කියවා තේරුම් ගනු නොලැබිය යුතුය.

(2) 6 වන වගන්තිය යටතේ සපයන ලද වාර වාර්තාවක ඇතුළත් කිසිම තොරතුරක් සහ මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියම අනුව ක්‍රියා කිරීමෙහි ලා ඉදිරිපත් කරන ලද ලේඛනයක ඇතුළත් කරුණු හෝ සපයන ලද තොරතුරක් අවස්ථාවෝචිත පරිදි ඒ වාර වාර්තාව හෝ තොරතුර සපයන තැනැත්තාගේ නැතහොත් ලේඛනය ඉදිරිපත් කරන තැනැත්තා ගේ හෝ කැමැත්ත නොමැතිව හෝ අධ්‍යක්ෂවරයාගේ කර්තව්‍ය ඉටු කිරීමෙහිලා හෝ හැර අධ්‍යක්ෂවරයා විසින් පල කිරීම හෝ වෙනත් අයට දැනුම් දීම හෝ නොකළ යුතුය.

8. කිසියම් නිවේදිත කෘෂිකාර්මික භෝගයක් සකස් කරන හෝ ගබඩා කර ඇති නැතහොත් කිසියම් අපනයන කෘෂිකාර්මික භෝගයක් වගා කිරීමට යෝග්‍ය ඉඩමකට හෝ ගොඩනැගිල්ලකට හෝ එවැනි යම් භෝගයක් ප්‍රවාහනය කරන යම් වාහනයකට හෝ මේ පනතේ කාර්ය සඳහා ඇතුළු වීමද, මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ විධිවිධාන අනුව ක්‍රියා කරන්නේ ද යන වග හෝ මේ පනත යටතේ සපයන ලද යම් වාර වාර්තාවක හෝ තොරතුරක නිරවද්‍යතාව හෝ යම් අපනයන කෘෂි කාර්මික භෝගයක් වගා කිරීම සඳහා ඒ ඉඩමෙහි යෝග්‍යතාව හෝ නිසැකව දැනගැනීම පිණිස අවශ්‍ය විය හැකි යම් පරීක්ෂණ, සමීක්ෂණ සහ විභාග පැවැත්වීම හෝ එහි සිටින යම් තැනැත්තකුගෙන් යම් විමසීම් කිරීම හෝ අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහුගේ ලිඛිත අධිකාරය ඇතිව ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ කළ හැකිය.

9. අපනයන කෘෂිකාර්මික භෝග පිළිබඳ පර්යේෂණ කටයුතු පැවැත්වීම හා ඒ පිළිබඳව පුහුණුවක් ලබාදීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා වගකිව යුතු අතර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මෙයින් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයක් ලෙස නම් කරනු ලැබේ.

10. (1) මේ පනත හැර වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ නියම කරන ලද යම් බද්දකට අතිරේකව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට එහි පර්යේෂණ හා සංවර්ධන කර්තව්‍ය ඉටු කිරීමට හැකිවනු පිණිස, සෑම නිවේදිත කෘෂිකාර්මික භෝගයක් වෙනුවෙන්ම, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එක්හත්වය ඇතිව අමාත්‍යවරයා විසින් කරනු ලැබ ගැසට් පත්‍රයේ පළකරන නියමයකින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයක හා ප්‍රමාණයක, අපනයන කෘෂිකර්ම සෙස් බද්ද නම් වූ සෙස් බද්දක් නියම කර පනවා ගෙවනු ලැබිය යුතුය.

(2) මේ වගන්තිය මගින් නියම කරන ලද සෙස් බද්දේ ප්‍රමාණය අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් වනස් කරනු ලැබිය හැකිය, නැතහොත් ඒ යම් බද්දක් පරිච්ඡින්න කරනු ලැබිය හැකිය.

(3) අමාත්‍යවරයා විසින් මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එය යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට හානියක් නොමැතිව එහි අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) මේ වගන්තිය, රේගු ආඥාපනතේ කොටසක් වූවාක් මෙන් බලසහිත විය යුතු අතර, ඒ ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතුය.

(5) මේ වගන්තිය යටතේ අය කර ගන්නා ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල් එයින් කිසිම කොටසක් ඒකාබද්ධ අරමුදලට බැර නොකොට රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් මාසිකව අධ්‍යක්ෂවරයාට ගෙවනු ලැබිය යුතුය.

11. අධ්‍යක්ෂවරයා රජයේ ඉඩම් ආඥාපනතේ 105 වන වගන්තියේ අර්ථානුකූලව "නියමිත නිලධරයකු" ලෙස සලකනු ලැබිය යුතුය.

12. (අ) යම් අපනයන කෘෂිකාර්මික භෝගයක්, 5 වන වගන්තිය උල්ලංඝනය කරමින් සකස් කරන තමා සන්තකයේ තබාගෙන සිටින, ප්‍රවාහනය කරන, මිළදී ගන්නා හෝ අලෙවි කරන,

(ආ) 6 වන වගන්තිය යටතේ හෝ 7 වන වගන්තිය යටතේ හෝ අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබූ විට, යම් වාර්තාවක් තබා ගැනීම නැතහොත් යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් සැපයීම, යුක්ති සහගත හේතුවක් නොමැතිව පැහැර හරින,

(ඇ) 8 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරයාගේ ලිඛිත අධිකාරය ඇතිව ක්‍රියාකරන යම් තැනැත්තකුට ප්‍රතිරෝධය පාන හෝ බාධාකරන

(ඈ) තමා විසින් 6 වන වගන්තිය යටතේ පවත්වාගෙන යන්නා වූ යම් වාර්තාවක හෝ තමා වසින් 6 වන වගන්තිය හෝ 7 වන වගන්තිය යටතේ සපයනු ලබන්නා වූ යම් වාර වාර්තාවක හෝ තොරතුරක, යම් අසත්‍ය හෝ සාවද්‍ය ප්‍රකාශයක් දැනුවත්ව කරන, හෝ

(ඉ) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් අනුව ක්‍රියා කිරීම පැහර හරින සෑම තැනැත්තකුට ම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

13. මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තක්ම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මාස තුනක් නොඉක්ම වන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකකට හෝ යටත් වන්නේ ය.

14. මේ පනත යටතේ වූ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග කිසිවක් යටතේ වූ හෝ යම් වරදක් පුද්ගල මණ්ඩයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකුව සිටි සෑම තැනැත්තකුම, හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන මණ්ඩලයක් නම්, ඒ වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ සාමාජිකයෙකුව හෝ හවුල්කරුවකුව සිටි සෑම තැනැත්තකුම

ඒ වරද තමාගේ දැනීම හෝ කැමැත්ත නොමැතිව සිදු කරන ලද බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමෙහි ලා තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඔප්පු කළහොත් මිස, ඒ වරදට වරදකරු යයි සලකනු ලැබිය යුතුය.

15. (1) පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සඳහා හෝ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය:

(අ) නිවේදිත කෘෂිකාර්මික භෝග වගාකරුවන් සමඟ ඒ භෝග වගා කිරීම සම්බන්ධයෙන් ඇතුළත් විය යුතු ගිවිසුම්වල ආකෘතිය නියම කිරීම,

(ආ) නිවේදිත කෘෂිකාර්මික භෝග වගාකරුවන් සඳහා ව්‍යාප්ති සේවා සැපයීමට විධිවිධාන සැලසීම,

(ඇ) නිවේදිත කෘෂිකාර්මික භෝග වගා කරන සහ සකස් කරන තැනැත්තන්ට, සහනාධාර සහ මූල්‍යමය හෝ අන්‍යාකාර වූ වෙනත් ආධාර ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රම සඳහා විධිවිධාන සැලසීම,

(ඈ) නිවේදිත කෘෂිකාර්මික භෝග වගාව, සැකසීම සහ අලෙවිය සම්බන්ධයෙන් තැනැත්තන් පුහුණු කිරීමේ සහ ඒ භෝග වගාව සැකසීම හා අලෙවිය පිළිබඳ තොරතුරු බෙදා හැරීමේ යෝජනා ක්‍රම සඳහා විධිවිධාන සැලසීම,

(ඉ) නිවේදිත කෘෂිකාර්මික භෝග අනුකූල විය යුතු ගුණාත්මක භාවය පිළිබඳ ප්‍රමිති නියම කිරීම

(ඊ) මේ පනත යටතේ නියම කළ යුතු යයි නියමිත යම් කාරණයක් සඳහා හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ බලය දී ඇති යම් කාරණයක් සඳහා විධිවිධාන සැලසීම.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයෙහ හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එහි අනනුමතයේ දින සිට, එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවක වලංගු භාවයට ඉන් හානියක් නොමැතිව පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලැබිය යුතුය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

16. යම් ලිඛිත නීතියක විධිවිධානයක හෝ යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියම කරන ලද හෝ බලය දෙන ලද යම් දැන්වීමක, බලපත්‍රයක, නිවේදනයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක "සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව" යන යෙදුම දැක්වෙන සෑම තැනකම, ඒ වෙනුවට, "අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු අතර, ඒ අනුව, එවැනි යම්

විධිවිධානයක "සුළු අපනයන භෝග අධ්‍යක්ෂවරයා" යන යෙදුම දැක්වෙන සෑම තැනකම ඒ යෙදුම "අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා" සම්බන්ධයෙන් වූ සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතුය.

17. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව සුළු අපනයන භෝග අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහුගේ වාසියට සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද සෑම ගිවිසුමක්ම, එකඟවීමක් ම වෙනත් කවර වූ හෝ සාධන පත්‍රයක් නැතහොත් ලේඛනයක් ම, ඒ දිනයේ සිට සහ ඉන් පසුව, අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහුගේ වාසියට වූ හෝ ඔහු විසින් හෝ ඔහුගේ වාසියට සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද සේ සලකනු ලැබිය යුතුය.

18. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි

"අපනයන කෘෂිකර්ම භෝගය" යන්නෙන්, තේ, රබර්, පොල් සහ කජු නොවන්නා වූ ද මුළු වාර්ෂික නිෂ්පාදනයෙන් යටත් පිරිසෙයින් සියයට පනහක් හෝ අපනයනය කරනු ලබන්නා වූ ද, කවර හෝ වාර්ෂික භෝගයක් අදහස් වේ,

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ.

# 1992 අංක 49 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 04 වන දින)

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1992 අංක 49 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධිත) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ දීර්ඝ නාමය එහි 'මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව' යන වචන සහ 'එකී කොමිෂන් සභාව' යන වචන වෙනුවට පිළිවෙලින් 'ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය' සහ 'එකී මණ්ඩලය' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව හැඳින්වීම සඳහා යොදනු ලබන 'මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව' යන වචන සහ 'කොමිෂන් සභාව' යන වචන වෙනුවට පිළිවෙලින් 'ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය' සහ මණ්ඩලය' යන වචන ආදේශ කරනු ලැබිය යුතුය.

(2) යම් දැන්වීමක, ගිවිසුමක, සංනිවේදනයක හෝ වෙනත් යම් ලේඛනයක මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව' හෝ 'කොමිෂන් සභාව' යන සෑම සඳහන් කිරීමක් ම පිළිවෙලින්, 'ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය' සහ 'මණ්ඩලය' ගැන කරන ලද සඳහනක් සේ කියවා තේරුම් ගත යුතුය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

'(1) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් පස් දෙනකුගෙන් මණ්ඩලය සමන්විත විය යුතු අතර, ඒ සාමාජිකයන්ගෙන් එක්කෙනකු මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ද තවත් සාමාජිකයකු මණ්ඩලයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ලෙස ද පත් කරනු ලැබිය යුතුය.' සහ

(2) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ 'අධ්‍යක්ෂ ජනරාල් ට හෝ වෙන යම් සාමාජිකයකුට' යන වචන වෙනුවට 'අධ්‍යක්ෂ ජනරාල්ට හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ට හෝ වෙන යම් සාමාජිකයකුට' යන වචන ආදේශ කිරීමෙන්.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

'(2) අධ්‍යක්ෂ ජනරාල් මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු අතර, යම් රැස්වීමක් සඳහා අධ්‍යක්ෂ ජනරාල් පැමිණ නොමැති විටක අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඒ රැස්වීමේ අධ්‍යක්ෂ මුලසුන දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා අධ්‍යක්ෂ ජනරාල් සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් යන දෙදෙනාම පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතුය.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි 'අධ්‍යක්ෂ ජනරාල්' යන වචන වෙනුවට 'අධ්‍යක්ෂ ජනරාල් හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. මෙහි පහත දැක්වෙන වගන්තිය 20 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර එය 20අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:-

20අ. (1) යම් බලපත්‍රලත් ව්‍යවසායක ව්‍යාපාරය සඳහා අවශ්‍ය ගොඩනැගිලි සඳහා සැලසුම් අනුමත කිරීම හෝ ඒ බලපත්‍රලත් ව්‍යවසායේ ව්‍යාපාරය පිහිටුවීම, ආරම්භ කිරීම හෝ කරගෙන යාම සඳහා නියමිත යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක්, හෝ අධිකාරයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් මගින් පැවරී ඇති පැනවී ඇති හෝ භාර කොට ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාවේ යෙදීමට, කිරීමට හෝ ඉටුකිරීමට යම් නීතියකින් බලය පවරා ඇති තැනැත්තා පුද්ගල මණ්ඩලය හෝ අධිකාරිය ගැන කර තිබෙන සඳහන, මණ්ඩලය ගැන කර තිබෙන සඳහනක් වූවාක් සේ, මණ්ඩලය විසින් යම් බලපත්‍රලත් ව්‍යවසායක් සම්බන්ධයෙන්, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම, කිරීම හෝ ඉටු කිරීම නීත්‍යනුකූල වන්නේය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් බලතල කාර්ය හා කර්තව්‍යවලට අමතරව, බලපත්‍රලත් කලාපයෙන් බාහිරව පිහිටි බලපත්‍රලත් ව්‍යවසාය හා සම්බන්ධව, මෙහි "ඇ" හා "ඇ" උපලේඛන වල නිශ්චිතව දක්වා ඇති ලිඛිත නීතිවලින් යම් තැනැත්තකුට, පුද්ගල මණ්ඩලයකට හෝ අධිකාරයකට පැවරී ඇති, පැනවී ඇති හෝ භාරකොට ඇති සියලු බලතල කාර්ය හා කර්තව්‍ය, ක්‍රියාවේ යෙදීමට, කිරීමට හෝ ඉටු කිරීමට ඒ ලිඛිත නීතියෙන් බලය පවරා තිබෙන තැනැත්තා පුද්ගල මණ්ඩලය හෝ අධිකාරය ගැන කර තිබෙන සඳහන, මණ්ඩලය ගැන කර තිබෙන සඳහනක් වූවාක් සේ, මණ්ඩලය විසින් ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් ක්‍රියාවේ යෙදිය හැකි ද, කළ හැකිද, ඉටු කළ හැකිද වන්නේ ය:

එසේ වුවද, ජාතික පාරිසරික පනත යටතේ වූ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, ඒ පනත යටතේ සංස්ථාපනය කර ඇති මධ්‍යම පාරිසරික අධිකාරිය විමසා සහ ඒ අධිකාරියේ එකඟත්වය ඇතිව මිස මණ්ඩලය විසින් ක්‍රියාවේ යෙදීම , කිරීම හෝ ඉටු කිරීම නොකළ යුතුය."

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය එහි ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:-

26අ. 1988 අංක 79 දරන පනතින් සංශෝධිත පරිදි වූ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 664 වන වගන්තිය යටතේ යම් වාරණ නියෝගයක්, එනම්:-

(අ) මේ පනතින් මණ්ඩලය වෙත පවරා ඇති පනවා ඇති හෝ භාර කොට ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී නැත්හොත් සද්භාවයෙන් උද්දේශිත ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී, යම් කාරණයක් හෝ දෙයක් කරගෙන යාමෙන් මණ්ඩලය නතර කරන හෝ වළක්වාලන, හෝ

(ආ) මේ පනතින් මණ්ඩලය වෙත පවරා ඇති පනවා ඇති හෝ භාර කොට ඇති බලතල කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේදී හෝ ඉටු කිරීමේ දී නැතහොත් සද්භාවයෙන් උද්දේශිත ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේදී බලපත්‍රලත් යම් ව්‍යවසායක් විසින් විසින් හෝ ප්‍රදේශ ව්‍යවසායක් විසින් කර ගෙන යනු ලැබීමට මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ, බලපත්‍ර දෙනු ලැබූ හෝ අවසර දෙනු ලැබූ යම් කාරණයක් හෝ දෙයක් කරගෙන යාමෙන් ඒ බලපත්‍රලත් ව්‍යවසාය හෝ ප්‍රදේශ ව්‍යවසාය හෝ එහි අයිතිකරු හවුල්කරු, අධ්‍යක්ෂ, කළමනාකරු, අනුයෝජිත, නිලධරයකු හෝ සේවකයකු හෝ ඒ බලපත්‍රලත් ව්‍යවසාය හෝ ප්‍රදේශ ව්‍යවසාය සඳහා යම් වැඩක් හෝ සේවයක් ඉටු කරන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් නතර කරමින් හෝ වළක්වාලමින් ඒ ව්‍යවසායට හෝ ප්‍රදේශ ව්‍යවසායට, එහි අයිතිකරුට, හවුල්කරුට, අධ්‍යක්ෂට, කළමනාකරුට, අනුයෝජිතයාට,

නිලධරයාට, සේවකයාට හෝ තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට

විරුද්ධව වාරණ නියෝගයක් නිකුත් කිරීම, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය එකී බලපත්‍රලත් ව්‍යවසාය හෝ ප්‍රදේශ ව්‍යවසාය, අයිතිකරු, හවුල් කරු, අධ්‍යක්ෂ, කළමනාකරු, අනුයෝජිත නිලධරයා, සේවකයා හෝ ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය වෙත දැන්වීම් භාර කොට, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයට, ඒ බලපත්‍රලත් ව්‍යවසායට, ප්‍රදේශ ව්‍යවසායට, අයිතිකරුට, හවුල්කරුට, අධ්‍යක්ෂට, කළමනාකරුට, අනුයෝජිතයාට, නිලධරයාට, සේවකයාට හෝ ඒ තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට සවන් දීමෙන් පසුව මිස, නොකළ යුතුය.

9. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර මණ්ඩලය විසින් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත පවරා තිබුණු බලතල හෝ කාර්ය කිසිවක් ප්‍රකාර ක්‍රියාත්මක කරන ලද හෝ ඉටු කරන ලද නැතහොත් ඒසේ ක්‍රියාත්මක කරන ලදැයි හෝ ඉටු කරන ලදැයි පරිකල්පිත බලතල හෝ කාර්ය, වලංගු ලෙස ක්‍රියාත්මක කර තිබුණු සහ ඉටුකර තිබුණු හා වලංගුව පවතින ඒවා ලෙස සලකනු ලැබිය යුතුය.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීමේ (සංශෝධන) පනත.

(සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින)

**1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 5 වන වගන්තිය එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4) (1) වන උපවගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, කම්කරුවකුට හෝ ඔහුගේ උරුමක්කාරයන්ට පාරිතෝෂිකයක් වශයෙන් අයවිය යුතු යම් මුදලක් ගෙවීමට යටත්ව සිටින්නා වූ ද එම මුදල නියමිත දිනයේ දී හෝ ඉන්පෙර ගෙවීමට අපොහොසත් වන්නා වූ ද නැතහොත් පැහැර හරින්නා වූද යම් සේවා යෝජකයකු පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලට අතිරේකව, එම මුදල මත පහත දැක්වෙන පරිදි ගණන් බලනු ලබන අධිභාරයක්, අවස්ථාවෝචිත පරිදි එම කම්කරුවාට හෝ ඔහුගේ උරුමක්කාරයන්ට ගෙවීමට යටත් විය යුතුය:-

(අ) පාරිතෝෂිකය ගෙවීම, නියමිත දිනයේ සිට මාස එකකට නොවැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට දහයක අධිභාරයක්,

(ආ) පාරිතෝෂිකය ගෙවීම, නියමිත දිනයේ සිට මාස එකකට වැඩි නමුත් මාස තුනකට නොවැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක, පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට පහළොවක අධිභාරයක්,

(ඇ) පාරිතෝෂිකය ගෙවීම, නියමිත දිනයේ සිට මාස තුනකට වැඩි නමුත් මාස හයකට නොවැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක, පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට විස්සක අධිභාරයක්,

(ඈ) පාරිතෝෂිකය ගෙවීම, නියමිත දිනයේ සිට මාස හයකට වැඩි නමුත් මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක, පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට විසිපහක අධිභාරයක්,

(ඉ) පාරිතෝෂිකය ගෙවීම, නියමිත දිනයේ සිට මාස දොළහකට වැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක, පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට තිහක අධිභාරයක්,

මේ වගන්තියේ කාර්ය සඳහා පාරිතෝෂිකයක් සම්බන්ධයෙන් "නියමිත දිනය" යන්නෙන්, පාරිතෝෂිකය ගෙවනු ලැබිය යුතු කම්කරුවාගේ සේවාවන් අවසන් කරනු ලැබූ දින සිට තිස්වන දිනය අදහස් වේ."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(8) මේ වගන්තියේ කාර්ය සඳහා "පාරිතෝෂිකය" යන්නට 5 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු යම් අධිභාරයක් ඇතුළත් වේ.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

# 1992 අංක 63 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 18 වන දින)

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1992 අංක 63 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු 'ප්‍රධාන ප්‍රඥප්තිය' යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ, (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ LX) වන අනුඡේදයේ 'ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, සහ' යන වචන වෙනුවට 'ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය' යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ ඡේදයේ (LXI) වන අනුඡේදයේ 'පිහිටුවන ලද රබර් පර්යේෂණ මණ්ඩලය. තව ද' යන වචන වෙනුවට 'පිහිටුවන ලද රබර් පර්යේෂණ මණ්ඩලය, සහ' යන වචන ආදේශ කිරීමෙන්, තවද

(3) ඒ ඡේදයේ (LXI) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන්:-

'(LXII) 1990 අංක 35 දරන බුද්ධ ශාසන පනතින්
පිහිටුවන ලද බුද්ධ ශාසන අරමුදල.'

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ක) ඡේදයේ 'ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය, සහ' යන වචන වෙනුවට 'ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.' යන වචන ආදේශ කිරීමෙන්

(2) ඒ උපවගන්තියේ (ග) ඡේදයේ 'ව්‍යුත්පන්න වූ ආදායම නියෝජනය කරනු ලබන කොටස' යන වචන වෙනුවට 'ව්‍යුත්පන්න වූ ආදායම නියෝජනය කරනු ලබන කොටස, සහ' යන වචන ආදේශ කිරීමෙන්, තවද

(3) ඒ උපවගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:-

'(ඩ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ඇති කරන ලද යම් සමාගමක යම් සේවානියුක්තියකින් යම් සේවානියුක්තයකු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඔහුට ගෙවන ලද 4 (1) වන වගන්තියේ (ඇ) ඡේදයේ (1) වන අනුඡේදයෙහි සඳහන් අවස්ථාවෝචිත පරිදි, යම් රාජ්‍ය සංස්ථාවක හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතනයක සේවා කාලයකට ආරෝපණය කරනු ලබන යම් මුදලක කොටස.'

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ආ) ඡේදයේ '16අ වන, 16ආ වන, 17 වන, 17අ වන' ඉලක්කම් සහ වචන වෙනුවට '16අ වන, 16ආ වන, 16ඇ වන, 17 වන, 17අ වන' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදයේ (XXI) වන අනුඡේදයේ 'නිල ලැයිස්තුගත සමාගමක යම් කොටසක් යම් තැනැත්තකු විසින් අත්කර ගැනීමේ දින සිට එක් අවුරුද්දකට පසුව ඒ කොටසෙහි' යන වන වෙනුවටද 'නිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (ක) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(කක) ස්වර්ණාභරණ අපනයන කිරීමෙන් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම,"

(2) ඒ වගන්තියේ (ප) ඡේදයෙහි "යම් නිල ලැයිස්තුගත" යන වචන සිට "ලාභ සහ ආදායම" දක්වා වූ වචන සහ ඉලක්කම් වෙනුවට" යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර විකිණීමෙන් යම් තැනැත්තකුට ව්‍යුත්පන්න වූ හෝ උපචිත වන 3 වන උපවගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල යම් ලාභ සහ ආදායම, සහ" යන වචන ආදේශ කිරීමෙන්,

(3) ඒ වගන්තියේ (ප) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:-

"(බ) අවස්ථාවෝචිත පරිදි ලලිත කලා, සාහිත්‍ය හෝ ක්‍රීඩා විෂයය භාර අමාත්‍යවරයාගෙන් කලින් ලබා ගත් ලිඛිත අනුමතය ඇතිව කරන ලද ප්‍රදානයක් වන්නා වූ ලලිත කලා සාහිත්‍යය හෝ ක්‍රීඩා ක්ෂේත්‍රයෙහි තම විශිෂ්ටත්වය පිළිගැනීමෙහි ලා ප්‍රදාන යක් හෝ ප්‍රදාන වශයෙන් යම් පුද්ගලයකු විසින් 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී භාර ගන්නා ලද රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ යම් මුදලක හෝ මුදල්වල එකතු වන කොටස,"

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 15අ වගන්තිය වශයෙන් බලසහිත විය යුතුය:

15අ. යම් වාසික ආගන්තුකයකුගේ ශ්‍රී ලංකාවේ දී ලැබෙන හෝ ව්‍යුත්පත්ත වූ ලාභ සහ ආදායම නොවන්නා වූ ලාභ සහ ආදායම, ආණ්ඩුව විසින් අනුමත කරනු ලැබුවා වූ යම් වාසික ආගන්තුක ක්‍රමයක් යටතේ ඒ වාසික ආගන්තුකයා ලියා පදිංචි කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂය ආරම්භයේ සිට වර්ෂ පහක කාලසීමාවක් සඳහා ඔහු ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය:

එසේ වුවද ඒ වර්ෂ පහක කාලසීමාව අවසන් විමට පෙරාතුව එම වාසික ආගන්තුකයාට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කොට ඇති අවස්ථාවක ඒ වාසික ආගන්තුකයාට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කරනු ලැබූ දිනයෙන් ආරම්භ වන කාලසීමාව සඳහා ඔහුගේ එම ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් නොකළ යුතු ය."

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 16ආ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙළින් ඒ ප්‍රඥප්තියේ 16ඇ වගන්තිය සහ 16ඈ වගන්තිය වශයෙන් බලසහිත විය යුතුය:-

16ඇ (1) සංචාරකයන් සඳහා යම් හෝටලයක් මෙහෙයවන්නා වූ සහ-

(i) (1981 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ව්‍යාපාරය කර ගෙන යාමට ආරම්භ කරනු ලැබුවා වූ යම් ව්‍යවසායක් හැර) 16 වන වගන්තියේ (අ) ඡේදයේ, හෝ

(ii) 16අ වගන්තියේ

සඳහන් වන්නා වූ යම් ව්‍යවසායක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම වර්ෂ පහක කාල සීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වර්ෂ පහක කාලසීමාව-

(අ) ඒ ව්‍යවසාය (1) වන උපවගන්තියේ (1) වන ඡේදයේ සඳහන් ව්‍යවසායක් වන අවස්ථාවක, 1992 අප්‍රේල් මස 1 වන දින සිට ගණන් ගනු ලැබිය යුතුය:

එසේ වුව ද 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසායේ ලාභවලින් සහ ආදායමෙන් 29 වන වගන්තිය යටතේ අඩුකර ගත හැකි ඒ ව්‍යවසායට අරෝපණය කරනු ලබන යම් පාඩුවක ප්‍රමාණය ඒ ලාභ සහ ආදායම ඉක්මවන්නා වූ හෝ ඊට සමාන වන්නා වූ අවස්ථාවක, වර්ෂ පහක කාලසීමාව 1993 අප්‍රේල් මස 1 වන දින සිට ගණන් ගනු ලැබිය යුතුය:

එසේම තවදුරටත් 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසායේ ලාභවලින් සහ ආදායමෙන් 29 වන වගන්තිය යටතේ අඩු කරනු ලැබිය හැකි යම් පාඩුවක ප්‍රමාණය ඒ ලාභ සහ ආදායම ඉක්මවන්නා වූ හෝ ඊට සමාන වන්නා වූ අවස්ථාවක වර්ෂ පහක කාලසීමාව 1994 අප්‍රේල් මස 1 වන දින සිට ගණන් ගනු ලැබිය යුතුය,

(ආ) ඒ ව්‍යවසාය 16අ වගන්තියෙහි සඳහන් ව්‍යවසායක් වන අවස්ථාවක, වර්ෂ පහක කාලසීමාව ඒ වගන්තියේ සඳහන් වර්ෂ දහයක කාලසීමාව අවසන් වන තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට ගණන් ගනු ලැබිය යුතුය.

16ඇ. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් නිශ්චිත ව්‍යවසායක අදාළ ලාභ සහ ආදායම (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ සඳහන් නිදන කාමරවලින් දහය කට නොඅඩු සංඛ්‍යාවක් ඉදිකොට ඇති බවට ලංකා සංචාරක මණ්ඩලය විසින් සහතික කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට වර්ෂ පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා-

(අ) "නිශ්චිත ව්‍යවසාය" යන්නෙන් සංචාරකයන් සඳහා යම් හෝටල් මෙහෙයවන්නා වූ සහ-

(i) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 6(1)(v) වන වගන්තිය යටතේ හෝ මේ පනතේ 16 වන වගන්තියේ (අ) ඡේදය යටතේ හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ,

(ii) 1981 අප්‍රේල් මස 1 වන දින පෙරාතුව ව්‍යාපාරය කරගෙන යාමට ආරම්භ කරනු ලැබුවා වූ,

(iii) නිදන කාමර දහයකට නොඅඩු සංඛ්‍යාවක් ඉදිකිරීම ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූද 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ඉදිකිරීම ආරම්භ කරනු ලැබුවේ යයි ද 1994 අප්‍රේල් මස 01 වන දිනට පෙර ඉදි කරනු ලැබුවේ යයිද ලංකා සංචාරක මණ්ඩලය විසින් සහතික කරනු ලැබ ඇත්තා වූ,

(iv) 1992 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වූ වර්ෂය තුළ ඒ

ව්‍යවසාය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාවට වඩා සේවා නියුක්තයන් විසිපස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් (1) වන උප වගන්තියෙහි සඳහන් වර්ෂ පහ ආරම්භයේ දී සේවයෙහි නියුක්ත කරන්නා වූ සහ ඒ කාලසීමාව අවසන් වන තෙක් ඒ ලෙස නොකඩවා සේවයෙහි නියුක්ත කරන්නා වූ යම් ව්‍යවසායක් අදහස් වේ.

මේ අනුඡේදයේ කාර්ය සඳහා සේවානියුක්තයන් සම්බන්ධයෙන් වන විට "සාමාන්‍ය සංඛ්‍යාව" යන්නෙන්, ඒ වර්ෂය මුළුල්ලේ එක් එක් දිනයෙහි ඒ ව්‍යවසායෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තයන්ගේ මුළු එකතුව තුන්සිය හැට පහෙන් බෙදීමෙන් ලැබුණු සංඛ්‍යාව අදහස් වේ,

ව්‍යවසායක් සම්බන්ධයෙන් වන විට "සේවානියුක්තයා" යන්නෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ යම් අර්ථසාධක අරමුදලකට එ ව්‍යවසාය විසින් අඛණ්ඩව දායක මුදල් ගෙවනු ලබන්නේ ඒ ව්‍යවසායේ යම් ස්වානියුක්තයකු වෙනුවෙන් ද එවැනි යම් සේවානියුක්තයකු අදහස් වේ,

(ආ) යම් නිශ්චිත ව්‍යවසායක් සම්බන්ධයෙන් වන විට සහ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට "අදාළ ලාභ සහ ආදායම" යන්නෙන්, (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ සඳහන් නිදන කාමර සංඛ්‍යාවට ඒ ව්‍යසායේ මුළු නිදන කාමර සංඛ්‍යාව දරනු අනුපාතයම වන අනුපාතයක්, යම් මුදල් ප්‍රමාණයක්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසායේ (ප්‍රාග්ධන වත්කම් බැහැර කිරීමෙන් ලබන ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභවලට සහ ආදායමට දරන්නේ ද, එම මුදල් ප්‍රමාණය අදහස් වේ."

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "ඒ සමාගම විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු පහක කාලයකට" යන වචන වෙනුවට "ඒ සමාගම විසින් යම් වර්ෂයක ස්වකීය ගනුදෙනු සම්බන්ධයෙන් ලාභ අත්කර ගැනීමට ආරම්භ කරනු ලැබුවේ ද ඒ වර්ෂයේ සිට ගණින් බලනු ලැබූ වර්ෂ පහක කාලයකට" යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි-

(අ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "සැලසීම සඳහා වූ ව්‍යවසායක්, හෝ" යන වචන වෙනුවට "සැලසීම සඳහා වූ ව්‍යවසායක්," යන වචන ආදේශ කිරීමෙන්,

(ආ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ "පුරෝගාමී ස්වභාවයෙන් වූ ව්‍යවසායක්" යන වචන වෙනුවට "පුරෝගාමී ස්වභාවයෙන් වූ ව්‍යවසායක්, හෝ" යන වචන ආදේශ කිරීමෙන්, සහ

(ඇ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(iv) මුහුදෙහි බේරාගැනීමේ සහ ඇදීමේ, සෝදිසි කිරීමේ සහ ගලවා ගැනීමේ ඇතුළුව අක්වෙරළ සමුද්‍රීය සේවාවන් සැලසීම සඳහා පුරෝගාමී ස්වභාවයකින් වූ ව්‍යවසායක්."

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඇ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "ගිවිසුමකට එළඹ ඇත්තා වූ යම් ව්‍යවසායකට" යන වචන වෙනුවට "ගිවිසුමකට එළඹ ඇත්තා

වූ බදු හෝ යම් වෙළඳ ද්‍රව්‍ය අපනයනය කිරීමෙහි ලා නිරත යම් ව්‍යවසායකට' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇඇඇ වගන්තියේ (2) වන උපවගන්තියේ 'බඩු නිෂ්පාදනය කිරීමෙහි හෝ අපනයනය කිරීමෙහි නිරත වන' යන වචන වෙනුවට 'බඩු නිෂ්පාදනය කිරීමෙහි, බඩු අපනයනය කිරීමෙහි හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් සේවයක් සැලසීමෙහි නිරත වන' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (ඌඌ) ඡේදයේ '1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්' යන ඉලක්කම් සහ වචන වෙනුවට '1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්, සහ

(2) ඒ උපවගන්තියේ (ඹ) ඡේදයේ 'යම්-

(1) 1963 අංක 11 දරන 'යන වචන සහ ඉලක්කම් සිට '1991 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ගෙවිය යුතු වූ ද බද්දක්:' තෙක් වූ සියලු වචන සහ ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කරන්න:-

'(ඹ) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් ලාභ සහ ආදායම් නිශ්චය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව සම්බන්ධයෙන් ඒ තැනැත්තා ගෙවීමට යටත්-

(i) 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක්; හෝ

(ii) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 47 වන වගන්තිය හෝ 48 වගන්තිය හෝ 48අ වගන්තිය යටතේ ඉඩ දෙනු ලබන යම් අඩුකිරීමක් අඩුකිරීමෙන් පසුව ඒ පනත යටතේ ගෙවිය යුතු පිරිවැටුම් බද්දක්, හෝ

(iii) පිළිවෙලින් (i) වන අනුඡේදයෙහි හෝ (ii) වන අනුඡේදයෙහි සඳහන් කරනු ලැබ ඇති ව්‍යාපාර පිරිවැටුම් බද්දට අනුරූප වන්නාවූ ද යම් පලාත් සභාවක් විසින් පනවනු ලැබූ යම් ප්‍රඥාප්තියක් යටතේ 1991 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ගෙවිය යුතු වූ ද බද්දක්:'

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ '16අ වගන්තිය හෝ 17අ වගන්තිය' යන ඉලක්කම් සහ වචන වෙනුවට '16අ වගන්තිය හෝ, 16ඈ වගන්තිය හෝ 17අ වගන්තිය' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්, සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

'(3අ) 16 වන වගන්තියේ (අ) ඡේදයේ සඳහන් කොට ඇත්තා වූ 16ඈ

වගන්තියේ විධිවිධාන අදාල වන්නාවූ ද යම් ව්‍යාවසායක් විසින් 16ඈ (1) වන වගන්තියේ සඳහන් වර්ෂ පහක කාලසීමාව ආරම්භ කිරීමට පෙරාතුව යම් පාඩුවක් විඳ ඇති අවස්ථාවක ඒ වර්ෂ පහක කාලසීමාව ආරම්භ වීමට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ව්‍යාවසාය කරගෙන යන තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් 'ඒ පාඩුව හෝ ඒ පාඩුවේ යම් පංගුවක් අඩුකරනු ලැබ නොමැති නම් ඒ වර්ෂ පහක තක්සේරු කාල සීමාවේ යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ව්‍යාවසායේ ලාභවලින් සහ ආදායමෙන් සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදයමෙන් අඩු කරනු ලැබිය හැකි ප්‍රමාණයට ඒ පාඩුව හෝ ඒ පංගුව අඩු කළ යුතුය:

එසේ වුව ද,-

(i) ඒ අඩුකිරීම 16ඈ (1) වන වගන්තියෙහි සඳහන් තක්සේරු වර්ෂ පහේ පළමුවන තක්සේරු වර්ෂය සඳහා ඒ ලාභවලින් සහ ආදායමෙන් සහ මුළු ව්‍යවස්ථාපති ආදායමෙන් පළමුවෙන් කරනු ලැබිය යුතුය,

(ii) යම් තක්සේරු වර්ෂයක් සඳහා අඩු කිරීම පළමුවෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යාවසායේ ලාභවලින් සහ ආදායමෙන් කරනු ලැබිය යුතු අතර, ඉන්පසුව ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතුය,

(iii) යම් තක්සේරු වර්ෂයක් සඳහා අඩු කිරීම ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යාවසායේ ලාභවල සහ ආදයමේ සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම එකතුව ඉක්මවන්නා වූ අවස්ථාවක එම අතිරික්තය ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යාවසායේ ලාභවලින් සහ ආදායමෙන් සහ ඉන්ඉක්බිතිවම එළඹෙන වර්ෂය සඳහා යනාදී වශයෙන් ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතුය.'

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(i) ඒ උපවගන්තියේ (අඅඅ) ඡේදයේ '1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්' යන ඉලක්කම් සහ වචන වෙනුවට '1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව වන එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(ii) ඒ උපවගන්තියේ (අඅඅ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

'(අඅඅඅ) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් හතලිස් දෙදහසක දීමනාවක්,' සහ

(iii) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ '(අඅ) ඡේදයෙහි හෝ (අඅඅ) ඡේදයෙහි හෝ සඳහන්' යන වචන වෙනුවට '(අඅ) ඡේදයෙහි හෝ (අඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅ) ඡේදයෙහි සඳහන්' යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(i) ඒ උපවගන්තියේ පළමුවන අතුරු වගන්තියේ (ඉ) ඡේදයේ '1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්' යන ඉලක්කම් සහ වචන වෙනුවට '1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(ii) ඒ උපවගන්තියේ පළමුවන අතරු වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්,

'(ඊ) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් හතළිස් දෙදහසක දීමනාවක්,'

(iii) ඒ උපවගන්තියේ දෙවන අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන්:-

'එසේ වුව ද, සේවානියුක්තයන් විසින් පමණක් දායක මුදල් ගෙවනු ලබන්නා වූ යම් සකසුරුවම් ඉතිරි කිරීමේ හෝ ගොඩනැගිලි සමිතියක හෝ සුභසාධක අරමුදලක යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ යුතු ආදායම-

(i) ඒ තක්සේරු වර්ෂය 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, රුපියල් විසිහත් දහසකට, සහ

(ii) ඒ තක්සේරු වර්ෂය 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, රුපියල් හතළිස් දෙදහසකට සමාන දීමනාවක් එයින් අඩු කිරීමෙන් පසුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමිතියේ හෝ අරමුදලේ තක්සේරු කළ යුතු ආදායම විය යුතුය.'

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඈ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්නා:-

'(ඈ) (ට) ඡේදයේ සඳහන් අනුමත ව්‍යාවසායක් නොවන, අනුමත ව්‍යාවසායක පවත්නා, කොටස් හැර සාමාන්‍ය කොටස් මිලදී ගැනීමෙහිලා යම් තැනැත්තකු විසින් ආයෝජනය කරන ලද යම් මුදලක්:

එසේ වුව ද ඒ ව්‍යාවසාය මේ වගන්තියේ (9) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් සමාගමක් වන අවස්ථාවක, 1997 මාර්තු මස 31 වන දිනට පසුව එසේ ආයෝජනය කරන ලද යම් මුදලක්, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද, එය සුදුසු කම් ලබන ගෙවීමක් නොවන බවට සලකනු ලැබිය යුතුය,'

(ආ) ඒ උපවගන්තියේ (ඉඉ) ඡේදයේ-

(i) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ 'නිවාසයක් තැනීම සඳහා බිම් කොටසක් මිලට ගැනීම සඳහා 1989 අප්‍රේල් මස 9 වන දින හෝ ඉන් පසුව ප්‍රදානය කරනු ලැබූ ණයක මුල් මුදල' යන ඉලක්කම් සහ වචන වෙනුවට 'නිවාසයක් තැනීම සඳහා 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1994 අප්‍රේල් මස

1 වන දිනයට පෙරාතුව ප්‍රදානය කරනු ලැබූ යම් ණය මුදලක මුල් මුදල' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්, සහ

(ii) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ 'නිවාසය සම්බන්ධයෙන් 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ඇතුළත් වූ,' යන ඉලක්කම් සහ වචන වෙනුවට 'නිවාසය සම්බන්ධයෙන් 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඇතුළත් වූ,' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(ඇ) ඒ උපවගන්තියේ (ඊඊ) ඡේදයේ 'ඉදිකරනු ලැබූ පළමු නිවාසය වන්නා වූ ද පිරිවැය රුපියල් දස ලක්ෂය නොඉක්මවන්නා වූ ද 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව' යන ඉලක්කම් සහ වචන වෙනුවට 'ඉදිකරනු ලැබූ පළමු නිවාසය වන්නා වූ ද පිරිවැය රුපියල් දසලක්ෂය නොඉක්මවන්නා වූ ද 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්

පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඉදිකරනු ලබන්නා වූ ද නිවාසයක්' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්,

(ඈ) ඒ උපවගන්තියේ (උඋ) ඡේදයේ 'පළමු නිවාසය හෝ නිවාසයක් තැනීම සඳහා වන පළමු බිම් කොටස වන්නා වූ ද 1989 අප්‍රේල් මස 1වන දින හෝ ඉන්පසුව ආරම්භ වන' යන වචන සහ ඉලක්කම් වෙනුවට 'පළමු නිවාසය හෝ නිවාසයක් තැනීඹ සඳහා වන පළමු බිම් කොටස වන්නා වූ ද 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන' යන වචන ඉලක්කම් ආදේශ කිරීමෙන්,

(ඉ) ඒ උපවගන්තියේ (ඌඌ) ඡේදයේ 'පුද්ගලයකු විසින් ගෙවන ලද යම් වාරිකයක්' යන වචන වෙනුවට' 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර පුද්ගලයකු විසින් ගෙවනු ලබන යම් වාරිකයක්' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(ඊ) ඒ උපවගන්තියේ (ඌඌඌ) ඡේදයේ '1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා' යන ඉලක්කම් සහ වචන වෙනුවට '1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දින්ට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(උ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයේ 'පුද්ගලයකු විසින් වියදම් කරන ලද මුදලක්,' යන වචන වෙනුවට 'පුද්ගලයකු විසින් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වියදම් කරන ලද මුදලක්' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(ඌ) ඒ අනුඡේදයේ (ඕඕ) ඡේදයේ '1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව' යන වචන සිට 'ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලක්', යන සියලු ඉලක්කම් සහ වචන ඉවත් කොට ඒ වෙනුවට '1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව රුපියල් දසලක්ෂයක් නොඉක්මවන්නා වූ මුදලකට යම් නිවාසයක් හෝ මහල් නිවාසයක් ඉදිකිරීමෙහිලා හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරියේ අනුමතය ඇතිව ඉදිකරන ලද්දා වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය දේපළ සංයුක්ත වන්නා වූ ද වාසික ඉඩකඩ පිළිබඳ යම් ඒකකයක් 1989 අප්‍රේල් මස 1 වන හෝ

ඉන්පසුව එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව මිලට ගැනීමෙහි ලා ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලක්,' යන ඉලක්කම් සහ වචන අදේශ කිරීමෙන්,

(එ) ඒ උපවගන්තියේ (ග) ඡේදයේ "පුනස්ථාපනයට පත් කිරීම මත යම් තැනැත්තකු විසින් වියදම් කරනු ලැබුවේ යයි" යන වචන වෙනුවට "පුනස්ථාපනයට පත් කිරීම මත 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින් වියදම් කරනු ලැබුවේ යයි" යන වචන ආදේශ කිරීමෙන්,

(ඒ) ඒ උපවගන්තියේ (ච) ඡේදයේ "1983 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන වෙනුවටද "1983 අප්‍රේල් මස 1 වන දි හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(ඔ) ඒ උපවගන්තියේ (ජ) ඡේදයේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී වෛද්‍ය වියදම් වශයෙන්" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකදී වෛද්‍ය වියදම් වශයෙන්" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ වගන්තියේ (5ඇ) උපවගන්තියේ (iii) ඡේදයේ "යම් සුදුසුකම් ලබන ගෙවීමක් සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන්,

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයකදී" යන වචන සිට "ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය." තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(i) යම් තක්සේරු වර්ෂයකදී යම් තැනැත්තකු විසින් කරනු ලැබූ හෝ කරනු ලැබුවේ යයි සලකනු ලබන (2) වන උප වගන්තියේ (අ), (ඇ), (ක) හෝ (ග) ඡේදයේ සඳහන්, හෝ

(ii) 1992 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකු විසින් කරනු ලැබූ හෝ කරනු ලැබුවේ යයි සලකනු ලබන

(2) වන උපවගන්තියේ (ට) ඡේදයේ සඳහන් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ නොහැකි යම් සුදුසුකම් ලබන ගෙවීමක මුදල ඊළඟට ඒළඹෙන ඒ තක්සේරු වර්ෂයේ දී සහ ඒ ආදී වශයෙන් ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතුය," තවද,

(4) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ (ආ) ඡේදයේ

(අ) ඒ ඡේදයේ (1) වන අනුඡේදයේ "සහ ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍ය වරයා විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ, නැතහොත්" යන වචන වෙනුවට "සහ 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ, නැත හොත්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්,

(ආ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:-

"(ii) 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ ඒ

අනුමතයේ ප්‍රතිඵලය වශයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පණතේ 17 වන වගන්තිය යටතේ මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව සමඟ 1992 සැප්තැම්බර් මස 1 වන දිනට පෙරාතුව ගිවිසුමකට එළඹ ඇත්තා වූ,"

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (vi) වන අනුඡේදයේ "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන" යන ඉලක්කම් සහ වචන වෙනුවට, 1988 අප්‍රියෙල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (vi) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන්:-

"(vii) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමු වන උපලේඛනයේ II ඉ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණය අනුව," සහ

(ඇ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ -

(i) ඒ අතුරු වගන්තියේ (iii) වන අනුඡේදයේ "1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් විසි හතර දහසක් සහ" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් විසිහතර දහසක්," යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(ii) ඒ අතුරු වගන්තියේ (iv) වන අනුඡේදයේ "1986 අප්‍රියෙල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන" යන ඉලක්කම් සහ වචන වෙනුවට, 1986 අප්‍රියෙල් මස 01 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රියෙල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන" යන ඉලක්කම් සහ වචන ආදේශකිරීමෙන් සහ, තවද

(iii) ඒ අතුරු වගන්තියේ (iv) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන්:-

"(v) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හතළිස් දෙදහසක්,"

(2) ඒ උපවගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "යම් සේවා නියුක්තියකින් ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඔහුට ගෙවනු ලැබූ යම් මුදලක්, හෝ" යන වචන වෙනුවට "යම් සේවානියුක්තියකින් ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ යම් තදනන්තර අවස්ථාවකදී ඔහුට ගෙවනු ලැබූ යම් මුදලක්, හෝ" යන වචන ආදේශ කිරීමෙන්, සහ

(ආ) ඒ උපවගන්තියේ "ඉහත සඳහන් මුදල් ප්‍රමාණය හෝ මුදල් ප්‍රමාණයන්" වෙනුවට "ඉහත සඳහන් එක් එක් මුදල් ප්‍රමාණය හෝ මුදල් ප්‍රමාණයන්" යන වචන ආදේශ කිරීමෙන්,

(3) ඒ වගන්තියේ (3ආආ) උපවගන්තිය ඉවත් කිරීමෙන්,"

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(4අ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දීම යම් පුණ්‍ය ආයතනයක් විසින් ගිලන් හෝ දුගී අය වෙනුවෙන් ආයතනගත සත්කාර සලසන්නා වූ ද, ඒ සත්කාරය සැලසීම සම්බන්ධයෙන් වියදම ඒ පුණ්‍ය ආයතනය විසින් දරනු ලබන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නා වූද අවස්ථාවක, විෂය කාරණය සම්බන්ධයෙන් සියලු අවස්ථාවල දී අඩු කිරීම හෝ ලිහිල් කිරීම සාධාරණ සහ යුක්ති සහගත බව කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම් ඒ තක්සේරු වර්ෂය සඳහා එම ආයතනයේ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් ඒ පුණ්‍යායතනය විසින් ගෙවිය යුතු බද්ද, ඔහු විසින් නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, අඩු කිරීම හෝ ලිහිල් කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකිය.", තවද

(5) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉ වගන්තියේ "සේවානියුක්තියෙන් ලබන ලාභ ඇතුළත් වන අවස්ථාවක" යන වචන සිට "ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතුය." යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"සේවානියුක්තියෙන් ලබන ලාභ ඇතුළත් වන අවස්ථාවක

(අ) (i) ඒ තක්සේරු වර්ෂය 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයක් නම් රුපියල් එක්දහස් පන්සීයයකට. සහ

(ii) ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් නම් රුපියල් එක් දහස් අට සියයකට හෝ.

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා සේවා නියුක්තියෙන් ඒ පුද්ගලයාගේ ලාභවලට ආරෝපණය කරනු ලැබන ආදායම් බදු මුදලට

සමාන මුදල් ප්‍රමාණයක් යන මේ දෙකින් කවර වූ හෝ අඩු මුදල් ප්‍රමාණය ඒ පුද්ගලයා විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතුවන ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතුය."

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (v) වන අනුඡේදයේ "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ ඡේදයේ (v) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:-

"(vi) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ යුතු ආදායම රුපියල් තුන්ලක්ෂ තුන් දහස් තිහක් නොඉක්මන්නා වූ,"

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (4) වන උපවගන්ති යේ "ඔහුට හිමිකම්

තිබිය යුතුය.' යන වචන වෙනුවට 'ඔහුට හිමිකම තිබිය යුතුය:

එසේ වුව ද ඒ තැනැත්තා වාසික තැනැත්තකු නොවන අවස්ථාවක ඒ ප්‍රකාශයේ දක්වා ඇති අත්තිකාරම් සමාගම් බද්ද ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමට ඔහුට හිමිකම නොතිබිය යුතු ය.' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

**20**. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (ආ) ඡේදයේ '1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා' යන ඉලක්කම් සහ වචන වෙනුවට '1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**21**. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1අ) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංහෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (iv) වන ඡේදයේ '1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා' යන ඉලක්කම් සහ වචන වෙනුවට '1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් සහ, තවද

(2) ඒ උපවගන්තියේ (iv) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:-

'(v) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හතලිස් දෙදහසක්.'

**22**. ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

'(1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ඔහු හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් (2) වන උපවගන්තියේ සඳහන් ඔහුගේ හෝ ඒ හවුල් ව්‍යාපාරයේ ආදායම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙහි ආදායම් බදු සහ අනුරූප කාලසීමාව සඳහා වෙනත් යම් රටක දී ආදායම් බදු ගෙවන ලද බවට හෝ ගෙවීමට යටත් බවට කොමසාරිස් ජනරාල් වරයා සෑහිමට පත් වන පරිදි ඔප්පු කරනු ලබන අවස්ථාවක, එවිට (මේ වගන්තිය යටතේ යම් සහනයක් ප්‍රදානය කරනු ලැබීමට පෙර) එම වෙනත් යම් රටේදී ඔහුගේ හෝ ඒ හවුල් ව්‍යාපාරයේ එම ආදායම සම්බන්ධයෙන් ඔහු හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ඉක්මවා ශ්‍රී ලංකාවේ දී ඔහු හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් එම ආදායම් සම්බන්ධයෙන් ගෙවිය යුතු ආදායම බද්දක් වෙතොත්, එම අතිරික්තයට සමාන මුදලකින් ශ්‍රී ලංකාවේ දී ඒ තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්දන් සහන ලැබීමට ඔහුට හෝ ඒ හවුල් ව්‍යාපාරයට හිමිකම් ඇත්තේ ය.'

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

'(2) (1) වන උපවගන්තියේ විධිවිධාන

(අ) (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස් ජනරාල් වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකාවේ දී කළමනාකරණ උපදේශක සේවාවන් සලසනු ලබන්නා වූ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වන යම් නිර්වාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි යම් හවුල් ව්‍යාපාරයකට

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සබාව විසින් ගිවිසුමකට එළඹියා වූ සමාගමක් වන්නා වූ සහ-

(අ) මිලට ගනු ලැබූ හෝ ඉදිකරනු ලැබූ යම් ගොඩනැගිල්ලක සහ මිලට ගනු ලැබූ යම් ඉඩමක, පරියතක, යන්ත්‍රයක හෝ ගෘහ භාණ්ඩ වල, සහ

(ආ) ව්‍යවසායේ ප්‍රයෝජනය සඳහා (අ) ඡේදයෙහි ඇතුලත් කරනු නොලැබූ යම් වත්කමක් අත්කර ගැනීමේ පිරිවැය

පියවීමට ඇමරිකා එක්සත් ජනපදයේ ඩොලර් දසලක්ෂ පනහක් හෝ වෙනත් යම් විදේශීය ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලක් ඒ ගිවිසුමේ නිශ්චිත කාල සීමා ඇතුළත ඒ ගිවිසුම අනුව ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කරනු ලැබුවා වූ හෝ එලෙස ආයෝජනය කිරීමට එකඟ වූ යම් වාසික සමාගමකට, වාස්තු විද්‍යාත්මක ඉංජිනේරු, පරිමාණ සමීක්ෂණය හෝ ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සහ ඊට අනුයාත වන වෙනත් යම් සේවාන් ශ්‍රී ලංකාවෙහි දී සලසන්නා වූ යම් සේවාවන් ශ්‍රී ලංකාවෙහි දී සලසන්නා වූ යම් නිර්වාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි වූ යම් හවුල් ව්‍යාපාරයකට,

(ආ) (i) (අ) ඡේදයේ (1) වන අනුඡේදයේ සඳහන් සේවාවන්, ඒ අනුඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් 1991 අප්‍රේල් මස 1 වන දිට හෝ ඉන්පසුව සැලසීමෙන්, හෝ

(ii) (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් යම් සේවාවන් ඒ ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව සැලසීමෙන් ශ්‍රී ලංකාවෙන් උද්ගත වන හෝ ව්‍යුත්පන්න වූ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් අදාළ විය යුතුය."

**23**. ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියේ (2අ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2අඅ) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් දින හෝ ඉන් පෙර ආදායම හෝ ධනය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න නාවූ සහ එයින් (2අ) උපවගන්තියේ විධිවිධාන යටතේ ආදායම හෝ ධනය පිළිබඳ වාස්තාරවක් සපයනු නොලැබූ ලෙස සලකනු ලබන්නා වූ අවස්ථාවක ඔහු විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත ආකෘතිය අනුව නොවන බවට හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත යම් විස්තර ඇතුළත් නොවන බවට එම තක්සේරු වර්ෂයේ අවසානයේ සිට දින තිහක් ඇතුළත ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂයේ තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතුය."

**24**. ප්‍රධාන ප්‍රඥප්තියේ 92අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන්-

"එසේ වුවද-

(අ) ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව යම් සමාගමක් විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ අවස්ථාවක,

මේ වගන්තිය යටතේ දැන්වීමක් සමාගම වෙත දෙනු නොලැබුව ද ඒ සමාගම විසින් 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා නැතහොත් ව්‍යවස්ථාපිත ආදායම ආගනණය කරනු ලබන්නේ වෙනත් යම් කාලසීමාක් සඳහා ද ඒ කාලසීමාව සඳහා ගැසට් පත්‍රයේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ප්‍රකාශ සහ යම් උපලේඛන ඉදිරිපත් කළ යුතුය: තවද

(ආ) යම් හවුල් ව්‍යාපාරයක් විසින් හෝ සමාගමක් නොවන යම්තැනැත්තකු විසින් ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ සහ 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, හෝ එම තක්සේරු වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත ආදායම ආගනණය කරනු ලබන්නේ වෙනත් යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව සඳහා, ඒ වෙළඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ පිරිවැටුම රුපියල් පනස් ලක්ෂයක් ඉක්මවූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ කාලසීමාව සඳහා ඉදිරිපත් කිරීමට ඒ හවුල්කරුට හෝ ඒ තැනැත්තාට මේ වගන්තිය යටතේ දන්වීමක් දෙනු නොලැබුවද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් සඳහන් කරනු ලබන යම් ප්‍රකාශ සහ උපලේඛන ඉදිරිපත් කළ යුතුය.'

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ-

'1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා' යන ඉලක්කම් සහ වචන වෙනුවට '1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(ආ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වැඩිදුර අතුරු වගන්තිය එකතු කිරීමෙන්:-

'එසේම තවදුරටත් 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා හෝ ඒ තක්සේරු වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කරනු ලබන්නේ වෙනත් යම් කාලසීමාවක් සඳහා ද, ඒ කාලසීමාව සඳහා වූ ආදායම් වාර්තාවක් සනාථ කිරීමෙහි ලා-

(i) යම් සමාගමක් විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් ඒ සමාගම විසින් සපයනු ලැබූ: හෝ

(ii) යම් හවුල් ව්‍යාපාරයක් විසින් හෝ සමාගමක් නොවන යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ යම් වෙළඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක පිරිවැටුම රුපියල් පනස් ලක්ෂය ඉක්මවන්නා වූ අවස්ථාවක ඒ වෙළඳාම, ව්‍යාපාරය වෘත්තිය හෝ රක්ෂාව සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ කාලසීමාව සඳහා එම හවුල් ව්‍යාපාරය හෝ තැනැත්තා විසින් සපයනු ලැබූ ගිණුම් ප්‍රකාශයක් අනුමත ගණකාධිකාරිවරයකු විසින් ක්‍රියාත්මක කරනු ලද විගණනයක පදනම මත පිළියෙල කරනු ලැබිය යුතුය.

**25**. ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

96. (1) (i) තමාගේ ආදයම, ධනය හෝ ත්‍යාග පිළිබඳව ද තමාට දරුවකු සිටීනම් ඒ දරුවාගේ ආදයම හෝ ධනය පිළිබඳවද

දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත වාර්තාවක් සපයන ලෙස නියම කරමින් තක්සේරුකරුවකු විසින්

92 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ ලිඛිත දැන්වීමක් අනුව කටයුතු කිරීමට යම් තැනැත්තකු පැහර හරින අවස්ථාවක, හෝ

(ii) 92 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සැපයීමට නියමිත වාර්තාවක් ඒ වගන්තියේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත සැපයීමට යම් තැනැත්තකු පැහැර හරින අවස්ථාවක හෝ

(iii) 103 වන වගන්තියේ යම් නියමයන් අනුව කටයුතු කිරීමට යම් සේවා යෝජකයකු පැහැර හරින අවස්ථාවක,

කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජක විෂයෙහි රුපියල් පනස් දහසක් නොඉක්මවන දණ්ඩනයක් නියම කළ හැකි අතර ඒ දණ්ඩනය නියම කිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තා ට හෝ සේවායෝජකට ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය හැකිය,

(ආ) ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජකයා වෙත කරනු ලබන ලිඛිත දැන්වීමක් මගින්-

(i) එම දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළදී ඒ දණ්ඩනය ගෙවීමට, සහ

(ii) ඒ වාර්තාව සපයා නොමැති අවස්ථාවක හෝ ඒ නියමය අනුව කටයුතු කර නොමැති අවස්ථාවක එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාල සීමාව තුළදී ඒ වාර්තාව සැපයීමට හෝ ඒ නියමය අනුව කටයුතු කිරීමට නියම කළ හැකිය.

(2) අවස්ථාවෝචිත පරිදි. ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජක විසින්. අවස්ථාවෝචිත පරිදි, ඒ වාර්තාව සැපයීමට හෝ නියමය අනුව කටයුතු කිරීමට ඔහුගේ පැහර හැරීම තම පාලනයේන් බාහිර අවස්ථාගත කරණු නිසා බවට සහ අවස්ථාවෝචිත පරිදි, ඔහු විසින් ඒ වාර්තාව සපයා ඇති බවට හෝ ඒ නියමය අනුව කටයුතු කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු. කරනු ලැබුවහොත්, මේ වගන්තිය යටතේ ඒ තැනැත්තා හෝ ඒ සේවා යෝජක විෂයෙහි නියම කරන ලද දණ්ඩනය කොමසාරිස් ජනරාල්විසින් අඩු කරනු ලැබිය හැකිය. නැතහොත් අත්හරිනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු හෝ යම් සේවා යෝජකයකු විෂයෙහි දණ්ඩනයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, 151 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය හෝ (ඈ) ඡේදය යටතේ හෝ දැන්වීමට හෝ නියමයට අදාළව 151 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (iii) වන ඡේදය යටතේ නඩු පැවරීමට ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජක යටත් නොවිය යුතු ය.

**26**. ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

110. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් සේවා යෝජකයකු විසින් ගෙවිය යුතු යම් කාල සීමාවක් සඳහා වූ යම් ආදායම් බද්දක් පැහැර හැර ඇති අවස්ථාවක, ඒ සේවායෝජක විසින්-

(අ) ඒ ගෙවීම් කාලසීමාව 1992 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් කාලසීමාවක් වන අවස්ථාවක, ඒ බද්දට අතිරේකව

(i) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක්, සහ

(ii) ඒ බද්ද පැහැර හරිනු ලැබීමට පත් වීමෙන් පසුව මාස හයක් ඉකුත් වීමට පෙර ඒ බද්ද ගෙවනු නොලබන අවස්ථාවක, ඒ බද්දෙන් සියයට පහළොවකට සමාන මුදලක, වැඩිදුර දණ්ඩන මුදලක් ගෙවිය යුතුය. තවද

(ආ) ඒ ගෙවීම් කාලසීමාව 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් ගෙවීම් කාලසීමාවක් වන අවස්ථාවක ඒ බද්දට අතිරේකව-

(i) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක්, සහ

(ii) ඒ බද්ද පැහැර. හරිනු ලැබීමට පත් වීමෙන් පසුව, දින තිහක් ඉකුත් වීමට පෙර, ඒ බද්ද ගෙවනු නොලබන අවස්ථාවක එය පැහැර හැර පවතින කාලය තුළ දින තිහක එක් එක් වැඩිදුර කාලසීමාවක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් පැහැර හරිනු ලැබ ඇති බද්දෙන් සියයට දෙකකට සමා මුදලක වැඩිදුර දණ්ඩන මුදලක් ගෙවිය යුතුය:

එසේ වුව ද-

(අ) ගෙවීම පැහැර හැරීම තම පාලනයෙන් බාහිර අවස්ථාගත කරුණු නිසා බවට, සහ පැහැර හැර ඇති බදු මුදල තමා විසින් ගෙවා ඇති බවට සහ ඒ ගෙවීම කරන ලද අවස්ථාවේදී සැපයීමට නියමිත ප්‍රකාශය සපයන ලද බවට, ඒ සේවා යෝජක විසින් කොමසාරිස් ජනරාල් වරයා සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු කරනු ලැබුවහොත්, ඒ සේවායෝජක විසින් ගෙවිය යුතු එවැනි යම් දණ්ඩනයක මුදල කොමසාරිස් ජනරාල් වරයා විසින් අත්හරිනු ලැබිය හැකිය. නැතහොත් අඩු කරනු ලැබිය හැකිය,

(ආ) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුළු මුදල 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා පැහැර හරිනු ලැබූ බද්ද වෙනුවෙන් පැහැර හරිනු ලැබූ බද්දෙන් සියයට පනහක් නොඉක්මවිය යුතුය.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ "තමාගේම නාමයෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගේ නාමයෙන් ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය වෙත" යන වචන සිට "සියයට විස්සක් වූ අනුප්‍රමාණයක් ආදායම් බදු අඩු කරනු ලැබිය යුතුය."

තෙක් වූ සියලු වචන සහ ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

"තමාගේම නාමයෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගේ නාමයෙන් ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය වෙත තැන්පත් කර ඇති යම් මුදල් ප්‍රමාණයක් මත යම් තක්සේරු වර්ෂයකදී ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ඒ තක්සේරු වර්ෂය-

(i) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, එසේ ගෙවිය යුතු පොලියෙන් සියයට විස්සක අනුප්‍රමාණයක්, සහ

(ii) ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක එසේ ගෙවිය යුතු පොලියෙන් සියයට පහළොවක අනුප්‍රමාණයක් ආදායම් බදු අඩු කරනු ලැබිය යුතුය.",

(2) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ "සියයට 20 ක්" යන වචන සහ ඉලක්කම් ඒ අතුරු වගන්තියේ යෙදෙන කවර හෝ විටෙක ඒ වෙනුවට "සියයට 15 ක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**28**. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඌ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

113ඌ. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවිය යුතු ආදායම් බදු කිසිවක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින්-

(අ) ඒ තක්සේරු වර්ෂය 1992 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, ඒ බද්දට අතිරේකව-

(i) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක් සහ;

(ii) එම බද්ද පැහැර හරිනු ලැබීමට පත් වීමෙන් පසුව මාස හයක් ඉකුත් වීමට හෝ ඒ බද්ද ගෙවනු නොලබන අවස්ථාවක, බද්දෙන් සියයට පහළොවකට සමාන මුදලක වැඩිදුර දණ්ඩන මුදලක් ගෙවිය යුතුය; තවද

(ආ) ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක ඒ බද්දට අතිරේකව-

(i) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක්; සහ

(ii) ඒ බද්ද පැහැර හරිනු ලැබීමට පත් වීමෙන් පසුව දින තිහක් ඉකුත් වීමට හෝ ඒ බද්ද ගෙවනු නොලබන අවස්ථාවක, එය පැහැර හැර පවතින කාලය තුල දින තිහක එක් එක් වැඩිදුර කාලසීමාවක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් පැහැර හරිනු ලැබ ඇති බද්දෙන් සියයට දෙකකට සමාන මුදලක් වැඩිදුර දණ්ඩන මුදලක් ගෙවිය යුතුය:

එසේ වුවද-

(අ) ගෙවීම පැහැර හැරීම ස්වකීය පාලනයෙන් බාහිර අවස්ථාගත කරුණු නිසා බවට සහ පැහර හැර ඇති බදු මුදල එය විසින් ගෙවා ඇති බව සහ ඒ ගෙවීම කරන ලද අවස්ථාවේ දී සැපයීමට නියමිත ප්‍රකාශය සපයන ලද බවට ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු කරනු ලැබුවහොත් ඒ බංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ගෙවිය යුතු එවැනි යම් දණ්ඩනයක මුදල කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හරිනු ලැබිය හැකිය. නැතහොත් අඩු කරනු ලැබිය හැකිය; තවද

(ආ) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා පැහැර හරිනු ලැබූ බද්ද වෙනුවෙන් පැහැර හරිනු ලැබූ බද්දෙන් සියයට පනහක් නොඉක්ම විය යුතුය."

**29**. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඒ වගන්තියේ "තැන්පතු මගින් මුදල් භාරගැනීමේ හා ඒ මත පොලිය ගෙවීමේ තම ව්‍යාපාරය" යන වචන වෙනුවට "තැන්පතු හෝ සෑණ පත්‍ර හෝ බැඳුම්කර ආකාරයෙන් හෝ වෙනත් යම් ආකාරයෙන් වූ ණය මගින් සහ ඒ මත පොලිය ගෙවීමේ ව්‍යාපාරය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**30**. ප්‍රධාන ප්‍රඥප්තියේ XVඅ පරිච්ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ XVආ පරිච්ඡේදය වශයෙන් බලසහිත විය යුතුය:-

## "XV ආ පරිච්ඡේදය

## නිශ්චිත තැනැත්තන් විසින් ගෙවන ලද නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩුකර ගැනීම.

113ඔ. (1) සෑම නිශ්චිත තැනැත්තකු විසින්ම මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව, 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකුට හෝ යම් හවුල් ව්‍යාපාරිකයකුට ගෙවිය යුතු යම් නිශ්චිත ගාස්තුවකින්, ඒ නිශ්චිත ගාස්තුව ගෙවනු ලැබූ වේලාවේ දී, ඒ නිශ්චිත ගාස්තුවෙන් සියයට තුනක අනුප්‍රමාණයක් අනුව ආදායම් බද්දක් අඩු කරනු ලැබිය යුතුය.

(2) මේ උපවගන්තියේ කාර්ය සඳහා -

(අ) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට "නිශ්චිත තැනැත්තා" යන්නෙන් තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන්-

(i) වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් හවුල් ව්‍යාපාරයකට එකතුව රුපියල් තිස් දහසකට නොඅඩු නිශ්චිත ගාස්තුවක්,

(ii) එකතුව රුපියල් දෙලක්ෂ පනස් දහසකට නොඅඩු නිශ්චිත ගාස්තු ඒ තක්සේරු වර්ෂයේදී හෝ ඒ තක්සේරු වර්ෂයට ඉහතින්ම වූ තක්සේරු වර්ෂයේ දී ගෙවීමට හෝ බැර කිරීමට ඉඩ ඇත්තා වූ යම් තැනැත්තෙක්, හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

(ආ) "නිශ්චිත ගාස්තුව" යන්නෙන් අවස්ථාවෝචිත පරිදි, යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක යම් හවුල් කරුවකු විසින්, හෝ කරනගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නාවූ ස්වාධීන ස්වභාවයකින් වූ යම් වෘත්තියක් හෝ රක්ෂාවක් හෝ වෙනත් කටයුතු අතරතුර අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉටු කරන ලද සේවාවන් සඳහා ප්‍රතිෂ්ඨාව වශයෙන් යම් නිශ්චිත තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් මුදලක් අදහස් වන අතර, ඒ නිශ්චිත තැනැත්තා විසින් ගෙවිය යුතු යම් කොමිස් මුදලක්, තැරැව් ගාස්තුවක් හෝ ඒ සමාන ස්වභාවයකින් වූ වෙනත් මුදලක් ඊට ඇතුළත් වන මුත් ඒ නිශ්චිත තැනැත්තා යටතේ වූ සේවා නියුක්තිය අතරතුර, ඒ නිශ්චිත තැනැත්තා විසින් ඒ නිශ්චිත තැනැත්තාගේ යම් සේවා නියුක්තියකුට ගෙවිය යුතු යම් මුදලක් ඊට ඇතුළත් නොවේ.

113ඕ. බැංකු සහ මූල්‍ය ආයතන විසින් ගෙවන ලද පොලියෙන් ආදායම් බදු අඩු කිරීමට, එසේ අඩුකරගන්නා ලද ආදායම් බදු වෙනුවෙන් බැර, විධාන නිකුත් කිරීම් බැංකුවල සහ මූල්‍ය ආයතන මත තක්සේරු නිකුත් කිරීම අභියාචනා සහ පැහැර හැරීම සඳහා දණ්ඩන යන විෂයයන්ට අදාළ XVඅ පරිච්ඡේදයේ විධිවිධාන නිශ්චිත තැනැත්තන් විසින් නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩු කිරීමට, එසේ අඩුකරන ලද ආදායම් බදු වෙනුවෙන් බැර, විධාන නිකුත් කිරීම නිශ්චිත තැනැත්තන්ගේ කාර්ය, ආදායම් බදු අඩු කිරීමේ දී පැහැර හැරීම, නිශ්චිත තැනැත්තන් මත තක්සේරු නිකුත් කිරීම. අභියාචනා මේ පරිච්ඡේදය යටතේ පැහැර හැරීම සඳහා දණ්ඩනය යන විෂයයන් අවශ්‍ය වෙනස් කිරීම සහිතව XVඅ පරිච්ඡේදයේ "බැංකු සහ මූල්‍ය ආයතන" යන වචන සහ "පොලිය" යන වචන වෙනුවට "නිශ්චිත ගාස්තුව" යන වචන ඒ පරිච්ඡේදයේ යෙදෙන කවර හෝ විටෙක එලෙස ආදේශ කරනු ලැබූ ලෙස අදාළ විය යුතුය. එසේ වුවද යම් නිශ්චිත තැනැත්කු විසින් යම් හවුල් ව්‍යාපාරයකට ගෙවන ලද යම් නිශ්චිත ගාස්තුවකින් මේ පරිච්ඡේදය යටතේ අඩුකර ගනු ලැබූ ආදායම් බදු සඳහා බැර, ඒ හවුල් ව්‍යාපාරයේ

හවුල්කරුවන් අන්‍යොන්‍ය එකඟත්වයෙන් තීරණය කරනු ලැබුවහොත් මිස, ඒ හවුල් ව්‍යාපාරයේ ලාභ සහ පාඩු ඒ හවුල්කරු විසින් බෙදා ගන්නා අනුපාතය අනුව ඒ හවුල්කරුවන් අතර බෙදා හැරිය යුතු බවට ලිඛිත කිරීමට යටත් විය යුතුය.'

**31**. ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තියේ 'රුපියල් පනහක ගාස්තුවක් ද ' යන වචන වෙනුවට 'රුපියල් එක් දහස් පන් සියයක ගාස්තුවක් ද' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**32**. ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (1) වන උපවගන්තියේ 'යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් යන වචන සිට 'දණ්ඩන මුදලක් ලෙස ගිවිය යුතුය;' යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

'යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් බද්දක් පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා විසින්-

(අ) ඒ තක්සේරු වර්ෂය 1992 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක පැහැර හරිනු ලැබූ බද්දට අතිරේකව-

(i) පැහැර හරිනු ලැබූ මුදලින් සියයට පහකට සමාන මුදලක දණ්ඩන මුදලක්; සහ

(ii) යම් මුදලක් පැහැර හරිනු ලැබීමට පත්වීමෙන් පසුව දින තිහක් ඉකුත් වීමට පෙර පැහැර හරිනු ලැබූ එම මුදල ගෙවනු නොලබන අවස්ථාවක, එය පැහැර හැර ඇති කාලය තුළ මාස තුනක එක් එක් වැඩිපුර කාල සීමාවක් හෝ ඒ කාලසීමාවෙන් කොටසක් සම්බන්ධයෙන් පැහැර හරිනු ලැබූ මුදලින් සියයට පහකට සමාන වැඩිපුර මුදලක් ගෙවිය යුතුය; තවද

(ආ) ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක පැහැර හරිනු ලැබූ බද්දට අතිරේකව-

(i) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක්, සහ

(ii) ඒ බද්ද පැහැර හරිනු ලැබීමට පත්ව දින තිහක් ඉකුත්වීමට පෙර ඒ බද්ද ගෙවනු නොලබන අවස්තාවක, පැහැර හරිනු ලැබ පවත්නා කාලය තුළ දින තිහක එක් එක් වැඩිපුර කාල සීමාවක් හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් පැහැර හරිනු ලැබූ බද්දෙන් සියයට දෙකකට සමාන මුදලක වැඩිපුර දණ්ඩන මුදලක් ගෙවිය යුතුය;'

**33**. ප්‍රදාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (iii) වන ඡේදයේ '101 වන වගන්තියේ (2) වන උප වගන්තියේ හෝ 102 වන වගන්තියෙහි (අ), (ආ) හෝ (ඇ) ඡේදවල' යන ඉලක්කම් සහ වචන වෙනුවට '96 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 101 වන වගන්තියේ (2) වන උපවගන්තියේ 'හෝ 102 වන වගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**34**. ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තියේ (1) වන උපවගන්තියේ 'දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් සහ දේශීය ආදායම් තක්සේරුකරුවන් යම් සංඛ්‍යාවක් ද' යන වචන වෙනුවට 'දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන්, දේශීය ආදායම් තක්සේරුකරුවන් සහ දේශීය ආදායම් බදු නිලධරයන් යම් සංඛ්‍යාවක් ද' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**35**. ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තියේ (12) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(13) ශ්‍රී ලංකා ආණ්ඩුව සහ වෙනත් යම් දේශයක ආණ්ඩුව අතර ඇති කර ගන්නා ලද සහ මේ පනතේ 82 වන වගන්තියෙහි සඳහන් යම් ගිවිසුමක් අනුව කටයුතු කිරීමේ දී තොරතුරු හුවමාරු කර ගැනීම මගින් තමාගේ දැන ගැනීමට ලැබෙන යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළ යම් විස්තර ගිවිසුමේ විෂය කාරණය වන බදු තක්සේරු කිරීමට හෝ එකතු කිරීමට හෝ බලාත්මක කිරීමට හෝ ඊට අදාළ යම් වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමට සම්බන්ධ වූ යම් තැනැත්තෙක් හෝ අධිකාරයක් නොවනයම් තැනැත්තකුට හෝ අධිකාරයකට හෙළි කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට නියම කෙරෙන්නේ යයි මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් කියවා තේරුම් නොගත යුතුය."

**36**. ප්‍රදාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ IIඇ කොටසෙහි "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය:-" යන ඉලක්කම් සහ වචන වෙනුවට" 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදයම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය. යන ඉලක්කම් හා වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ උපවගන්තියේ II ඇ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුලත් කිරීමෙන්:-

"II ඉ කොටස

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය:-

බදු අයකළ හැකි ආදායමෙහි පලමුවන රු 21,000
සම්බන්ධයෙන් ..... සියයට 10

බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 24,000
සම්බන්ධයෙන් ..... සියයට 20

බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 24,000
සම්බන්ධයෙන් .... සියයට 30

ඉතිරි බදු අයකළ හැකි ආදායම
සම්බන්ධයෙන් .... සියයට 35."

**37**. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ I වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"I වන කොටස

II වන කොටසෙහි හෝ III වන කොටසෙහි, හෝ IV වන කොටසෙහි හෝ IVඅ කොටසෙහි හෝ V වන කොටසෙහි හෝ Vආ කොටසෙහි හෝ VI වන කොටසෙහි හෝ VIII වන කොටසෙහි හෝ IX වන කොටසෙහි හෝ X වන කොටසෙහි සඳහන් සමාගමක් නොවන ශ්‍රී ලංකාවේ වාසික සමාගමක්.

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ සමාගමේ බදු අයකළ හැකි ආදායම මත ... සියයට 45"

(2) ඒ උපලේඛනයේ IVඅ කොටසෙහි "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචනව වෙනුවට " 1988 අපේ‍්‍රල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

(3) ඒ උපලේඛනයේ IVඅ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"IVආ කොටස

කුඩා සමාගම්

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනු ප්‍රමාණ

(1) සමාගමේ අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහස නොඉක්මවන්නේ නම් .... සියයට 33 1/3

(2) සමාගමේ බදු අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහසක් ඉක්මවන්නේ නම් එහෙත් රුපියල් තුන් ලක්ෂ තුන්දහස් තිහක් නොඉක්මවන්නේ නම්-

(i) රුපියල් දෙලක්ෂ පනස් දහසින් සියයට 33 1/3 කට සමා මුදලක්, සහ

(ii) ඒ තක්සේරු වර්ෂය සඳහා සමාගම් බදු අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහස ඉක්මවන්නා වූ මුදල

ඓක්‍යය බද්ද විය යුතුය."

(4) ඒ උපලේඛනයේ (VII) වන කොටස වෙනුවට පහත දැක්වෙන කොට ආදේශ කිරීමෙන්-

"VII වන කොටස

(34 වන වගන්තිය)

ශ්‍රී ලංකාවෙහි නිර්වාසික සමාගමක්

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය-

සමාගමේ බදු අයකළ හැකි ආදායම් මත..................................සියයට 50 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය

සමාගමේ බදු අයකළ හැකි ආදායම් මත ...............................සියයට 45,",

(5) ඒ උපලේඛනයේ (IX) වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"IX වන කොටස

(ශ්‍රී ලංකා මහා බැංකුව හැර) රාජ්‍ය සංස්ථා

1989 මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය

රාජ්‍ය සංස්ථාවේ බදු අයකළ හැකි ආදායම මත.............................සියයට 50 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය-

රාජ්‍ය සංස්ථාවේ බදු අයකළ හැකි ආදායම මත...........................සියයට 45,

(6) ඒ උපලේඛනයේ X වන කොටස පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

## ¨X වන කොටස

ඒකක භාර හෝ අන්‍යොන්‍ය අරමුදල

පිළිවෙලින් 1990 අප්‍රේල් මස 1වන දින සහ 1991 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු අනුප්‍රමාණය-

ඒකක භාරයේ හෝ අන්‍යොන්‍ය අරමුදලේ බදු අයකළ හැකි

ආදායම මත.......................................................................................................................................සියයට 50

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය-

ඒකක භාරයේ හෝ අන්‍යොන්‍ය අරමුදලේ බදු අය කළ හැකි

ආදායම මත..................................................සියයට 45.˙

**38**. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) උපලේඛනයේ I වන ඡේදයේ ˙1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා˙ යන සියලු ඉලක්කම් සහ වචන වෙනුවට පහත දැක්වෙන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්:-

˙1986 අප්‍රේල් මස 1වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා˙ යන සියලු ඉක්කම් සහ වචන වෙනුවට පහත දැක්වෙන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්:-

˙1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-

බදු අයකළ හැකි ආදායමේ ඊළඟ පළමු රු. 25,000 මත

..............................................................................................................................සියයට 30

බදු අයකළ හැකි ආදායමේ ඊළඟ 25,000 මත..........................................

..............................................................................................................................සියයට 40

බදු අයකලහැකි ආදයමේ ශේෂය මත..............................................................

..............................................................................................................................සියයට 50

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-

බදු අයකළ හැකි ආදායමේ පළමු රු. 25,000 මත....................................

..............................................................................................................................සියයට 30

බදු අයකළ හැකි ආදායමේ ඊළඟ රු. 25.000 මත....................................

..............................................................................................................................සියයට 40

බදු අයකළ හැකි ආදයමේ ශේෂය මත...................සියයට 45.˙,

(2) ඒ උපලේඛනයේ 3 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ ˙1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එළඹෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා˙ යන වචන සහ ඉලක්කම් වෙනුවට ˙1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා˙ යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්,

(ආ) ඒ ජේදයේ (ii) අනුජේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුජේදය එකතු කිරීමෙන්-

˙(iii) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා

.............................................සියයට 35;˙

(3) ඒ උපලේඛනයේ 4 වන ජේදයේ ˙1986 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියලුම භාරකරුවන් සම්බන්ධයෙන්.................සියයට 50˙ යන යෙදුම වෙනුවට˙ 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රියෙල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියලුම භාරකරුවන් සම්බන්ධයෙන්.....................................................................................
...............................................................සියයට 50.

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියලුම භාරකරුවන් සම්බන්ධයෙන්...............................
............................................... සියයට 35;˙

(4) ඒ උපලේඛනයේ 5 වන ජේදය වෙනුවට පහත දැක්වෙන ජේදය අදේශ කිරීමෙන්-

˙හවුල් ව්‍යාපාර

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-

හවුල් ව්‍යාපාරයේ බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන්..........................
..............................................සියයට 50;˙

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-

හවුල් ව්‍යාපාරයේ බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන්..........................
..............................................සියයට 35;˙

(5) ඒ උපලේඛනයේ II වන ජේදයේ-

(i) ඒ ජේදයේ (ආ) අනුජේදයේ ˙1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා˙ යන යෙදුම වෙනුවට ˙1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා˙ යන යෙදුම ආදේශ කිරීමෙන්,

(ii) ඒ ජේදයේ (ආ) අනුජේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුජේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුජේදය එකතු කිරීමෙන්-

˙(ඇ) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන තක්ස්රු වර්ෂයක් සඳහා

(i) බදු අය කළ හැකි ආදායම් සම්බන්ධයෙන්........
..........................................සියයට 45

(ii) (i) වන ජේදය යටතේ ගෙවිය යුතු බද්ද එයින් අඩු කිරීමෙන් පසුව ලාභවල ශේෂය සම්බන්ධයෙන් ..........................................සියයට 25.˙,

(6) ඒ උපලේඛනයේ 13 වන ජේදය වෙනුවට පහත දැක්වෙන ජේදය ආදේශ කිරීමෙන්:-

"13. සේවා නියුක්තයින් සඳහා පමණක් දයක මුදල් ගෙවනු ලබන යම් සකසුරුවම් ඉතිරි කිරීමේ හෝ ගොඩනැගිලි සමිතියක් හෝ සුභසාධක අරමුදලක් හෝ 23(1) (ඩ) ඡේදයේ කාර්ය සඳහා අනුමත කරන ලද යම් පාරිතෝෂික අරමුදලක්-

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-

සමිතියේ හෝ අරමුදලේ බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන්..............................සියයට 10,",

(7) ඒ උපලේඛනයේ 13 වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:-

"14. (ඉහත සහ පළමුවන සහ දෙවන උපලේඛනවල සඳහන් තැනැත්තෝ)-

බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන්....................සියයට."

**39**. ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

DISCARDED

"හත්වන උපලේඛනය (33අ (1) වගන්තිය)

1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු යː-

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමා මුදල් සම්බන්ධයෙන්..........................................................සියයට 25

(ii) නිල ලැයිස්තු ගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල සම්බන්ධයෙන්......................................................සියයට 33 1/3

(iii) ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් හෝ කුඩා සමාගමක් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල සම්බන්ධයෙන්..........................................................සියයට 50.

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුයː-

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන මුදලට සමාන මුදල සම්බන්ධයෙන් ........සියයට 25

(ii) නිල ලැයිස්තු ගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල සම්බන්ධයෙන්......... සියයට 33 1/3

(iii) ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් හෝ කුඩා සමාගමක් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් බන බෙදාහැරීමක මුදලට සමාන මුදල සම්බන්ධයෙන්.........................................සියයට 40;"

**40**. (1) මේ පනතේ 5 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට කරන ලද සංශෝධන 1992 1992 අගෝස්තු මස 26 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(2) මේ පනතේ 6 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට කරන ලද සංශෝධනය 1992 අගෝස්තු මස 26 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(3) මේ පනතේ 9(2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඇ වගන්තියට කරනු ලබන සංශෝධනය 1990 නොවැම්බර් 29 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. තවද ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඇ වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ (iv) වන අනුඡේදයේ සඳහන් යම් ව්‍යවසායක් පමණක් කරගෙන යාමෙහි නිරත යම් සමාගමක් මේ පනත ආරම්භවීමේ දින සිට එක් මාසයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවහොත් 1992 අප්‍රේල් මස 1වන දිනට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සළකනු ලැබිය යුතුය.

(4) මේ පනතේ 11 වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇඇඇ වගන්තියට කරන ලද සංශෝධන 1991 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය

(5) මේ පනතේ 12 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 (1) වගන්තියට කරන ලද සංශෝධනය 1992 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය

(6) මේ පනතේ 13 (2) වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 (5ඇ) වගන්තියට කරන ලද සංශෝධනය 1990 නොවැම්බර් මස 29 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය

(7) මේ පනතේ 16 (3) වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියට කරන ලද සංශෝධනය 1992 අගෝස්තු මස 26 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය

(8) මේ පනතේ 9 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 38 (4) වගන්තියට කරන ලද සංශෝධනය 1988 සැප්තැම්බර් මස 8 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(9) මේ පනතේ 24 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තියට කරන ලද සංශෝධනය 1992 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(10) මේ පනතේ 27 (2) වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 (5ඇ) වගන්තියට කරන ලද සංශෝධනය 1992 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

41. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1992 අංක 66 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1992 දෙසැම්බර් මස 24 වන දින)

**1991 අංක 52 දරන ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1**. මේ පනත 1992 අංක 66 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2**. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1991 අංක 52 දරන ආරක්ෂක බදු පනතේ දීර්ඝ නාමයේ "1992 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන" යන වචන හා ඉලක්කම් වෙනුවට "පිළිවෙලින් 1992 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1993 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "1992 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂයේ සෑම කාර්තුවක් සඳහා," යන වචන හා ඉලක්කම් වෙනුවට "පිළිවෙලින් 1992 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1993 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂවල සෑම කාර්තුවක් සඳහා," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**4**. (1992 අංක 36 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනතින් ඇතුළත් කරන ලද) ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ "පිළිවෙලින් 1992 ජූලි මස 1වන දිනෙන් සහ 1992 ඔක්තෝබර් මස 1 වන දිනෙන් ආරම්භ වන කාර්තුව සඳහා" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 ජූලි මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1994 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1994 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1992 අංක 67 දරන විසර්ජන පනත

(සහතිකය සටහන් කළේ 1992 දෙසැම්බර් මස 24 වන දින)

1993 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද, ඒ සේවා කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබාගැනීමට බලය දීම සඳහා ද, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළහැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලසීමත් සඳහා ද වූ පනතකි.

1. මේ පනත 1992 අංක 67 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් වියදමකට බලය දෙන්නා වූ වෙන යම් නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි "1993 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1993 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වී 1993 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි ඇස්තමේන්තු කර ඇති රුපියල් දහ හතර දහස් තුන්සිය හතලිස් කෝටි තිස් අට ලක්ෂ දහතුන්දාහක් විය යුතු ආණ්ඩුවේ වියදම -

(ආ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින්, හා

(ආ) ණය වශයෙන් ලබාගන්නා මුදල්වල සමස්ථය රුපියල් නවදහස් දස කෝටියක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ලබාගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින් පියවිය යුතුය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් දහ හතර දහස් තුන්සිය හතලිස් කෝටි තිස් අටලක්ෂ දහතුන් දාහක් වූ මුදල, මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2) මේ වගන්තියේ (i) වන උප වගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබාගැනීමට බලය දෙනු ලබන වෙනයම් ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතුය.

3. (i) 1993 මුදල් වර්ෂය තුළදී, මේ පනතෙහි දෙවන උපලේඛනයේ 1 වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්තේ ගිණුමට බැර කළයුතු අතර, එසේ බැරකරනු ලැබූ ලැබීම්වල එකතුව, ඒ උපලේඛනයේ iii වන තීරයෙහි අනුරූපී සටහනෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතුය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 1993 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය.

(2) (i) වන උප වගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය විනිශ්චය කිරීමේ කාර්ය සඳහා පහත දැක්වෙන ගෙවීම්, එනම් :-

(අ) යම් කටයුත්තක් ආදායමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේන් කාර්ය සාධන සංස්ථාපන හා වෙනත් වියදම්: සහ

(ආ) යම් කටයුත්තක චංචල හා නිශ්චල දේපල ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන ඒ එක් එක් කටයුත්තේ ආදායමින් අඩුකළ යුතුය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තිරයෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1993 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම, ඒ මුදල් වර්ෂය

තුළ දී ඒ කටයුත්තෙන්, ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතුය. එහෙත් ඒ වියදම් ඒ උපලේඛනයේ II වන තීරයෙහි අනුරූපී සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තක් සම්බන්ධයෙන්, 1993 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය. ඒ උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූපී සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය. තවද, ඒ මුදල් වර්ෂය අවසාන්යේ දී ඒ කටයුත්තේ මුළු බැරකම, ඒ උපලේඛනයේ V වන තීරයෙහි අනුරූපී සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

4. 1993 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක, මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, ඒ වියදම් පියවීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සළකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි හෝ වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කළින් කළ විධාන කරනු ලැබිය හැකිය. එසේ වුවද, එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල එකතුව ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය. ඒ කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම වශයෙන් එසේ දෙන මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතුය.

5. (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම් වලට ඒ උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූද, එහෙත් වියදම් නොකරන ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද මුදල් කිසිවක්, ඒ වැඩ සටහනේම මූලධන වියදමේ මුදල් වෙන් කිරීමකට හෝ ඒ ශීර්ෂයේම වෙනයම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ මුදල් වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම් වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කල හැකිය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ මුදල් වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතුය.

6. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩුවිය හැකි බවට, හෝ

(2) යම් විශේෂ කාර්යයක් හෝ කාර්ය සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට අමාත්‍යවරයා සෑහීමකට පත් වන අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සන් කළ හැකි වෙනත් අරමුදලකින් හා් මුදල් වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදහරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ඉවත් කරගැනීම, අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකිය.

7. අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්,

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයෙහි දැක්වෙන අවම සීමා, නියමයක් මගින්, 1994 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකිය

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස බල නොපැවැත්විය යුතුය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනයට පෙරාතුවම වූ දිනයක සිට බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැලකිය යුතුය.

8. පාර්ලිමේන්තුව විසින්, යෝජනා සම්මතයක් මගින්, මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ

(අ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියළුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්,

(ආ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා මහජන ආරක්ෂක පනත යටතේ පනවන ලද නියෝගය

### නියෝගය

මේ නියෝග බලපවත්නා තාක් කල් (422 වන අධිකාරය වන) මුදල් නීති පනත, එහි 32ඉ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කර ඇත්තාක් සේ බලාත්මක විය යුතුය:-

"32ඊ, (i) ස්වකීය ව්‍යාපාරයේ යම් අංශයක් පවත්වාගෙන යා යුතු ආකාරය හා විධිය පිළිබඳව වාණිජ බැංකු නොවන බැංකු නොවන ආයතනවලට හෝ එවැනි ආයතන යම් කණ්ඩායමකට හෝ සමූහයකට මුදල් මණ්ඩලය විසින් විධාන දිය හැකිය:-

(2) (i) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් එවැනි ආයතනවලට, ආයතන යම් කණ්ඩායමකට හෝ සමූහයකට මුදල් මණ්ඩලය විසින් විධාන දිය හැකිය:-

(අ) ගිණුම් පොත් හෝ අනිකුත් වාර්තා හා ලේඛන පවත්වා ගත යුතු ආකාරය හා විධිය සම්බන්ධයෙන්:

(ආ) එවැනි ආයතන විසින් ආයෝජන කළ හැකි වන්නේ කවර නියමයන් හෝ කොන්දේසි යටතේ ද එම නියමයන් සහ කොන්දේසි සම්බන්ධයෙන්:

(ඇ) එම ආයතනයේ ප්‍රාග්ධනය, එම ආයතනවල තැන්පතු බැරකම්වලට හෝ අවදනම් බර වත්කම්වලට දැරිය යුතු අවම අනුපාතය සම්බන්ධයෙන්:

(ඈ) එවැනි ආයතනවල ද්‍රවශීල වත්කම්, එම ආයතනවල මුළු බැරකම්වලට දැරිය යුතු අවම අනුපාතය සහ එම අනුපාතය ගණන් බැලීමේ දී සැලකිල්ලට ගත යුතු ද්‍රවශීල වත්කම් වර්ග සම්බන්ධයෙන්:

(ඉ) ගෙවා ඇති ප්‍රාග්ධනය, සංචිත සහ වෙනත් අදාළ කරුණු ද සැලකිල්ලට ගෙන එම ආයතන විසින් යම් එක් සමාගමකට රාජ්‍ය සංස්ථාවකට, ව්‍යාපාර ආයතනයකට, තැනැත්තන්ගේ හෝ පුද්ගලයන්ගේ සංගමයකට නැතහොත් ඔහුට සැලකිය යුතු සම්බන්ධතාවයක් තිබෙන පුද්ගලයකුට, ඔහුගේ කිට්ටු ඥතීන්ට හෝ සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට එකතුවක් වශයෙන් සැලසිය හැකි ණය පහසුකම්වල උපරිම මුදල සම්බන්ධයෙන්,

මේ වගන්තියේ කාර්ය සඳහා "ණය පහසුකම්" "කිට්ටු ඥතියා", "ගෙවා ඇති ප්‍රාග්ධනය" සහ "සැලකිය යුතු සම්බන්ධතාවයක්" යනාදී යෙදුම්වල එම යෙදුම්වලට 1988 අංක 30 දරන බැංකු පනතේ දී ඇති අර්ථම තිබිය යුතුය.

32උ. බැංකු සමීක්ෂණ අධ්‍යක්ෂ විසින් ම හෝ යම් බැංකු ආයතනයක කටයුතු පරීක්ෂකවරයකු විසින් පරීක්ෂා කිරීමෙන් පසුව එම අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන වාර්තාවක් මත හෝ ආයතනයෙන් ලැබුනු තොරතුරු මත මුදල් මණ්ඩලය-

(අ) එම බැංකු ආයතනය සිය ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේ දී-

(i) එහි තැන්පත්කරුවන් හෝ ණය හිමියන් කෙරෙහි වූ එහි බැඳීම්වලට හානියක් සිදුවිය හැකි, හෝ

(ii) එම ආයතනයට එහි බැඳීම් ඉටු කළ නොහැකි වන ප්‍රතිඵලයක් ඇතිවිය හැකි

අනාරක්ෂිත හෝ අස්ථිර ක්‍රියාවලියක නිරතව සිටින බවට, හෝ

(ආ) මේ පනතේ විධිවිධාන කඩකර ඇති බවට හෝ ඒ අනුව කටයුතු කිරීම පැහැර හැර ඇති බවට සෑහීමට පත්වන අවස්ථාවක මුදල් මණ්ඩලය විසින්,

(i) එවැනි යම් ක්‍රියා හෝ කඩ කිරීම් නවත්වා ඒවායින් වැළකී සිටින ලෙසට

(ii) මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන ලෙසට හෝ

(iii) එම ක්‍රියාවලියෙහි හෝ කඩකිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන තත්වයන් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට: හෝ

(iv) එම බැංකු ආයතනයේ ව්‍යාපාර කටයුතු නිසි ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය යයි මුදල් මණ්ඩලය විසින් සළකනු ලබන යම් ක්‍රියා මාර්ගයක් නොකඩවාම ගන්නා ලෙසට හෝ යම් දෙයක් හෝ කටයුත්තක් නොකඩවාම කරන ලෙසට ඒ බැංකු ආයතනයට විධාන කෙරෙන නියමයන් නිකුත් කළ හැකිය.

32 ඌ.28, 29, 30, 31, 32, 32අ, 32ආ, 32ඇ, 32ඈ, 32ඉ, 32ඊ හා 32උ වගන්තිවල කාර්ය සඳහා 'බැංකු ආයතනයක්' යන්නට, මුදල් මණ්ඩලයේ මතය අනුව සාමාන්‍යයෙන් වෙළඳ බැංකුවක් විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරික කටයුතු කරගෙන යන යම් ආයතනයක් ඇතුළත් වේ.

# 1992 අංක 1 දරන හදිසි අවස්ථා (මුදල් නීති) නියෝගය

## නියෝගය

1. මේ නියෝග 1992 අංක 1 දරන හදිසි අවස්ථා (මුදල් නීති) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගය බලපවත්වන තාක් කල් ද, එසේ එය බලපවත්වන තාක් කල් පමණක් ද (422 වන අධිකාරය වන) මුදල් නීති පනතේ 93 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ අතුරු විධානයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කළාක් සේ බලාත්මක විය යුතුය:-

> "එසේ ද වුවත්, ජාතික ආර්ථිකයේ යහපත සැළකිල්ලට ගෙන ප්‍රමාණවත් යයි මුදල් මණ්ඩලය විසින් අදහස් කරනු ලබන හේතු මත මුදල් මණ්ඩලය විසින්, නියමිත සංචිත වලින් යම් කොටසක්, මුදල් මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලපරිච්ඡේදයක් තුළ, මහ බැංකුවේ රුපියල් තැන්පතු නොවන වත්කම් ස්වරූපයෙන් පවත්වා ගැනීමට යම් වාණිජ බැංකුවකට අවසර දිය හැකිය."